
# දළදා වරුණ

ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2558 වප් මස 08 වන පුර දින ■ 2014 සැප්තැම්බර් මස 08 වැනි සඳුදා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ




# ලොව විශ්මිතම වස්තුව මිනිස් සිතයි

මිනිස් සිත තරම් විශ්මයජනක වස්තුවක් ලෝකයේ තවත් නැත. මිනිස් සිතේ ඇති අසිරිය හා ශක්තිය ගැන බුදුන් වහන්සේ 'ධම්ම පදයේ' චිත්ත වර්ගයේ මෙසේ දේශනා කොට ඇත්තාහ.

''දූරං ගමං ඒක චරං අසරීරං ගුහාසයං
යෙ චිත්තං සංයමෙස්සන්ති - මොක්ඛන්ති මාර බන්ධනං''

මෙහි අරුත මෙසේය.

''දුර ගමන් යන තනිව හැසිරෙන සිරුරක් නැති සිත නිදන්නේ රූප නමැති ගුහාවෙහිය. එසේ නිදන සිත යම් කෙනෙක් සංවර කර ගනිද්ද ඔහු හෝ ඇය මාර බන්ධනයෙන් මිදෙයි...''

ලොව ඕනෑම අයෙකුට මේ අසිරිමත් මිනිස් සිත වැඩි දියුණු කරගත හැකිය. එහි ඇති ශක්තියෙන් විවිධාකාර බලයන් හා හාස්කම් දක්විය හැකිය.

සැම ආගමික ශාස්තෘවරයෙකුම චිත්ත බලය දියුණු කරගෙන අසීමිත සේවාවක් ලොවට ඉටු කර ඇත. නැණ, ගුණ, බල දියුණු කරගත් විස්මිත සිතකට කළ නොහැකි දෙයක් නැති බව "The Power of your Subeouscious Mind" කෘතිය රචනා කළ ප්‍රකට ග්‍රන්ථ කතුවරයෙක් වූ ආචාර්ය ජෝසප් මර්ෆි සඳහන් කොට ඇත.

ඔහු සිය කෘතියෙහි තවදුරටත් මෙසේ කරුණු ගෙනහැර දක්වයි.

''විද්‍යාත්මක ආයාචනය (Scientific Prayer) යනු විශේෂිත අරමුණක් ඉටුකර ගැනීම සඳහා වූ උඩු සිත හා යටිසිත අතර ඇතිවන ඒකගතාවයක් ඇතිකරන අන්තර් ක්‍රියාකාරකමක් ඇති කරන විද්‍යාත්මක යොමු කිරීමකි. ඔබගේ යටිසිත තුළ ඇති අසීමිත බලයෙහි රාජධානිය කරා ළඟාවන අන්දම ගැන ඔබ ඉගෙන ගත යුතුය...''

මේ අනුව ලෝකය තුළ ඇති අසිරිමත් දේ මිනිස් සිත බව අවිවාදිතය. එය සැබැවින්ම අසිරිමත්ය. එපමණක් නොව එය සැබැවින්ම විශ්මිතය. එබඳු විස්මිත සිතකින් සිදුකළ හැකි හාස්කම් අපමණය. කෙටියෙන් කිවහොත් සොබාදහම විසින් මනුෂ්‍යයා වෙත ලබාදී ඇති අසිරිමත්ම තිළිණය වන්නේ මිනිස් චිත්ත සන්තානය බව කිව යුතුය. මිනිසාට තරම් වැඩි දියුණු කළ සිතක් කිසිදු සත්ව කොට්ඨාසයකට නොමැති බවද මෙහිදී සඳහන් කළ යුතුය.

මෙම අසිරිමත් මිනිස් සිතේ ඇති ශක්තිය, බලය හා හැකියාව අසීමිතය. අප බුදුපියාණන් වහන්සේ හැර මෙතෙක් ලොව පහළ වූ කිසිම ජනනෙතෘවකුට මෙවැනි අසීමිත බලයෙන් හා ශක්තියෙන් ප්‍රයෝජන ලබාගත නොහැකි විය.

විස්මිත මිනිස් සිත පිළිබඳව මනා අවබෝධයකින් යුක්ත වීම ජීවිත ජය වැඩි කර ගෙන යන්නට මහත් සේ උපකාරී වෙයි. එය පුද්ගල සංවර්ධනයට පමණක් නොව සමාජ ප්‍රගමනයටද මෙහෙවීන් ඉවහල් වේ. මිනිස් සිත ක්‍රියාකරන විස්මිත ආකාරය පිළිබඳ නිසි අවබෝධයක් ලබාගත් විට මිථ්‍යා මතවලින් සිත නිදහස් කරගැනීමේ හැකියාව ඉතා පහසුවෙන් ඔබට ලැබෙනු ඇත.

අද අපි වැඩි දෙනෙක් මිථ්‍යාව නමැති ඝන වනාන්තරයේ අතරමං වී සිටින අයුරු දකගත හැකිය. එසේ වන්නේ මිනිස් සිතට ඉබාගාතේ යාමට ඉඩ දීම නිසාය. මිනිස් සිත නිවැරදි මාර්ගයෙන් පිට පැනීමට ඉඩ නොදීම ඔබ සතු වගකීමකි. අද වත්මන් සමාජය විවිධ ආකාරයේ අදෘශ්‍යමාන බලවේගයන්ගේ පිහිට පතා ඇදී යන අයුරු අපට පෙනේ. මෙසේ සිදුවන්නේ ඔබට ශක්තිමත් සිතක් නොමැති බැවිනි. ඔබේ සිතේ ඇති ශක්තිය හා බලය ඔබ හඳුනාගෙන නොමැති බැවිනි.

## සිතේ ක්‍රියාකාරී බලය

විස්මිත මිනිස් සිත පිළිබඳව ''ධම්ම පදයේ'' එන ගැඹුරු විග්‍රහ තුළින් ඔබට බොහෝ කරුණු වටහා ගත හැකිය. 'මිනිස් සිත' ශරීරය නමැති අන්ධකාරය පිරුණු ගුහාවකට උපමා කරන බුදුන් වහන්සේ එය අසින් ස්පර්ශ කළ නොහැකි දෙයක් බවට පෙන්වා දෙති. ඔබගේ සිතට ඇස නොමැතිව දකින්නට හැකියාව ඇත්තා සේම කන නොමැතිව අසන්නට හැකියාව ඇත්තේය. එපමණක් නොව කය නොමැතිව ඔබගේ සිතට ලෝකයේ කවර ස්ථානයකට වුවද මොහොතකින් ගමන් කළ හැකි ශක්තිය තිබේ. එපමණක්ද? නැත. ඔබගේ සිතට අය අයගේ සිත හා සිතුවිලි කියවීමේ අරුම පුදුම ශක්තියක්ද පවතී. මිනිස් චිත්ත සන්තානයේ ඇති අපූර්වත්වය එයයි.


ඔබ කිසියම් නිගමනයකට එළඹෙන්නේ පසිඳුරන් මගින් (ඇස, කණ, නාසය, දිව, ශරීරය) ලබාදෙන තොරතුරුවලට අනුවය. එම තොරතුරු නිවැරදි නම් සිත නිවැරදි ලෙස ක්‍රියාත්මක වෙයි. එසේ නොවුණහොත් සිදුවන්නේ අවැඩකි. එයින් ඔබ විනාශයට පත් වීමටද ඉඩ ඇත්තේය. එමනිසා හැමවිටම මේ අපූර්වත්වයෙන් හෙබි සිත නිවැරදි ආකාරයකට ක්‍රියාත්මක කරවීමේ බලය හා හැකියාව ඔබ විසින් ලබාගත යුතු බව වටහා ගන්න.

යම් කෙනෙකුගේ අධ්‍යාපන මට්ටම, දැනුම හා අත්දැකීම් අනුව ඔහුගේ සිත ක්‍රියාත්මක වන ආකාරය වෙනස් වේ. ජයග්‍රහණයේ හා සාර්ථකත්වයේ රහස සොයා යන ඕනෑම අයෙකුට සිත හරියාකාරව ක්‍රියා කරන ආකාරය ගැන පිළිබඳව නිසි අවබෝධයක් තිබීම අනිවාර්ය වේ.

ප්‍රධාන කොට සිත ක්‍රියාකාරී වන්නේ මොළය ආශ්‍රය කරගෙනය. මොළය හා සිත අතර ඇත්තේ ගහට පොත්ත බඳු අන්තර් සම්බන්ධතාවයකි. සිත මගින් නිකුත් කරන චින්තන තරංගවලට විශ්මිත ශක්තියක් තිබේ. එය ඕනෑම බලවේගයකට බලපෑම් කළ හැකිය. මෙහිදී වටහා ගත යුතු අනෙක් වැදගත්ම කාරණය වන්නේ බුද්ධිමත්ව සිත මෙහෙය වන්නේද යන්නය.

නිව්ටන් ගුණසේකර

''මේ ලෝකයේ කවරදාවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්.''




ජීවිතේ කෙනෙක් සෝවාන් ඵලයට පත්වුණා කියන්නේ එයා පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යතාව දැකලා. ඒ කියන්නේ එයා උපරිම ආත්මභාව 7 ක් ඇතුළත මේ භව ගමන නිරෝධය කරගන්නවා. ඒ නිසා කවදාවත් මේ ජීවිතේ මාර්ගඵල ලබපු කෙනෙක් මෛත්‍රී බුදුන්ගේ ශාසනය දක්වා ඉන්නේ නැහැ.

සඳුන් ආත්මයක් ආත්මයක් පාසා ඒ උතුම් වූ නිවන ප්‍රාර්ථනා කළොත් මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නට පුළුවන්.

● මේ ජීවිතයේ ඉඳගෙනම මාර්ග ඵලවලට යන්න කෙනෙක් කල්පනා කරනවා නම් ඒ පරිසරයෙන් වෙන බාධාවන් වළක්වා ගන්නේ කොහොමද?

උතුම ගෞතම බුදුන් ... කියන මහෝත්මයට බුදුන් දවස පිරිවර 5 ක් සිටියා. ඒ කියන්නේ ... 5 ක් ගෙදර හිටියා. නමුත් ඔහු අනාගාමී [illegible]



# ඔබ පතන්නේ මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නද?

පූජ්‍ය රාජගිරියේ අරියඥාන හිමියන්ගෙන් අහමු

[illegible] විදර්ශනාවෙන් [illegible] මාර්ගය තුළ ඉන්න. ආර්යඅෂ්ටාංගික මාර්ගය කියන්නේ මොකක්ද? ප්‍රඥාව, සීලය, පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය. බුදුරජාණන් වහන්සේ [illegible] මාර්ගය තුළ ඉන්න.

● ස්වාමීන් වහන්ස, අපි අසා තියෙනවා ගෞතම බුද්ධ ශාසනයේ සෝවාන් වූවා යැයි කියන සමහර පුද්ගලයන් කියනවා ඔවුන් මතු බුදුවන මෛත්‍රී බුද්ධ ශාසනයේ ශ්‍රාවක තනතුරු ප්‍රාර්ථනා කරන්නන් බව. ස්වාමීනි, එසේ ගෞතම බුද්ධ ශාසනයේ මාර්ගඵල ලාභියෙකුට අනාගත මෛත්‍රී බුද්ධ ශාසනයේ අග්‍ර ශ්‍රාවකයෙක්, අග්‍ර මහා ශ්‍රාවකයෙක් වගේ තනතුරක් කරා යා හැකිද?

නෑ, ඒක කවදාවත් වෙන දෙයක් නෙවෙයි. මාර්ග ඵල ලාභියෙක් කවදාවත් ආයෙත් මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයට යන්නේ නැහැ. මොකද මතු බුදුවන මෛත්‍රී බුදුරජාණන් වහන්සේ කියන්නේ තවම පෘතග්ජන කෙනෙක්. මෛත්‍රී බෝධිසත්වයෝ මේ වෙලාවේ තුසිත හෝ දිව්‍ය තලයක එතුමන්ගේ පිරිසත් එක්ක එකට වෙලා ඉන්නවා. එතැන ඉන්න කවුරුත් මාර්ග ඵලවලට පත්වෙලා නැහැ. ඒ අය තාම ධර්මයක් දැකලා නැහැ. ඒ හින්දාම තාම පෘතග්ජනයි. එතකොට යම්

● රහතන් වහන්සේලා මේ අවස්ථාවේ මේ ලෝකේ ඉන්නවාද? ඉන්නවා නම් ප්‍රාතිහාර්යය පාන්නේ නැත්තේ ඇයි?

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා යමෙක් හේතූන් හතරක් නිසා මාර්ගඵල ප්‍රකාශ කරනවා. පළමුවැනි කාරණේ තමයි අධිමාන්නය. දෙවැනි කාරණය තමයි මෝහය. තුන්වැනි කාරණය තමයි මානසික රෝගී භාවය. හතරවැනි කාරණය තමයි අවබෝධයෙන්ම ප්‍රකාශ කිරීම. ඒ නිසා යමෙක් මාර්ගඵලයක් ප්‍රකාශ කරනවා නම් මේ කාරණා හතරටම දාලා අපි බලන්න ඕන. මොකද මේ කාරණා තුනක් නිසා මාර්ගඵල ප්‍රකාශ කරන අය ඉන්නවා. නමුත් කවදාවත් ධර්මාවබෝධයක් කරා යන කෙනෙක් මුල් තැන කියන්නේ සෝවාන් ඵලයට පත්වුණා කියන එකනේ. සෝවාන් ඵලයට පත්වුණා කියන්නේ එයා පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දක්කා. පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දක්කා කියන්නේ මොකක්ද? එයා රූපයේ විඳීමේ අනිත්‍ය භාවය දක්කා කියන එක. එතකොට රහතන් වහන්සේ කෙනෙක් කියන්නේ රූපයේ විඳීමේ අනිත්‍ය භාවය අවබෝධ කළ කෙනෙක්.



# අටපිරිකර පූජාවේ ආනිසංස


"පත්තෝ තිචීවරං
කාය බන්ධනං වාසිසූචිච
පරිස්සාවනම්වචෙතෙ
පරික්ඛාරට්ඨ භාසිතා"
යනුවෙන් දක්වන පරිදි,

1. දෙපට සිවුර
2. උත්තරාසංගය හෙවත් තනිපට සිවුර
3. අන්තර වාසකය හෙවත් අඳනය
4. පාත්‍රය
5. කාබන්ධන හෙවත් පටිය
6. වාසිය හෙවත් දැලිපිහිය
7. ඉඳිකටුව සහ නූල්
8. පෙරහන්කඩය යන අංග අටපිරිකරට අයත් වේ.


"පරික්ඛාර" යන පාලි ශබ්දය "පිරිකර අංගෝපාංග" යන අර්ථ සිංහලයට ගෙන ඇති අතර භික්ෂු පිරිකර, තවුස් පිරිකර, යාග පිරිකර ආදී වශයෙන් මෙය විවිධ වේ. තවුස් පිරිකර වශයෙන් වාක චීවර (තවුසන් අඳින ගසෙකි පට්ටවලින් සෑදූ වස්ත්‍ර), පැන් කෙණ්ඩිය, පාත්‍රය, පත්කඩය, වහන්සගල ආදිය දක්වේ. යාග පිරිකර වශයෙන් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, අමාත්‍ය, ගෘහපති යන සතර දෙනාගේ අනුමැතිය ලබාගැනීම, යාග කරන්නා හත්වන මීමුත්තන් තෙක් පරපුරෙන් පිරිසිදු වීම, උතුම් රූපශෝභා ඇත්තකු වීම, ධන සම්පත්තියෙන් යුක්ත වීම, වේදය හා විවිධ කලාවන්හි නිපුණත්වය ලබා තිබීම යනාදී වශයෙන් යාග පිරිකර 16ක් පිළිබඳ සඳහන් වේ. මෙයින් පැහැදිලි වන්නේ පිරිකර යෙදුම යෙදී ඇත්තේ යම් දෙයක් සඳහා අවශ්‍ය කරන මූලික අංගෝපාංග යන අරුත දක්වීමට බවය. තවුසකු වීමට අවශ්‍ය අංගෝපාංග හැතහොත් අවශ්‍ය දෑ, යාග පිරිකර වශයෙන්ද දක්විය හැකිය. මේ ලෙස බලන කල භික්ෂුවක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන මූලික අංගෝපාංග භික්ෂු පිරිකර වශයෙන්ද දක්විය හැකි අතර එහිලා මතු දක්වන ලද අටපිරිකර භික්ෂුවක් සඳහා සම්මතව ඇත. මීට අමතරව පසුකාලීනව මෙය දෙලොප් පිරිකර දක්වා වර්ධනය වූ අයුරු ථෙරවාද මූලාශ්‍රයන්ගෙන් පැහැදිලි වන අතර අටපිරිකරට අමතරව ඇඳ ඇතිරිල්ලක් හෝ පැන් කෙණ්ඩියක්, සම්කඩක් (පත්කඩය) සැරයටියක් සහ කුඩයක් හෝ පාවහන් යුගලයක් යන අංග සතරද එකතු වී ඇත.

භික්ෂුවක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන මූලිකතම අංගෝපාංග සමූහයක් ලෙස අටපිරිකර මේ අනුව හැඳින්විය හැකිය. ගිහි පුද්ගලයෙකු පැවිදිභාවට පත්කිරීමේදී කෙස් රැවුල් කැපීමට දැලිපිහිය භාවිත කරන අතර ශ්‍රමණ වෙස් ගන්වන්නේ සිවූ සිවුර පෙරවා දෙපට සිවුර (පොට්වල් දෙකක් ඇති සිවුර) සඟළ වශයෙන් උර මත්තෙහි තබා ගැනීම සිරිත වේ. මෙයින් භික්ෂුවක් නිර්මාණය වන අතර ඉක්බිතිව පාත්‍රයද රැගෙන පිණ්ඩපාතයෙහි හැසිරෙන විට මේ භික්ෂුවකැයි යන ආකල්පයෙන් දන් පිළිගැන්වීමට, වන්දනාමාන කිරීමට ජනයා පෙළඹේ. මෙයින් පැහැදිලි වන්නේ මුලදී ගිහිව සිටි පුද්ගලයාගේ බාහිර ස්වරූපය වෙනස් කර ඔහු භික්ෂුවක් තත්ත්වයට පත්කිරීමට අවැසි මූලිකාංග අටපිරිකරෙහි අන්තර්ගත වන බවයි.

මිනිසෙකුට ජීවත් වීමට අවශ්‍ය ඇඳුම්, ආහාර, නිවාස, බෙහෙත් යන මූලික අවශ්‍යතාවන් භික්ෂුවක් විෂයෙහි අටපිරිකර තුළින් සම්පූර්ණ වෙන බවද සිතිය හැක. චීවර, පිණ්ඩපාත,



"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."





සේනාසන, ගිලාන ප්‍රත්‍යය වශයෙන් දක්වන ලද සිව්පස මෙමගින් සම්පූර්ණ වේ. අව්වැසි, මැසිමදුරු ආදීන්ගෙන් සිදුවන උවදුරු සහ ශීත, උෂ්ණ ආදී සතු පීඩා නැති කරගැනීමටත්, චීවර භාවිත කරන අතර අඳනය තනිපට සිවුර තුළින් එම අවශ්‍යතාවය සම්පූර්ණ වේ. තුන් සිවුරෙන් යුක්ත වූ භික්ෂුවකට එබඳු අයවලුන් භික්ෂූන් යැයි දන්නා ප්‍රදේශයක පාත්‍රයද රැගෙන තුම්න ස්ථානයකට ගියද පිණ්ඩාහාරය ලැබිය හැකිය.

එමගින් ආහාර අවශ්‍යතාවය සපුරා ගත හැකිය. භික්ෂුවකට අවශ්‍ය සේනාසන අවශ්‍යතාවද අටපිරිකරට අන්තර්ගත දෙපට සිවුර භාවිත කිරීමෙන් සම්පූර්ණ වේ. දෙපට සිවුර එළාගෙන සයනයක් සේ නිදාගැනීමටද එය නවා හිඳ ගන්නා අසුනක් සේ භාවිත කිරීමට පුළුවනි. ස්ථිර නිවාස නැති අල්පේච්ඡ ජීවිත ගෙවන භික්ෂුවකට මෙය සේනාසනයට තරම් සෑහේ. කෙස් රැවුල් කපා ශාරීරික පවිත්‍රතාවය ඇති කර ගැනීමට දැලිපිහිය භාවිත කරන අතර ජලය පෙරා පානය කිරීමට පෙරහන්කඩය භාවිත කරයි. ඉරුණු චීවර මසා සකසා ගැනීමට ඉඳිකටු නූල් උපයෝගි වන අතර මෙබඳු දේ භික්ෂුවකගේ ශාරීරික සෞඛ්‍යය සඳහා උපයෝගී වේ. මේ අනුව ඇඳුම්, ආහාර, නිවාස සහ බෙහෙත් යන මූලික මානව අවශ්‍යතාවයන්ද අටපිරිකර මගින් සම්පූර්ණ වන බව දක්විය හැකිය.

බෞද්ධ සමාජයේ පවත්නා පූජාවිධීන් අතර වඩා ප්‍රචලිත පූජා වස්තුවක් ලෙස අටපිරිකර හඳුනා ගත හැකිය. බුදු සමයේ එන මහා පින්කම් අතරින් දෙවැනි තැන හිමිවන්නේද අටපිරිකර පූජාවටය. සැදැහැ සිතින් සඟනට අටපිරිකර දන් දෙන්නහුට ව්‍යාඝ්‍ර, මෘග, සර්පාදීන්ගෙන්ද, විෂ කණු, කටු ආදියෙන්ද, අමනුෂ්‍යාදීන්ගෙන්ද උවදුරු ඇති නොවේ. කුෂ්ඨාදී පාපී රෝග නොවැළඳේ. පණ්ඩක, නපුංසක ආදී භවයන්ට නොපැමිණේ. මනා රූසපුවෙන් යුක්තව උපනුපන් භවයන්හි සියලු උපභෝග පරිභෝග සම්පත් ලබයි. තවද එහි මුඛ්‍ය ඵල වශයෙන් පශ්චිම භවයක බුදු කෙනෙකුන් හමුවට පැමිණියේ පුරුෂයකු නම් ඒහිභික්ෂු භාවයෙන් පැවිදි උප සම්පදාව ලබයි. ස්ත්‍රියක් වුවහොත් මහලියපලඳනාවෙන් සත්කාර ලබන අතර එබඳු වස්තුන් මිල කර විහාරාරාම ගොඩනගා නිවන් පසක් කරගනියි.

අටපිරිකර යනු පෙර දක්වන ලද පිරිකර අටකින් යුක්ත වූවකි. එහෙයින් මෙම මහාර්ඝ පූජාව සිදුකරන සැදැහැවතුන් අටපිරිකරේ බාහිර ස්වරූපය පමණක් නොබලා අන්තර්ගතය පිළිබඳව සැලකිලිමත් වීම ඉතා ප්‍රයෝජනවත් වේ.

**පූජ්‍ය උාරියාවේ ආනන්ද හිමි**

"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



# ඔබ සිල් ගන්නේ කාටවත් පේන්නද?

ලක්වැසි ජනයන්ට පොහොය දින උපෝසථ සීල සමාදන්වීම හා ආගමික ජීවිතය හුරු වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් 236 වැන්නේ මිහිඳු මහරහතන් වහන්සේ විසින් බුද්ධදහම මෙහි වැඩමවීමෙන් අනතුරුවය. එතැන් පටන් ලක්දිව උපාසක උපාසිකාවෝ පෝය දිනයන්හි මෙලොව පරලොව සැප පිණිස විවිධ ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්හි යෙදුණහ. කාය වාග් සංයමය හා චිත්ත පාරිශුද්ධිය උදෙසා අටසිල්, දසසිල් සමාදන් වූහ.

මෙසේ පොහොය දිනය සියලු කර්මාන්තයන්ගෙන් මිදී, කෙලෙස් මලින් බැහැරව, දාන සීල භාවනාදී පුණ්‍ය ක්‍රියාවන්හි යෙදුණු ලක්වැසි බෞද්ධයනට එදින නිවාඩු දිනයක්ද විය. නිති පන්සිල් හා පොහොය අටසිල් සමාදන්ව ධර්මානුකූලව ජීවත්ව සාරධර්ම පිරි ආදර්ශමත් ජීවිත ගත කිරීමට ලක්දිව බෞද්ධ උපාසක උපාසිකාවන්ට එමගින් අවස්ථාව සැලසිණ. ඔවුහු බොහෝ විට පුර පසළොස්වක පොහොය දිනය පමණක් නොව පුර අටවක, අව අටවක, අමාවක යන පොහොය දිනයන්හිද අටසිල් රැකීම, වෙහෙර විහාර කරා ගොස් මල් පහන් පූජා කිරීම හා බණ දහම් ඇසීම වැනි පුණ්‍ය ක්‍රියාවන්හි යෙදී සිටියාහුය.

යටත්විජිත භාර මහලේකම් ජී. ටී. ඇම්. ඕ. බූසන් මහතා ක්‍රි.ව. 1885 මාර්තු මස 22 වන දින නිකුත් කළ ගැසට් නිවේදනය අනුව වෙසක්පුර පොහොය දිනය බෞද්ධයන්ට නිවාඩු දිනයක් බවට පත්විය. අපේ ජාතික නායකයන් කීපදෙනකුගේ උත්සාහයක ප්‍රතිඵලයක් වශයෙන් ඩඩ්ලි සේනානායක අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය විසින් 1965 දෙසැම්බර් 22 වන දින සිට සතර පෝය හා ඊට පෙර දින වරුවක් නිවාඩු බවට පත් කරන ලදී. මෙම පෝය දින නිවාඩුව දැනට පුර පසළොස්වක පෝය දිනට පමණක් සීමාවී ඇත.

### පෙහෙවස් සමාදන් වීමට පෙර සූදානම

පොහොයක් පොහොයක් පාසා පෙහෙවස් සමාදන් වන උපාසක උපාසිකාවන් මහත් ශ්‍රද්ධායෙන් පොහෝ දිනට පෙර දින ඉස් සෝද නා පිරිසිදු විය යුතුය. පෙහෙවස් සමාදන්ව සිට ගෙදර දොර කළමනා ගැන සිතීම හා විචාරීම නුසුදුසු බැවින් පසු දින ගෙදර දොරේ කටයුතු කළමනා ඒ ඒ අයට පවරා සියලු කටයුතුවලින් හිත නිදහස් කරගැනීම අගනේය. පසුදින අලුයම පෙහෙවස් සමාදන් වීමට අපේක්ෂිත විහාරස්ථානය කරා ගොස් භික්ෂූන් වහන්සේ නමක ලවා පළමුව සරණ සීලයෙහි පිහිටුවා අෂ්ටාංග සීලයෙහි පිහිටීම සුදුසු වේ. භික්ෂූන් වහන්සේ නමක් නොසිටින්නේ නම් අන් කිසිකෙනෙකු ලවා හෝ තමා විසින්ම හෝ සිල් පද සමාදන් විය හැකිය.

### සීලයෙහි පිහිටිය යුතු ආකාරය

උපාසක උපාසිකාවන් විසින් පළමු කොට තමන් විසින් පිහිටන සරණ සීලය නොබිඳිය යුතුය. යම් හෙයකින් සමාදන් වූ සරණ සීලය බිඳුණේ නම් යළි එහි පිහිටිය යුතුය. අනතුරුව අෂ්ටාංග සීලය සමාදන් විය යුතුය.

"මණ්ඩන විභූසන ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි"

අටසිල් සමාදන් වූවෝ රහතුන් වහන්සේ උපමා කොට මෙම සිල්පද යළි යළිත් මෙනෙහි කළ යුත්තාහ. සැදැහැ සිතින් බණ භාවනා සිදු කළ යුත්තෝය.

අෂ්ටාංග සීලය සමාදන් වීමේදී පංචසීලයට අයත් තුන්වෙනි ශික්ෂා පදය වූ කාමේසුමිච්ඡාචාරා යන සික පදය වෙනුවට අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං යන සික පදය සමග එහි අනෙක් සික පදද එකතුව විකාලභෝජනා වේරමණී සික්ඛාපදං, නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසන ඨානා වේරමණී සික්ඛාපදං හා උච්චා සයන මහා සයනා වේරමණී සික්ඛාපදං යන සික පද තුනක් එක් කොට අෂ්ටාංග සීලය සමාදන් විය යුතු වේ.

දස සීලයේදී අමුතුවෙන් එක්වන්නේ ජාත රූප රජත පටිග්ගහනා වේරමණී සික්ඛාපදං යන්න පමණි. (රන්, රිදී, මුතු, මැණික් අගනා වස්තු පරිහරණයෙන් වැළකීම) මෙහිදී අටසිල් ගන්නා සිල්පදයෙහි මාලාගන්ධ විලේපන මණ්ඩන විභූසන ඨානා වේරමණී සික්ඛාපදය වෙන්ව යෙදී ඇත.

උපෝසථ සූත්‍රයට අනුව යටකී අබ්‍රහ්ම විහරණය ශ්‍රේෂ්ඨ චර්යාවකි. විකාල භෝජනය නම් භෝජන අර්ථයෙන් සැලකෙන කැඳ බත් ආදී පෙරවරුවෙහි වැළඳිය යුතු ආහාර විකාලයේ වැළඳීමයි. (හිරු අවරට යෑමෙන් පසුව කැඳ බත් ආදිය වැළඳීමයි.) නච්ච ගීත වාදිත විසූක දස්සන යනු තමා නැටීම හා අනුන් ලවා නැටවීම, තමා ගායනා කිරීම අනුන් ලවා ගායනා කරවීමද, වාදිත නම් බෙර ආදිය තමා ගැසීම හා අනුන් ලවා ගැස්සවීමද වේ. මේවා බුද්ධ දේශනාවට පටහැනි බැවින් වැළකිය යුතුවේ. ගඳ සුවඳ විලේපන ඇඟ තැවරීමද නොකොට යුත්තේය. මාලා ගන්ධ විලේපනද පෙහෙවස් සමාදන් වූවන්ට සුදුසු නොවන්නේය. වඩු රියනක ප්‍රමාණයට වඩා උච්චාසයන මහාසයන නොසෙවිය යුතුය. කලාල පැදුරු ආදිය භාවිතය වඩා ගැළපේ.

සිල් පද සමාදන් වූ තැන් පටන් අන් කෙනකුට හිංසා, පීඩා, ක්‍රෝධ කිරීම් ආදියෙන් තොරව, රාජකාරී විධානයන්ගෙන් බැහැරව, වියහියදම් ගණන් නොබැලීමෙන්, අනුන්ගේ වග එල තැන නොසොයා හිස් වචන කතාවෙන් බැහැරව සිල් රැකිය යුතුය. එවිට සිල් කිළිටු නොවන්නේය. යුක්ත වීමෙන් සිල් බිඳෙන්නේය.

භික්ෂූන් වහන්සේ නමක් සත්පුන්ව දත් වළඳන ආකාරයට සිල්ගත් උවැසි උවැසියන්ද හීල් දානය හා දවල් දානය වැළඳීම කළ යුතුවේ. බණ ඇසීම, බුදුගුණ සිහිකිරීම, තමන්ගේ සීලය ගැන සිත සිතා සිල් රැකීම වඩාත් වටනේය. එසේම කිසිවකුට පෙනීමට පමණක් සිල් ගැනීම නොකළ යුත්තේය. නිතර සිත පිරිසිදුව තබා ගත යුත්තේය. අෂ්ටාංග සීලය රැකීමෙන් ඇතිවන ලාභ සත්කාරයෙන් හෝ කීර්ති ප්‍රශංසා ආදිය ගැන සිහිපත් නොකොට සිල් පද රැකිය යුත්තේය.


සිල් කිලිටි වූ විට "ඉතිපිසෝ භගවා අරහං", "ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ", "සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ" යනුවෙන් බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ සිහි කොට නැවත පිහිටිය යුත්තේය.

තෙරුවන් සරණ ගොස් සරණ සීලයෙහි පිහිටන උපාසක උපාසිකාවන් නිත්‍ය සීලය නම් වූ පංචසීලයෙහි හා උපෝසථ දිනයන්හි අෂ්ටාංග සීලයද, ඊට අමතරව හැකිනම් දස සීලයෙහිද නොසිඳ නොබිඳ පිහිටීමෙන් හා දැහැමෙන් සෙමෙන් ජීවත් වීමෙන් උපාසක පද්ම භාවයට පත්විය හැකිය. එසේ සීලයෙහි පිහිටා දස කුසලයන් වඩා දස අකුසලයෙන් මිදී කටයුතු කරත් නම් ලොව්තුරා සම්පත්තිය ලද හැකි බව සම්බුද්ධ දේශනාවයි.

අෂ්ටාංග සීලය නිසි සේ රක්ෂා කළවුන් අනන්තවත් දිව්‍ය ලෝකවල උපන් බව බුදුන් වහන්සේ වදළ සේක. මෙසේ මහත් කුසල විපාක ගෙන දෙන අෂ්ටාංග සීල සමාදානය හා එය නොසිඳ නොබිඳ ආරක්ෂා කිරීමෙන් නිදුකින් ජීවිතය ගත කළ හැකිය.

**කේ. මිගහකුඹුර**

# මව්පියන්ගේ දෙපා නමදින නිවැරදි ක්‍රමය



"යෝ මාතරං වා පිතරං වා
භාතරං භගිනිං සසුං
හන්ති රෝසෙති වාචාය
තං ජඤ්ඤා වසලෝ ඉති"

වසල සූත්‍රයේ දහවෙනි ගාථාවෙන් පෙන්වා දෙන්නේ "තම මවට පියාට සහෝදර සහෝදරියන්ට හිංසාවෙන් ක්‍රෝධයෙන් පරුෂ වචනයෙන් නින්දා කරයිද හෙතෙම වසලයෙකි." යනුවෙනි.

"බ්‍රහ්මාති මාතා පිතරෝ" යන බුදු වදනින්ද තම මව්පිය දෙදෙනා බ්‍රහ්මයා මෙන් උත්තම ඔවුන් ගරු කළ යුතු බවත් දක්වයි. සිගාලෝවාද සූත්‍රයෙන් වන්දනා කළ යුතු පදිසාවෙන් මුලින්ම නමස්කාර කළ යුතු "පෙරදිග" ලෙස මැණියන් සහ පියාණන් හඳුන්වා දී ඇත.

"උත්තමංගෙන වන්දේහං - පාද පංසු වරුත්තමං"

උතුම් අංගයෙන් සිය නමස්කාර කළ යුතු උතුම්ම පා සඟල පිය පුත්තන් ද දෙමාපියන්ගේ පාද බව පෙන්වා දී ඇත. උතුම් අංගයෙන් වැඳ නමස්කාර කළ යුතු මැණියන් පියාණන්ගෙන් පියාණන් වහන්සේගේ දරුවෙකු ලබන ආශිර්වාදය තිසිම දෙවියකුගෙන් බ්‍රහ්මයෙකුගෙන් ලැබිය හැකි නොවේ.

අද බොහෝ දූ දරුවන් කරන්නේ වාලේ කරන දෙමාපිය වන්දනාවට වඩා නියම පරිදි උත්තම අංගයෙන් කළ යුතු පාද නමස්කාරය ඉතා උතුම් බව පෙනිදී සිහිපත් කළ යුතුය. මාතු පිතෘ පාද නමස්කාරය මෙසේ විය යුතු යැයි පෙන්වා දීමද මහා කුසලයකි.


තම අංගයේ මහ පොළොවට ස්පර්ශ වන ලෙස නළල, දණ, දෙවැලමිට, දෙඅත්ල, දෙපාවල මාපට ඇඟිල්ල, දෑත්වල ඇඟිලි මවගේ පියාගේ පාවල ඇඟිලි තුඩු ස්පර්ශ විය යුතුය. එලෙස මාරන ස්පන්දනයෙන් රත්වන එකම ලේවල රැඳිය දෙමාපිය පා ඇඟිලි තුඩින් සිරුර පුරා විහිදී ගොස් හදවතේ ඇතිවන සොම්නසේ ආකම්පණිය උණුසුම් කංකයකින් දරුවන්ගේ ඇඟිලි තුඩු හරහා ඒත් පුරා සිරුර පුරා විකාශනය වන්නේය. එලෙස ලබන්නා වූ ආශිර්වාදාත්මක ශක්තිය, ශෛර්ය, වීමට සමත් වෙනත් කිසියම් මේ ධරණී තලය මුළු ඉසිදී නැත. උපදින්නේද නැත. එසේම මව්පියන්ගෙන් දරුවන් ලැබිය යුතු උතුම්ම දායාදය වස්තුව වන්නේ ආශිර්වාදය මිස මිල මුදල් හෝ දේපළ වස්තුව නොවේ.

"යෝ මාතරං වා පිතරං වා, ජිණ්ණකං ගත යොබ්බනං
පහුසන්තෝ න භරති - තං පරාභවතෝ මුඛං"

පරාභව සූත්‍රයේ හතරවෙනි පිරිහීමේ කාරණය ලෙසද පෙන්වා දී ඇත්තේ දරුවන් තමන්ට හැකි පමණින් දස මසක් කුස දරා වේදනා විඳිමින් හද කිරිවලින් පෝෂණය කළ මැණියන් වහන්සේට, දුවිය මුගුරු පොලමින් තම කුසට අහාරය පවා නොතකන දරුවන් ගැන වෙහෙසෙන පියාණන් වහන්සේට සැලකුම සත්කාර නොකරන්නේද ඔහුගේ පිරිහීමට එය හේතුවක් වන බවයි.

**නිලංකා තාමලී පෙරේරා - අස්ගිරිය, මහනුවර**

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."



රජ්ජුමාලා බුදුන් දවස විසූ කාන්තාවකි. ඇය දසියකි. ජීවිතය ගැන කලකිරීමෙන් ගෙල වැලලා මියයෑමට රජ්ජුමාලා කළ සැලසුම් දිවැසින් දුටු බුදු හිමියෝ ඇය මරණයෙන් පමණක් නොව සසරින්ද මුදා ගත්හ.

වක්කලී පොඩි හාමුදුරුවෝ පැවිදි බව ලැබුවේ බුදු සිරුරේ රූප බැලීමටය. උන්වහන්සේගේ දෛනික සිරිත වූයේ බුදුන් වහන්සේ දෙස බලමින් කාලය ගත කිරීමය. එම පිළිවෙත අත්හරින ලෙස බුදුන් වහන්සේ වක්කලී හිමියන්ට ප්‍රකාශ කළ විට සිය දිවි නසා ගැනීමට තීරණය කළ බව බෞද්ධ සාහිත්‍යයේ දක්වෙයි. ගිජුකුළු පව්වෙන් පැන මියයාමට සිතා එම පර්වතයට නගින අයුරු දුටු බුදුරජාණන් වහන්සේ වක්කලී හිමියන්ට දහම් දෙසා සසර දුකින් මුදාලූහ.

සසර පිළිබඳව කලකිරීම සම්‍යක්දෘෂ්ටික සිතක ස්වභාවයයි. එහෙත් ජීවිතය පිළිබඳ කලකිරීම මිථ්‍යාදෘෂ්ටික කල්පනාවකි. සසර ගමනෙහි ස්වභාවය දුක පදනම් කර ගොඩනැගුණු භවයට සත්ව සන්තානය ඇද බැඳ ගැනීමයි. දුක යනු මේ ගමනේ යථාර්ථයයි. මෙසේ ස්වභාවය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණ ත්‍රයකින් දේශනා කොට තිබේ. මේ යථා ස්වභාවය වටහා ගත් බුද්ධිමත් සිත සසර පිළිබඳව කලකිරුණ

# දිවි නසා ගැනීමත් ලොකු පවක්

ජීවිතය ගැන කලකිරීමක් නැත. ත්‍රිලක්ෂණය වටහා ගෙන සසර දුකින් නිදහස් වීමට මේ ලබාගත් මිනිස්කම ආරක්ෂා කරගත යුතුය. ලෝකය දකිය හැකි ආලෝකය ප්‍රඥාවයි. ප්‍රඥාව වර්ධනය කරගත් සිතකට සසර ගමනේ නිසරු බව දැනේ. එවිට ඔහු උත්සාහ කරන්නේ ජීවිතය විනාශ කරගැනීමට නොව දුකට හේතුව වූ තණ්හාව විනාශ කරගැනීමටය. සංසාර සත්වයා තණ්හා දහැනින් වෙළී සිටින බැවින් ලබාගත් ජීවිතය පුරාම උත්සාහ දරන්නේ පසිඳුරන් පිනවමින් ප්‍රාර්ථනා ඉටු කරගැනීමටය. ප්‍රාර්ථනා බිඳ වැටෙන කල්හි ජීවිතය එපාවීමේ ස්වභාවය දුර්වල වූ මිනිසුන් සතුව පවතී.

මිනිස් ලොව උපත ලබා මිනිස්කම රකිනු විනා අභියෝගවලට බියෙන් ඕනෑයෙන් පලායාමට තීරණය කරන්නේ තමන් ලැබූ පරාජය වසන් කිරීමටය. එහෙත් සිදුවන්නේ පරාජය තහවුරු වීමය. සියදිවි හානි කරගැනීම බුදු දහමට අනුව බරපතල වූ පාප කර්මයකි. සියදිවි යනුවෙන් ව්‍යවහාර දක්වුවද ජීවිත විෂයෙහි එහි උරුමකරුවකු බුදු දහමට අනුව සොයාගත නොහැක. හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා මෙම පංචස්කන්ධය මගේ යැයි බැඳ තබන්නේ උපාදානයයි. උපාදානය හට ගන්නේ තණ්හාව නිසාය. තණ්හාවෙන් බැහැර වී ජීවිතය ගැන සිතන කවරෙකුට වුවද ඒ ගැන තමන්ගේකමක් නොදැනේ. සත්‍යයද එයයි. සසර ගමනේදී නවාතැනක් ලෙස හමුවන මේ රූපස්කන්ධය තුළ වේදනා, සංඥා, සංඛාර උපදවා ගනිමින් පවතිනවා මිස රැගෙන යාමට හෝ සදාකාලික ලැගුම් ගැනීමට ඒ තුළ ඉඩක් නැත. එසේ උරුමයක් නැතැයි සිතා එය විනාශ කිරීමේ අයිතියක්ද අපට නොමැත. ප්‍රඥා ශක්තියකින් ප්‍රතිසන්ධි සිත යහපත් වී මිනිස් ජීවිතයක් ලැබී ඇත. එයින් ඵල ලබාගැනීමට උත්සාහ කරනු විනා තණ්හාවේ මෙහෙයවීමෙන් ජීවිතයට ද්‍රෝහී කිරීම නිවැරදි ක්‍රියාවක් නොවේ.

ප්‍රායෝගික ජීවිතයේදී හමුවන සියලු අත්දැකීම් සිහින ලෝකයේදී ගොඩනගා ගන්නා ප්‍රාර්ථනාවන් සමග බද්ධ කළ නොහැක. ලෞකික හදවත්වල උපදින හැඟීම්බර ප්‍රාර්ථනාවන් හා සැලසුම් ප්‍රායෝගික ජීවිතයට වලංගු වන්නේ සුළු වශයෙනි. ඒවා බොහෝමයක් බිඳ වැටෙන තත්ත්වයේ පවතී. අපේක්ෂා භංගත්වය යනු ඒ අවස්ථාවයි. අපේක්ෂාවන් බිඳී ගිය විට හැඟීම්බර, පාලනය කර නොගත් සිත ජීවිතය කෙරෙහි ද්‍රෝහී සහගතවීම බුද්ධිමත් පියවරක් නොවේ.

අපේ රටේ පවතින නීති පද්ධතිය තුළද සියදිවි හානිකර ගැනීමට තැත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. දුරදක්නා නුවණින් තොර වූ ස්වාභාවික ප්‍රඥාවෙන් හීන වූ, ආත්මාර්ථකාමීත්වයෙන් දුබල වූ, මෝහයෙන් අන්ධ වූ බොහෝ මිනිසුන් තම අභිමතාර්ථයන් බිඳුණ කල්හි මරණයේ පිහිට පැතීම නිතර දක්නට ලැබෙන තත්ත්වයකි. වස පානය කිරීම වැනි උපක්‍රම භාවිත කිරීමේදී රෝහල් ගතවන බොහෝ රෝගීන් උදෙසා ලබාදෙන ප්‍රතිකාර පද්ධතිය දෙස බලන විට දුර්දිග නොබලා ඔහු කළ වරදට වැයවෙන ජාතික ධනය ඉතා විශාල බව පෙනේ.

ජීවිතයෙන් පලායාමට උත්සාහ කරන පුද්ගලයාගේ ජීවිතය රැක ගැනීමට දරන උත්සාහය දෙස බලන විට පෙනී යන්නේද ඛේදජනක ස්වභාවයකි.

ඔහු මුහුණ දුන් ගැටලුවට ඇති එකම විසඳුම මරණය බව ඔහුගේ මනසට ඇතුළත් වූ ද සිටම සැලසුම් වූයේ ජීවිතයෙන් මිදී යාමේ ක්‍රියාමාර්ගයකි. එය වරදක් බව තේරුම් නොගත් ඔහුට ප්‍රතිකාර පිණිස වැය කරන ධන සම්පත් ඇතැම් විට ඔහු රටට උපයා දුන් ධනයට වඩා වැඩි විය හැකිය.

මරණය තුළින් නිදහසක් ලැබේ යැයි සිතෙන තරමට ජීවිතය කරදරකාරී කරගැනීම පුද්ගලයාගේ අනුවණකම නිසාම සිදුවන්නකි. අපේ රටේ සියදිවි හානිකරගත් පුද්ගලයන් හා හානි කරගැනීමට උත්සාහ දරන පුද්ගලයන්ගේ වැඩිම ප්‍රතිශතයක් වාර්තා වන්නේ මධ්‍යම පාන්තික පවුල්වලිනි. අන්තයටම දුක් විඳින විඳි සරණ යාචක පවුල්වල සාමාජිකයන් දිවි හානිකර ගැනීමට නොපෙළඹෙති. ඒ ඔවුන්ගේ ප්‍රාර්ථනා සහ අපේක්ෂා අඩු බැවිනි. අතියින් සැප විහරණයන් ගත කරන ධනවත් පුද්ගලයන්ගේද සියදිවි නසා ගන්නා ප්‍රතිශතය අවම වේ.

වික්‍රමසිංහ අතපත්තු

"දෙවූ විගස කිරි නොමිදෙන්නාක් මෙන් අනුවණයකු විසින් කරන ලද පව් විගස නොමේරෙයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් අනුව යයි."

"රස නහර පිනවීමට
සතුන් මරන්නේ, ජීවත් වන අප
උන්ගේම සුසාන භූමි වේ
කුණු මස් කන කපුටන් සේ
මස් කමින් දිවි ගෙවන
අප දෙසවනට නෑසේය
උන් වේදනාවෙන්
නගන දුක්මුසු මර ලතෝනිය"

බර්නාඩ් ෂෝ



# මරණයේ වේදනාව සතුන්ටද දැනෙන බව සිතන්න

ලෝක ඉතිහාසය කරා මෙන පෙළන කළ මුළුමනින් ලෝකයා විසින්ම පිළිගන්නා ලද දාර්ශනිකයන්, විද්‍යාඥයන්, චිත්‍ර ශිල්පීන්, වෛද්‍යවරුන්, සමාජ ශෝධකයන් කොපමණ නම් නිර්මාංශ ආහාර ගන්නවුන්ගේ ගොන්නට අයත් වන්නේද? ජෝර්ජ් බර්නාඩ් ෂෝ, මහාත්මා ගාන්ධි, ඇනී බෙසන්ට්, ප්ලේටෝ, ලියනාඩෝ ඩාවින්සි, ඇල්බට් අයින්ස්ටයින්, මිල්ටන්, ෂෙලි, සොක්‍රටීස් මේ ඉන් සමහරෙකි.

සුප්‍රසිද්ධ විද්‍යාඥයකු වූ ඇල්බට් අයින්ස්ටයින් මෙසේ පවසා තිබේ. "නිර්මාංශ ආහාර අප ස්වභාවික පැවැත්ම කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන්නේය. මුළුමනින් ලෝවැස්සන්ම නිර්මාංශ ගන්නවුන් වුවහොත් මිනිසාගේ ඉරණම වෙනසකට යොමු කරන්නට හැකිවනවාට කිසිදු සැකයක් නොමැත."

"මිනිසාට මෙන්ම පක්ෂීන්ටද නිදහස අවශ්‍යය"යි මෙසේ පවසා ඇත්තේ ලියනාඩෝ ඩාවින්සිය. ඔහු කූඩු කරන ලද පක්ෂීන් මිලයට ගෙන මුදා හැරීම පුරුද්දක් වශයෙන් කළේය.

වරක් බෙහෙවින් රෝගාතුර වූ බර්නාඩ් ෂෝගේ වෛද්‍යවරුන්ගේ එකම අවවාදය වූයේ මස් මාංශ ආහාර වශයෙන් ගත යුතු බවයි. "ඔබ මස් නොගතහොත් මරණයට පත්වනවා ඒකාන්තයි." වෛද්‍යවරු පැවසූහ "මස් මාංශ කමින් ජීවත් වනවාට වඩා මිය යෑම යහපති" යැයි බර්නාඩ් ෂෝ පිළිතුරු වශයෙන් පැවසීය.

මත්පැන් පානය කරන්නවුන් සහ මස් මාංශ කන්නවුන් තිරිසන් වෙස් ගත් මිනිසුන් බව පැවසුවේ මහාත්මා ගාන්ධිය.

කෝල්රිජ් නමැති මහා කිවිඳු "රයිම් ඔෆ් ද ඒන්ෂන්ට් මැරිනර්" නමැති ඔහුගේ කාව්‍යය මෙසේ අවසන් කර ඇත.

"විශාල වූද, කුඩා වූද
සියලුම දයට ප්‍රේම කරන්නා
නිර්මල යාඥාව හඳනා ගන්නෙකි.
අප හිමා - අපට ප්‍රේම කරන දෙවියන්
සියලුම සත්වයන්ටද
ප්‍රේම කරන්නේය."

සත්‍යය මෙය නම් මිනිසත් බව ලබා උපන් අප, සත්ව ආත්මයක් ලබා ඇති තිරිසනෙකුගේ ජීවිතයට හානියක් කළ යුතුද?

"රස නහර පිනවීමට
සතුන් මරන්නේ, ජීවත් වන අප
උන්ගේම සුසාන භූමි වේ
කුණු මස් කන කපුටන් සේ
මස් කමින් දිවි ගෙවන
අප දෙසවනට නෑසේය
උන් වේදනාවෙන්
නගන දුක්මුසු මර ලතෝනිය"

ජෝර්ජ් බර්නාඩ් ෂෝ පවසා ඇති අයුරින් අප ඇවිදින සුසාන භූමි නම් මනුෂ්‍යයන් වශයෙන් අප ඒ පිළිබඳව ලජ්ජාවට පත්විය යුතු නොවන්නේද? මිනිස් සිතුම් පැතුම්, මිනිස් ක්‍රියා කෙරෙහි බලපාන්නේය. අහිංසාව පෙරදැරි කරගත් සිතුම් පැතුම් ඇති මිනිසකුට තවත් ප්‍රාණියකුට හානියක් කිරීමට අත එසවිය හැකිද? අකල් මරණයකට ගොදුරු වන අහිංසක මරණයට හවුල්කාරයකු විය හැකිද?

මස් කන්නාගේ සිතුම් පැතුම්වල මෛත්‍රියක් නොමැත. අත්මාර්ථයෙන් පිරි, කෘෘර, සැහැසි සිතුම් පැතුම්වලින් පිරි ඔහු මස් මාංශවලට පිපාසාවක් දක්වයි. ඔහුගේ සිරුර තුළ ධාවනය වන රුධිරයද වෛරයෙන් කෝපයෙන් උණුසුම්ය. මෙසේ වෛරයෙන් රක්ත සිරුර පුරා දිවෙන වෛරය මුසු රුධිරය ඔහු අමනුෂයෙකු කරයි. අමනුෂය මිනිසා සැහැසිකමට පෙළඹෙයි. ඔහු හානියක් කරන්නේ අනුන්ට පමණක්ම නොවේ. ඔහු සිතුවද හානි පමුණුවා ගනී. ඔහු තුළ ධාවනය වන රුධිරය ඔහු රෝගියකු බවට පත්කරයි. විවිධාකාර රෝගවලට ගොදුරු වන ඔහු අකල් මරණයකට ගොදුරු වෙයි. සැහැසි මරණයකට ගොදුරු වෙයි. බොහෝ අවස්ථාවන්හිදී ඔහු ලක්වන්නේද දරුණු රෝගවලටයි. අත් පා වලංගු නොමැතිව, සිරුරේ කොටස් කොටස් ඉවත් කර ගනිමින් නොයෙක් අන්දමේ වධ හිංසා විඳිමින් දුකින් දුකින් අයගේ ඇසුරට පත් අයගේ තමන්ගේ නොව ප්‍රියයන්ගේ පවා පිළිකුලට පාත්‍රය වී ශෝචනීය මරණයකට ගොදුරු වේ.

වරක් සිරකරුවන් අතර කරන ලද පරීක්ෂණයකදී සිරකරුවන්ගෙන් සියයට 75% ක් මාංශ බුදින්නන් බව හෙළිවී ඇත. අද ලෝකයේ පවත්නා මේ ප්‍රචණ්ඩ පැවැත්මට මස් මාංශ හේතුවන බව මෙයින් මනාව ඔප්පු වෙනවා නේද?

මෙසේ ලාංකේ මැරූ චුන්ද මරණ දෙරටුවට ආසන්න වූ කල සතියක් පුරාම ඌරකු සේ මරලතෝනි නැගුවේය. වේදනාවෙන් දුකවූවේය. මරණ බියෙන් කෑ ගසමින් අපා ගත විය. ඔහු "චුන්ද සූකර" නමින් ප්‍රසිද්ධ වූණේද ඒ නිසාමයි.

සතුන් මැරීමේ විපාක මෙයින් මොනවට වැටහෙන්නේද?


"අප නොවෙයි මරන්නේ, අප කන්නේ මරපු සත්ව මස්." මෙසේ පවසා අපට මේ මහා පාපකර්මයෙන් ගැලවීමට නුපුළුවන.



ශ්‍රියා රත්නකාර

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."

# ධර්ම දේශනය



දේශනයාගෙන් - මහනුවර අස්ගිරිය පර්ශ්වයේ සංඝ සභාවේ ... කාරක සංඝ සභික, ශාස්ත්‍රපති,
**පූජ්‍ය වේඩරුවේ ශ්‍රී උපාලි**
ශ්‍රී දළදා මාලිගාවේ ... නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

වාසනාවන්ත පින්වත්නි,

"ඉති ඛො, භික්ඛවෙ, අධනානං ධනෙ අනනුප්පදියමානෙ දාලිද්දියං වෙපුල්ලමගමාසි, දාලිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි, අදින්නාදානෙ වෙපුල්ලං ගතෙ සත්ථං වෙපුල්ලමගමාසි, සත්ථෙ වෙපුල්ලං ගතෙ පාණාතිපාතො වෙපුල්ලමගමාසි, පාණාතිපාතෙ වෙපුල්ලං ගතෙ තෙසං සත්තානං ආයුපි පරිහායි, වණ්ණොපි පරිහායි ති."

අද වප් පුන් පොහෝ දිනයයි. පෙර වස් හා පසු වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලා මහාපවාරණයෙන් පවාරණය වීමේ විනය කර්මය සිදු කරන්නේ අදයි. එබැවින් හෙට සිට ඉල් මස පුන් පොහෝ දින තෙක් භික්ෂූන් වහන්සේලා වස් විසූ විහාරස්ථානවල කඨින පින්කම් පැවැත්වීම සිරිතයි. එබැවින් මේ මාසය චීවර මාසය ලෙස ද හැඳින්වේ.

අද දින අප විසින් පින්වත් ඔබ වෙත පහදා දෙනු ලබන්නේ මිනිසාගේ ගුණධර්මයන් පිරිහීම ඔහුගේ විනාශයට මෙන්ම සමාජයේ හා ස්වභාව ධර්මයේ ද විනාශයට හේතුවන අයුරු සඳහන් දීඝනිකායෙහි ඇතුළත් චක්කවත්තිසීහනාද සූත්‍රයෙහි එන ධර්ම කාරණාවන්ය. එම සූත්‍රය ආරම්භ වන්නේ පෙර රජ වූ සක්විති රජ කෙනෙකුන්ගේ කතා පුවත්තියකිනි. එය මෙසේය.

පෙර 'දළ්හනේමි' නම් සක්විති රජ කෙනෙක් විය.

ඔහු ධර්මයට ගරුකරමින් ධර්මයෙහිම පිහිටා රටවැසියා පාලනය කළේය. ඔහුට චක්‍ර, හස්ති, අශ්ව, මාණික්‍ය, ස්ත්‍රී, ගෘහපති හා පරිනායක නම් වූ සප්තරත්නයක් විය. මෙවං සක්විති රජවරුන්ටම විශේෂ වූ සප්තරත්නය. ඔහුට ශූරවීර ගුණයෙන් යුත් දිව්‍ය පුත්‍රයන්ට සම රූ ඇති පුත්‍රයන් දහසක් පමණ විය. අවුරුදු දහසක් ඉක්මවීමෙන් පසු දළ්හනේමි රජු තම සේවකයෙකුට මෙසේ පැවසීය. 'පින්වත, යම් දවසක මේ චක්‍රරත්නය සිටි තැනින් සෙලවේ ද, වෙනත් තැනකට යයිද, එසේ වූ දවසක මට දන්වන්න' යනුවෙනි. දිනක් හදිසියේම එම චක්‍රරත්නය සිටි තැනින් වෙනස් විය. එකා ඒ පුරුෂයා රජුවෙත ගොස් ඒ බව දැන්වීය. ඊට පසු රජු තම වැඩිමහල් පුත්‍රයාට රාජ්‍ය පවරා දී හිස රැවුල් බා කසාවත් පෙරව ගෙන භාවනාව සඳහා වනගත විය.

රජු වනගතව දින හතක් ඉක්මයැමත් සමඟ චක්‍රරත්නය ද අතුරුදන් විය. එකා තම පියාණසන්‍ගුමා වෙත ගිය අභිනව රජු ඒ බව දැන්වීය. එවිට පියාණසන්‍ගුමා 'පුත්‍රය, චක්‍රරත්නයේ නොපෙනී යෑම පිළිබඳව ශෝක නොකරන්න. මේම චක්‍රරත්නය පියාගෙන් පුතාට උරුමවූවක් නොවේ. ඔබ විසින් කළ යුත්තේ සක්විති වත් සම්පූර්ණ කිරීමය' යනුවෙන් පැවසීය.

එවිට පුත් රජු, 'පියාණසන්‍ගුමනි, සක්විති වත් මොනවාද?' යනුවෙන් විමසීය. එවිට පියාණසන්‍ගුමා, 'පුත් රජතුමනි, ධර්මයෙහි පිහිටා, ධර්මයට සත්කාර කරමින්, ධර්මයට ගරු කරමින්, ධර්මය පුදමින්, වඳිමින්, ධර්මය ධජයක් කොට, ධර්මය කේතුවක් කොට, ධර්මය ප්‍රධාන කොට, අනුදැරුවන් සමඟ ශීලයෙහි පිහිටා කටයුතු කරන්න. ඔවුන් ධාර්මිකව ආරක්ෂා කරන්න. බලසේනාව, බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, ගෘහපති ආදී සියලු පිරිස ශීලයෙහි පිහිටුවා ධාර්මිකව ආරක්ෂා කරන්න. ජනපද වැසියන් ද, මහණ බමුණන් ද, සතාසිවුපාවා ද ආරක්ෂා කරන්න.

රටෙහි අධාර්මික ක්‍රියා නවත්වන්න. දුප්පතුන්ට ධනය දී ඔවුන් නගාසිටුවීමට කටයුතු කරන්න. මහණ බමුණන් වෙත පැමිණ කුසල්, අකුසල් විමසන්න. අකුසල් බැහැර කොට කුසලයෙහි යෙදෙන්න' ආදී වශයෙන් සක්විති වත් පෙන්වා දුන්නේය.

එය සතුටින් පිළිගත් රජතුමා රාජධානියට ගොස් එලෙසම කටයුතු කළේය. එවිට චක්‍රරත්නය ආදී වූ සප්තවිධ රත්නයන් යළිත් පහළ විය. සතර දිසාවෙහිම රජවරු තම රාජ්‍යයන් සක්විති රජුට පවරා දී අවවාද අනුශාසනා ලබාගත්හ. මෙසේ සක්විති රජතුමා වර්ෂ දහසක් දැරූමින් රජකොට පෙර රජතුමා මෙන් චක්‍රරත්නයේ වෙනස්වීම අනුව ඔහුගේ වැඩිමහළු පුතුට රාජ්‍ය පවරාදී වනගතව තපස් රකින්නට විය.

මෙසේ පරම්පරා හතක් ඉක්මගියේය. හත්වන වර රාජ්‍යත්වට පත් පුතා චක්‍රරත්නයේ අතුරුදන් වීමෙන් පසු පියරජු වෙත ගොස් සක්විති වත් නොවිචාළේය. එවිට රටේ සමෘද්ධිය ක්‍රමයෙන් අඩුවන්නට විය. මිනිසුන් රජුවෙත පැමිණ පෙර රජවරු මෙන් සක්විති වතින් රාජ්‍යය විචාරන්න යැයි උද්ඝෝෂණ කරන්නට වූහ. එවිට රජු ඇමතියන්ගෙන් සක්විති වත් විචාළේය. එහෙත් රජු කිසි අයුරකින් මෙ සක්විති වත් අනුගමන නොකළේය. දුප්පතුන්ට ධනය ලබා නොදුන්නේය. ධර්මයෙහි මනාලෙස නොහැසුරුණේය. එවිට

# යහපත් චර්යාවන් ඇතිකර ගැනීමෙන් මිනිස් ආයුෂ වැඩිවේ



"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

රටෙහි විවිධ ප්‍රශ්න උද්ගත වන්නට විය. මේ රජු ධාර්මික නොවීමේ ප්‍රතිඵලයයි.

මෙයින් පැහැදිලි වන්නේ පාලක පක්ෂයේ ක්‍රියාවන් සෘජුවම බලපෑම් එල්ල කරන බවයි. රජු දැහැමි වූ කල රටවැසියා ද දැහැමි වෙයි. රජු අදැහැමි වූ කල රටවැසියා ද අදැහැමි වෙයි. අප ධර්මයට ලැදිවන තරමට, ගරු කරන තරමට, ප්‍රායෝගික වන තරමට අපව ආරක්ෂා කරයි. දැහැමි අය සිවට පත්කරයි. ධර්මයෙන් ඈත්වන තරමට අනාරක්ෂිත වෙයි. විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදුවෙයි. එය අප ජීවත්වන ස්වභාව ධර්මයෙහි ඇති ස්වභාවයයි. අප තේරුම්ගත යුත්තේ මෙයයි.

දුප්පතුන්ට ධනය නොලැබීම නිසා රටෙහි දිළිඳුකම බලවත් විය. මෙසේ දිළිඳුකම බලවත් වීම නිසා එක් පුද්ගලයෙක් අන්සතු වස්තුව සොර සිතින් ගන්නේය. ඒ පිළිබඳ වස්තුව හිමි පුද්ගලයා රජුට දැන්වීය. රජු ඔහු ගෙන්වා කරුණු විමසීය. එවිට ඔහු පැවසුවේ අන්සතු ධනය ගත්තේ දුප්පත්කම නිසා බවයි. එවිට රජු ඔහුට ධනය දුන්නේය. අන්සතු වස්තුව ගත් අයට ධනය දෙන බව සෙසු අයට ආරංචි විය. රජුගෙන් ධනය අපේක්ෂාවෙන් ඔවුන් ද අන්සතු ධනය පැහැරගන්නට විය.

එවිට රජුට මෙබඳු අදහසක් ඇතිවිය. 'ඉදින් යම් කෙනෙක් අනුන්ට අයත්, නුදුන් වස්තුව සොර සිතින් ගන්නේ ද, ඒ ඒ අයට මම ධනය දෙන්නේ ද, ඒ කාරණයෙන් සොරකම් වැඩෙන්නේය.' ඊට පසු රජු රාජපුරුෂයන්ට අණ කළේය. රාජපුරුෂයෙනි, මේ පුරුෂයා අත් පස්සට තබා රැහැනින් දැඩි කොට බැඳ, හිස මුඩුකොට, වදබෙර නාදින් වීදියක් පාසා මංසන්ධියක් පාසා සමුළුවා නුවර දකුණු දොරින් පිටතට ගෙන ගොස් නුවරට දකුණු පැත්තේ දී නැවත සොරකම් නොකරන ලෙසට මොහුගේ හිස සිඳිව් යනුවෙන් නියම කළේය. රාජපුරුෂයෝ රජුගේ අණ ලෙස කටයුතු කළෝය.

මෙසේ දුප්පතුන්ට ධනය නොදෙනු ලබන කල දිළිඳු බව අධිකයින් පැතිර ගියේය, සොරකම වැඩිවිය. අවි ආයුධ වැඩිවී ගියේය. ප්‍රාණඝාතය වැඩිවී ගියේය. ඒ සත්වයන්ගේ ආයුෂ ද පිරිහිණි. වර්ණය ද පිරිහිණි. අසූදහසක් අවුරුදු ආයු ඇති ඒ සත්වයන්ගේ පුත්‍රයෝ සතළිස් දහසක් අවුරුදු ආයු ඇත්තේ වූහ. ප්‍රාණඝාතය වැඩුණු කල්හි බොරුකීම වැඩි විය. බොරුකීම වැඩි ගිය කල්හි කේලාම් කීම වැඩි ගියේය. කේලාම් කීම වැඩි ගිය කල්හි ඒ සත්වයන්ගේ ආයුෂ ද පිරිහිණි. ඔවුන්ගේ පුත්‍රයෝ, දසදහසක් ආයු ඇත්තෝ වූහ. පරදාර සේවනයෙහි යෙදීමෙන් ඒ මනුෂ්‍යයන්ගේ පුත්‍රයෝ පන්දහසක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ.

මෙසේ අයුෂයෙන් පිරිහෙනු ලැබූ ඇතැම් කෙනෙක් දෙදහස් පන්සියයක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ. ඇතැම් කෙනෙක් දෙදහසක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ. දෙදහස් පන්සියයක් අවුරුදු ආයුෂ ඇති මිනිසුන් තුළ තද ආශාව, ක්‍රෝධය යන දෙක අධිකයින් පැතිරුණේය. තද ආශාව හා ක්‍රෝධය යන දෙක අධිකයින් පැතිර ගිය කල්හි ඔවුන්ගේ පුත්‍රයෝ දහසක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ. දහසක් අවුරුදු ආයුෂ ඇති මිනිසුන් අතර මිථ්‍යාදෘෂ්ටිය අධිකයින් පැතිර ගියේය. එකල්හි ඒ සත්වයන්ගේ පුත්‍රයෝ පන්සියයක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ. මිනිසුන් අතර පන්සියයක් අවුරුදු ආයු ඇතිවූ කල්හි තෘෂ්ණාව, විෂම ලෝභය, මිථ්‍යා ධර්මය, රාගය අධිකයින් පැතිර ගියේය. ඒ සත්වයන්ගේ පුත්‍රයෝ දෙසියයක් අවුරුදු ආයුෂ ඇත්තෝ වූහ. මව කෙරෙහි වරදවා පිළිපැදීම, පියා කෙරෙහි වරදවා පිළිපැදීම, ශ්‍රමණයන් කෙරෙහි වැරදි ලෙස හැසිරීම, සිය පවුලෙහි වැඩිහිටියන්ට යටහත් නොවන බව යන මේ විෂමාචාර ක්‍රියාවන් පැතිරෙන්නට විය.

මෙසේ මේ විෂමාචාර කටයුතු පහ පැතිරගිය කල්හි දෙසියයකහක් අවුරුදු ආයුෂ ඇති සත්වයන්ගේ පුත්‍රයෝ අවුරුදු සියයක් ආයු ඇත්තාහු වූහ. යම් හේතුවකින් මේ මිනිසුන්ගේ පුත්‍රයෝ අවුරුදු දහයක් ආයුෂ ඇත්තෝ වන්නාහු ද, එබඳු කාලයක් වන්නේය. මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි ගිතෙල්, වෙඬරු, තලතෙල්, මී, හකුරු, ලුණු යන මේ රස නැතිව යන්නේය. දශ අකුසල කර්මපථයන් පැතිරෙන්නේය. මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි කුසලය යන නමවත් අසන්නට නොලැබෙන්නේය. ඒ සත්වයන් තුළ ඔවුනොවුන් කෙරෙහි දැඩි කෝපය, දැඩි ව්‍යාපාදය, දැඩි ද්වේෂය, දැඩි වධක චිත්තය ගෙවන් සව කෙනෙක් මැරීමේ ආශාව ඇතිවන්නේය. මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි සත් දවසක් මුළුල්ලෙහි ආයුධවලින් ඇණකොටා ගෙන විනාශ වන කාලය එළඹෙන්නේය.

මෙසේ ඇණකොටා ගෙන වැනසෙන මිනිසුන් පිළිබඳව කළකිරෙන මිනිසුන්ට මෙබඳු අදහසක් වන්නේය. එනම් අපි කිසිවකු නොමරමු. කිසිවෙක් අප නොමරත්වා. අපි තණ ලැහැබ් වලට හෝ පඳුරුවලින් ගැවසීගත් ස්ථානවලට හෝ ගස්වලින් ගැවසීගත් ස්ථාන වලට හෝ ගංගා මැද දූපත්වලට හෝ කඳුමුදුන්වලට හෝ පැමිණ, වනයෙහි වූ අල, මුල්, පල, වැල හා ජීවත් වන්නෙමු නම් යහපති යනුවෙනි. මෙසේ සිතා ඔවුහු ඒ තණවලින් ගැවසීගත් ස්ථාන ආදියට පැමිණ සතියක් ජීවත් වෙත්. ඔවුහු කුසලධර්මයන්හි සමාදන් වීම නිසා ආයුෂයෙන් ද වැඩෙති. වර්ණයෙන් ද වැඩෙති. මෙසේ කුසලයන්හි හැසිරෙමින් ජීවත්වන මිනිසුන්ට විසිවයස් ඇති පුත්‍රයන් උපදිති. මෙසේ ක්‍රමයෙන් ආයුෂ වර්ධනය වන අතර අවුරුදු සැටදහසක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු අසූදහසක් පරමායුෂ ඇති පුත්‍රයෝ උපදිති.

මිනිසුන් අතර අවුරුදු අසූදහසක් පරමායුෂ ඇති කල්හි ආශාව, කුසගින්න, මහලුවීම යන ආබාධ තුන පමණක් ඇත්තේ වෙයි. එකල දඹදිව අධිකයින් සමෘද්ධිමත්ව සියලු සම්පත්තීන්ගෙන් පිරී පවතී. ගම් නියම්ගම්, ජනපද, රාජධානි එකිනෙක සම්බන්ධව පවතින්නේය. දඹදිව උණ වනයක්, බට වනයක් මෙන් මිනිසුන්ගෙන් අතුරු සිදුරු නැතිවන්නේය. කේතුමතී රාජධානිය ප්‍රමුඛ කොට ඇති අසූහාරදහසක් නගරයෝ වනලෙන් වනලයට කුකුළෙකුට යා හැකි සේ වෙති. මිනිසුන් අතර අසූදහසක් අවුරුදු පරමායුෂ කොට ඇති කල්හි ඒ කේතුමතී නම් නුවර ධාර්මික වූ සංඛ නම් චක්‍රවර්ති රජෙක් වන්නේය. ඒ රජු අවියක් නොගෙන, ආයුධ නොගෙන මේ මුළු පොළොව ධර්මයෙන් දිනා වාසය කරන්නේය.

එකල මෛත්‍රිය නම් භාග්‍යවතුන් වහන්සේ ලෝකයෙහි උපදින්නාහ. ඒ බුදුරජාණන් වහන්සේ දෙවියන් සහිත, මාරයන් සහිත, බ්‍රහ්මයන් සහිත මේ ලෝකය ද, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත ජනයා ද තමන් වහන්සේගේ උසස් ඥානයෙන් දැන ප්‍රකාශ කරන්නාහ. ඒ බුදුරජාණන් වහන්සේ මුල යහපත් වූ, මැද යහපත්වූ, අර්ථ සහිත වූ, ව්‍යඤ්ජන සහිත වූ, සර්වසම්පූර්ණ වූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරති. ඒ බුදුරජාණන්වහන්සේ නොයෙක් සිය දහස් ගණන් භික්ෂූන් වහන්සේලා පිරිවරා වාසය කළ සේක.

එකල්හි සංඛ නම් චක්‍රවර්ති රජු මහාපනාද නම් රජු විසින් කරවන ලද ගංගා තීරයෙහි ගිලී පවත්නා ප්‍රාසාදය මතුකොට ගොඩට නංවා එහි කලක් වැස එය අනාථයන්ට හැර දමා, මහණ, බමුණු, දුගී, මඟී යාචක ආදීනට දන් දී මෛත්‍රිය නම් අර්හත් සම්යක් සම්බුද්ධයන් වහන්සේ සමීපයෙහි කෙස් රැවුල් කපා, සිවුරු හැඳ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වන්නේය. මෙසේ පැවිදි වූ සංඛ රජු ඒ අර්හත් ඵලය තමාම ඉතා උසස් ඥානයෙන් අවබෝධ කොට එයට පැමිණ වාසය කරන්නේය.

පාපී ධර්මයන් කෙරෙහි ලජ්ජාවන මිනිසුන් පිරිසක් තිරිසන් සතුන් මෙන් ඇණ කොටා ගන්නා මිනිසුන් පිළිබඳව කලකිරී, ඔවුන්ගෙන් වෙන්ව ඔවුන්ට නොපෙනෙන වෙනත් ප්‍රදේශයකට ගොස් වාසය කිරීමට කැමති වෙයි. ආහාර ලෙස අල වර්ග හා පල, වැල අනුභව කරමින් ජීවත් වීමට උත්සාහ කරන මේ පිරිස පවට ලජ්ජා වන අතර, ඔවුන් ගුණ ධර්මයන් කෙරෙහි සිත යොමු කිරීම නිසා ක්‍රමයෙන් දස අවුරුදු පරමායුෂ විනි අවුරුදු දක්වා වර්ධනය කරගනිති. ක්‍රමයෙන් ගුණ ධර්මයන් හා කුසල ධර්මයන් වැඩි දියුණු කරගන්නා නිසා පරමායුෂය අසූදහස දක්වා වැඩිදියුණු කරගැනීමට ඔවුහු සමත් වෙති.

මෙයින් පැහැදිලි වන ප්‍රධාන කරුණ වන්නේ මිනිසුන්ගේ අඩුවීමට මෙන්ම වැඩිවීමට ද ඔවුන්ගේ චර්යාවන් සෘජුවම බලපාන බවයි. මුලින් පරමායුෂ අසූදහස වූ මිනිසුන්, කාලයාගේ ඇවෑමෙන් සිත් තුළ හට වූ ලාමක අකුසල සිතුවිලි නිසා ක්‍රමයෙන් අවුරුදු දහය දක්වා ආයුෂ අඩුවී ඔවුනොවුන් තිරිසන් සතුන් මෙන් ඇණ කොටා ගෙන විනාශ වී ඇත. මෙම භයානක තත්ත්වය අවබෝධ කරගත් බුද්ධිමත් මිනිසුන් පිරිසක් නැවත ගුණ ධර්මයන් දියුණු කර ගනිමින් එම අවුරුදු දහය වූ ආයුෂය අවුරුදු අසූදහස දක්වා වර්ධනය කරගෙන ඇත. මෙයින් අපට කමටහනක් පැහැදිලි කර දෙන්නේ අපගේ චර්යාවන් ස්වභාවධර්මයට සෘජුවම බලපාන අතර එය ස්වභාව ධර්මයට අහිතකර නම් එහි පාලනයට ද ස්වභාව ධර්මයම සිදුකරන බවයි. එබැවින් අප යහපත් චර්යාවන් පුරුදුකර ගනිමින් අපටත් සමාජයටත් ස්වභාව ධර්මයටත් හිතැති පිරිසක් වීමට උත්සාහ කරමු.

ඔබ සැමට උතුම් වූ දළදා වහන්සේගේ ආශිර්වාදය ලැබේවා.



# ඔබ ළඟට දෙවියන් වඩින්නේ මේ පුද සිරිත් හරියට කළොත් විතරයි

"සබ්බේ කාමෙච රූපේ......" කියන ගාථාව පිළිබඳ පැහැදිලි කිරීමේ දී මා ප්‍රථමයෙන් බුදු දහම සහ දේව ඇදහිලි පිළිබඳ යමක් සඳහන් කරන්න අදහස් කරනවා. බුද්ධදහම දේව වාදයට අනුකූල වූ දහමක් නොවුණත් ගෞතම බුදු සසුන කෙරෙහි සිත් පැහැදී බුද්ධ ශ්‍රාවක දෙවි දේවතාවුන් වහන්සේලා බවට පත් වූ දෙවි දේවතාවුන් විශාල ප්‍රමාණයක් සිටින නිසා අපේ වත් පිළිවෙත්වලදී ඒ දේව සමූහයා කෙරේද අවධානය යොමු කළ යුතුයි.

ත්‍රිසරණයෙහි පිහිටි බොදුණුවන් සිදු කරනු ලබන කුසල් අනුමෝදන් වී ඉන් ප්‍රසාදයට පත් වෙන මේ සම්‍යක් දෘෂ්ටික, බුද්ධ ශ්‍රාවක දෙවි දේවතාවුන්, තම පිහිට පතන ඒ අයට අනන්ත ආශිර්වාද ලබා දෙනවා, පිහිට වෙනවා.

මේ නිසා තමයි අපට නොපෙනෙන ලෝකයේ වාසය කරන මෙවැනි ජීවී ආත්මීය බලවේග සමග බැඳුණු පුද සිරිත් වත් පිළිවෙත් සමග බැඳුණු ජීවිත බවට අපේ ජීවිත පත්වෙලා තියෙන්නේ.

බුදු දහමට අනුව සියලු දෙනා විසින් ගරු කළ යුතු දේව කොට්ඨාස තුනක් පිළිබඳව බුදු දහමේදී දක්වෙනවා. ඒ සම්මුති දේව, උත්පත්ති දේව සහ විශුද්ධි දේව වශයෙන්.

සම්මුති දේව කියන්නේ මහජන ගෞරවය, ප්‍රසාදය දිනාගත හැකි ආකාරයට ජනතාවට සේවය කරලා පිහිටවෙලා ගිය පරලොව ගිය රජ රැජ මහාමාත්‍යාදීන් ඇතුළු ප්‍රභූන් නායකයන් වැනි දේවත්වයෙන් සලකන්නට ඒ අයගෙන් පිහිට ලැබූ අය කටයුතු කරනවා. ඒ අයත් ආත්මීය බලවේග ලෙස සිටිමින් තමන්ට හුරු පුරුදු ඒ උපකාර කිරීම, පිහිටවීම දිගින් දිගටම කරගෙන යනවා. ඒ වගේ දෙවියන් තමයි මින්නේරි දෙවියන් (මහසෙන් දෙවියන්) මහාසේන දෙවියන් (කතරගම දෙවියන්) වැනි අය . ඒ වාගේම ගලේ බණ්ඩාර , හිටි බණ්ඩාර ආදී කොට ඇති බණ්ඩාර දෙවිවරු, මේ දෙවිවරුන්ට පින් දෙන පුද පූජා කරන අයට අපමණ පිහිට ඒ දෙවිවරුන්ගෙන් ලැබෙනවා.

ඊළඟ දේව කොට්ඨාසය තමයි උත්පත්ති දේව නමින් හැඳින්වෙන්නේ. භූමි ආශ්‍රිතව පහළ වූ මේ දෙවිවරුන් අනන්ත අප්‍රමාණ යහපත් වූ කටයුතුවල නිරත වීමෙන් රැස්කරගත් අසීමිත වූ කුසලයන්හි බලයෙන් එසේ දේවාත්ම ලබා පහළ වූ දෙවිවරු, ශ්‍රී විෂ්ණු , කතරගම , සමන්, පත්තිනි, දඩිමුණ්ඩ ආදී කොටගත් දෙවි දේවතාවුන් වහන්සේලා මෙන්න මේ උත්පත්ති දේව ගණයට වැටෙන දෙවිවරු, විශුද්ධි දේව නමින් හැඳින්වෙන්නේ කෙලෙස් සිඳලූ බුදු , පසේ බුදු , අරහත් ආර්යයන් වහන්සේලායි. මේ තුන් පිරිසටම පුද පූජා පැවැත්වීම, වතාවත් ඉටු කිරීම , බෞද්ධයාට කැප, සුදුසු පුද පූජා වත් පිළිවෙත් , මේ පුද සිරිත් පැවැත්වීමෙන් ත්‍රිසරණයට කිසිදු හානියක් සිදුවන්නේ නැහැ. එසේ කරන අයට මෙලොව , පරලොව සෙත ශාන්තිය සැලසෙනවා.

බුද්ධ කාලයේ දී විසාලා මහනුවර ඇති වූ රෝග , අමනුෂ්‍ය, දුර්භික්ෂ යන තුන් බිය දුරු කරලීම සඳහා දේශනා කළ රතන සූත්‍ර දේශනාවේ මෙසේ සඳහන් වෙනවා.

"තස්මාහි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝ ච හරන්තියේ බලිං
තස්මාහිනේ රක්ඛථ අප්පමත්තා"

මේ ගාථා රත්නයෙන් කියවෙන අදහස සරල සහ ප්‍රචලිත ලෙස ගත්තොත් මෙහෙමයි.

"අමනුෂ්‍යයිනි, යම් කරුණක් සඳහා තොප රැස්ව සිටින්නාහුද? එහෙයින් සියල්ලෝම මාගේ ධර්මය අසව්. මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි මෛත්‍රිය කරව්. යම් මනුෂ්‍ය

කෙනෙක් ඒ දහවල්හි තොපට පූජා ගෙනෙත්ද? එහෙයින් ඔවුන් රකිව්.


මෙහි සරල තේරුමට අනුව "දිවා-රාත්‍රී දේවාලාදියට ගොස් මල් පහන් පිදීමෙනුත් දන සිල භාවනා දී ත්‍රිවිධ පින්කම් සිදු කිරීමෙනුත් රැස් කරගත් කුසල අනුමෝදන් කර ඒ ගුණයෙහි පිහිටි දෙවියන් ඔබ ආරක්ෂා කරන බවත් අප්‍රමාදීව රැක ගන්නා බවත්. එසේම ඔබලාට යම් කිසි අසල උපද්‍රවයක් පැමිණි විට මැකීමෙන් සහ කයින් වචනයෙන් හා සිතින් යහපතෙහි යෙදී දන සීලාදිය දීමෙන්ද ගෙන් ප්‍රාර්ථනා කිරීමෙන්ද අනන්ත ආශිර්වාද ලැබෙන බවත් පිළිගත හැකි වනවා මෙන්ම එය බුදු දහමට අනුකූලද වේ.

මේ බව අංගුත්තර නිකායේ සඳහන් ශ්‍රී සම්බුද්ධ දේශනා අතර ඇති "ශෝක පල්ලගහාණ සූත්‍රයෙහි" ද සඳහන් වෙනවා.

මේ නිසයි තිසරණ සරණ ගිය බොදුණුවන් විසින් දෙවියන්ට පින් අනුමෝදන් කළ යුත්තේ. ඒ පින් ලබන්නට පිරිත් ශ්‍රවණයට වැඩම කරවන ලෙසට ආරාධනා කළ යුත්තේ. දෙවියන්ට ආරාධනය කරන ගාථාව පිළිබඳ බොහෝ අය විමසනවා. ඒ විමසීම හරිම හොඳයි. සිතීමේ සහ විමසීමේ නිදහස ඇති ලොව එකම දහම බුදු දහම පමණයි. ඒ නිසා සිතා විමසා අවබෝධ කර ගැනීමයි වඩා වටින්නේ.

නිකම්ම නිකම් මන්තරයක් වාගේ දේවාරාධනා ගාථාව, පිරිත් සූත්‍ර කියන්නත් වාගේ කියනවාට වඩා අර්ථය දැනගෙන කියනවා නම්, එයයි වඩාත් වටින්නේ. ඒ නිසයි මා නිතර නිතර කියන්නේ ගෙදර නිතර භාවිත කරන පිරිත් සූත්‍රවලත් සිංහල තේරුම් දැනගෙන එම පිරිත් සූත්‍ර භාවිත කරන්න කියලා. එහෙම සිංහල තේරුම් සහිත පිරිත් පොත්වලින් මේ පිරිසට එහි අර්ථය ඔබට වටහා ගත හැකි වෙනවා.

මා ඔබට වටහා දෙනවා "සග්ගේ කාමේ ච රූපේ" යනාදී වශයෙන් එන දේවාරාධනා ගාථාවේ තේරුම.



නිතර නිතර අපේ ලිපි සමග පළවන ඒ ගාථාව අද නැවතත් පළ කරන්නේ ඒ ගාථාව කියවා බැලීමෙන් පසු වචනයෙන් වචනය එහි අර්ථය වටහා ගැනීමට ඔබ යොමු කිරීමටයි.

**දේවාරාධනා ගාථාව**

"සග්ගේ කාමේච රූපේ ගිරි සිඛර තටේ
චාන්තලික්ඛේ විමානේ දීපේ රට්ඨෙ ච ගාමේ
තරු වන ගහනේ ගේහ වත්ථුම්හි ඛෙත්තේ
භුම්මා චායන්තු දේවා ජලථල විසමේ
යක්ඛ ගන්ධබ්බ නාගා තිට්ඨන්තා සන්තිකේ දං
මුනිවර වචනං සාධවෝ මේ සුණන්තු"

අපි දැන් එහි තේරුම විමසා බලමු. "සග්ගේ" කියන්නේ ස්වර්ගයෙහි නැතිනම් දෙව්ලොවෙහි යන්නයි. "කාමේච, රූපේ" යන වචනවලින් කියැවෙන්නේ කාම ලෝකය සහ රූප ලෝකය යන්නයි.

"ගිරි සිඛර තටේ" යන්නෙන් පර්වත, කුළු මෙන ගත අර්ථය එනවා. "චාන්තලික්ඛේ" යනු අන්තරීක්ෂය නොහොත් අහසයි. "විමානේ දීපේ රට්ඨෙ ච ගාමේ" යන්නෙන් මහා සම්පත්වලින් පිරි දිව්‍ය විමාන ද්වීපයන් වට වූ දිවයින් දෙපත් හෙවත් "දීප" රටවල් ගම් නියම් ගම් යන අරුත් ගෙන දෙනවා. "තරුවන ගහනේ" යන්නෙන් තුරු (වෘක්ෂ) වන ලැහැබවල්ද "ගේහ" යන්නෙන් ගෙවල්ද "වත්ථුම්හි ඛෙත්තේ" යන්නෙන් වතුපිටි, කුඹුරු, කෙත්වතු යන අරුත්ද යෙදෙනවා.

ඒ වාගේම "භුම්මා" යන්නෙන් භූමියෙහි යනුවෙන්ද "චායන්තු දේවා" යන්නෙන් දේව විමානවලද "ජලථල විසමේ" යන්නෙන් ජලයුත් තැනිතලා පෙදෙස්ද ගැනෙනවා.


ඊළඟට යෙදෙන වචන තුන "යක්ඛ, ගන්ධබ්බ, නාගා" යන වචන තුන සමහර "පිරිත්" පාඨක හාමුදුරුවන් විකෘති කරන්නේ සමහර විට සිතෙන් සැකයෙන්, ඒ මේ ගාථාව කියූ විට යක්ෂයන්ටත් ආරාධනා කරනවාද කියන වැරදි මතය ඔවුන් තුළ තියෙනවා. නමුත් එහෙම සැකයක් කුකුසක් තබා ගත යුතු නැහැ. "යක්ෂ" යන්නෙන් හැඟෙන්නේ යකුන් හෝ එවැනි පහත් පෙළේ අමනුෂ්‍ය බලවේග නොවේ. බල සම්පන්න දෙවිවරු යන අරුතයි එතැනදී එන්නේ. "ගන්ධබ්බ නාගා" යන වචනවලිනුත් කියවෙන්නේ දෙවියන් අතු බල සම්පන්න බවයි. "ගන්ධබ්බ" දෙවිවරු කියන්නේ ඉතා පහළ වන දෙවිවරු, නාග කියන්නෙන් දෙවිවරු ගැන ඔබ හොඳින් අවබෝධයක් කර ගන්න.

"තිට්ඨන්තා සන්තිකේ දං" යන්නෙන් ඉතා සමීපයේ සිට සත් පුරුෂ ලෙස මහත් කරුණාවෙන්, "මුනිවර වචනං සාධවෝ මේ සුණන්තු" ගෞතම බුදුරජාණන් වහන්සේගේ "උතුම් බුද්ධ වචනය සුවසේ ශාන්තව ශ්‍රවණය කරන්නට වඩින්නට" යන්න එහි අරුත් වෙනවා.

ඒ අනුව එහි සරල අර්ථය ගත්තොත් "ලොව සියලු තැන්හි වසනා සියලුම දෙවි දෙවිතාවුන් වහන්සේලාට උතුම් බුද්ධ වචනය සුවසේ ශාන්තව ශ්‍රවණය කරන්නට වැඩම කරවන ලෙසටයි" මේ ගාථාවෙන් ආරාධනය කරන්නේ.

විශාවෙන් ශුද්ධ කිරීමෙන් බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය උදෙසා මල් පහන් සුවඳ දුම් ආදී විවිධ බුදු පූජා පැවැත්වීමෙන් අනතුරුව මේ දේවාරාධනා ගාථාව කියන කොට දෙවියන් ඉතා පහන් සිතින් ශාන්තව උතුම් වූ ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය සඳහා වඩිනවා. ඒ බව අප අත්දැකලා තියෙනවා. එහෙම වඩින දෙවිවරුන්ට පිරිත් ශ්‍රවණය සඳහා සුදුසු පරිසරයක් සකසා තැබිම

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."



ගැන අවධානය යොමු කළ යුතුයි.

ඒ නිසයි බුදුන් වඩින තැන පිරිසිදුවට පිළිවෙළට තිබිය යුතු වන්නේ. ඒ නිසයි බුදුන් වඳින අය සිත, කය, වචනය යන තුන් දොරම පිරිසිදු කරගෙන පිවිතුරු, සිහියෙන් යුතුව එම පුද පූජා පැවැත්විය යුතු වන්නේ.

එවිටයි දෙවියන් ප්‍රසන්න සිතින් පිරිත් ශ්‍රවණය කරන්නේ. එවිටයි එසේ පුද සිරිත් පවත්වන ඔබ පිළිබඳව දෙවියන් පැහැදෙන්නේ. එවිටයි ඔබ මල් පහන් පුදන තැන දෙවියන් වඩින, දෙවියන් සිහිපත් වන, දෙවියන්ට ප්‍රිය තැනක් වන්නේ. එසේ වූ විට ඔබේ නිවසට, භූමියට, ව්‍යාපාරික ස්ථානයට වාගේම මෙසේ පිළිවෙළට, පිරිසිදුවට පුද පූජා පවත්වන පන්සලට, දේවාලයට යන ස්ථානවලට ඇති පහත් පොළේ අමනුෂ්‍ය, නීච, බලවේගවල බලපෑම් ඉඩෙක් නැති වෙනවා. බාධකවලට හසුවී විවිධ විනාශකාරී දේ කරමින් සිටින මෙවැනි අමනුෂ්‍ය ආත්ම එම බාධකවලින් මිදී සැනසීම ලබනවා. එහෙම බන්ධනයක් කැඩුණෙත් මේ බලවේග බාධක කළ අය කෙරේ කෝපයෙන් වෛරයෙන් තව තවත් අකුසල් කර ගන්නවා. නමුත් මේ වත්පිළිවෙත් සමග දෙවියන් වඩින විටදී එම බන්ධන පිපිරී ගියාම ඒ බලවේග දෙවියන්ට අවනත වෙනවා. කෝපකාරී, වෛරී සිතුවිලිවලින් අයින් වෙනවා. එයත් ඔබ කරන මහා පින්කමක් වෙනවා. ඒ පින්කමේ කුසලය ද දෙවියන්ට අනුමෝදන් වෙනවා. ඒ තුළින් දෙවියන් තව තවත් සැහැදී ඔබට යහපතම උද කරනවා.

**උපුටා ගැනීම :- සුනිල් පොරමඩල**
**මහා පූජ්‍ය ගල්ලෙනෙවිටියේ ප්‍රේමරතන**
(කොළඹගම පොඩි හාමුදුරුවෝ) සමග
කළ සාකච්ඡාවක් ඇසුරිනි.

# එදා රාජකීය කුණම් මඩුව අද උඩරට කලා සංගමය

## දළදා වඳින්නට යන ඔබ මේ ගැන දැන සිටියාද?

**මහනුවර** පැරණි රජ මැදුරට අයත් ගොඩනැගිලි දළදා මැදුර අවට විශාල ප්‍රදේශයක එදා පිහිටි තිබුණි. එවැනි ගොඩනැගිලි තිස්දෙකක් පමණ සිංහල රජ මාලිගා සංකීර්ණයට එදා අයිතිව තිබුණි. 1815 ඉංග්‍රීසීන් උඩරට අල්ලා ගන්නා විට මින් සමහර ගොඩනැගිලි ඉංග්‍රීසීන් විසින් කඩා බිඳ දමනු ලැබිය. දළදා මැදුර යාව ඇති උළුපැන් පොකුණ ඉංග්‍රීසීන් එසේ කඩා දැමූ එකකි. තැනින් තැන විසිර තිබූ කුඩා රාජකීය ගොඩනැගිලිද ඉන්පසු ඉංග්‍රීසීන් විසින් කඩා බිඳ දමන්නට යෙදිණ.

එදා උඩරට රජ මැදුරට අයත් ගොඩනැගිලිවලින් අද ඉතිරිව ඇත්තේ හතක් පමණකි. ඒ අතර කුණම් මඩුව හෙවත් අද උඩරට කලා සංගම් ගොඩනැගිල්ල එකකි.

මහනුවර දළදා මැදුරේ සිට ගෝරකඹර කිරිමුහුද වැව් බැම්ම දිගේ මීටර් සීයක් පමණ ඉදිරියට යනවිට රතුකුරුස ශාලාවට යාව උඩරට කලා සංගම් ගොඩනැගිල්ල පිහිටා ඇත. මහාමාර්ගයේ සිට පියගැට පෙළක් නැග සිටිවිට මෙම ගොඩනැගිල්ල හමුවෙයි. මෙහි පැරණි ගොඩනැගිල්ල ඉංග්‍රීසි යුගයේදී අලුත්වැඩියා කර ඇත. උඩරට පාරම්පරික ශිල්පීන්ගේ කැටයම් හා කර්මාන්ත සංචාරකයන් සඳහා මෙහි ප්‍රදර්ශනාත්මක ලෙස සිදු කෙරෙයි. ඒ භාණ්ඩ සකස් කරන ආකාරය එහිදී දැකගත හැකිය. අවුරුදු සීයක් පමණ පැරණි වටිනා චිත්‍ර කිහිපයක්ද එහි බිත්තිවල එල්ලා ඇත. එදා උඩරට රජු ගමන් බිමන් ගිය කුණම තැන්පත් කර තැබුවේ මෙම ගොඩනැගිල්ලේය. රජුට ගමනක් යාමට අවශ්‍ය විට කුණම් මඩුවේ සිට කුණම හා එය ඔසවාගෙන යන්නන් රජවාසල වෙත යාම සිදුවිය. ඉංග්‍රීසි යුගයේදී වරින්වර කුණම් මඩුව විවිධ කටයුතු සඳහා භාවිත විය. අද එය උඩරට කලා සංගම් ගොඩනැගිල්ල ලෙස භාවිත වෙයි.


**එස්. කේ. ජයවර්ධන**

# ධම්මදීප සභාවෙන් ක්‍රියාත්මක වූ ගැබිනි මවුවරුන්ට වෛද්‍ය උපදෙස් ලබාදීම හා තිළිණ බෙදා දීමේ මහෝත්සවය



**ත්‍රෛනිකායික** මහානායක හිමිපාණන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවාගෙන ඇති ධම්මදීප සභාවේ මෙහෙයවීමෙන් ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේතුමාගේ දායකත්වයෙන් පදියපැලැල්ල මතුරට මණ්ණේතැන්න සහුගා සෙනසුන විහාරස්ථානයෙහි 2014 සැප්තැම්බර් 13 දින ගැබිනි මවුවරුන් උදෙසා වෛද්‍ය උපදෙස් ලබා දීම හා දිවා ආහාරය සමග ළදරු උපකරණ බෙදා දීමේ මහෝත්සවයක් පැවැත්විණ. මහ විහාර වංශික ශ්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි පාර්ශ්වයේ කාරක සංඝ සභික පූජ්‍ය කුඹුක්කඳන්වල පුඤ්ඤරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ හා මණ්ණේතැන්න සහුගා සෙනසුන විහාරස්ථානයේ මතුරට පියුම්පුරා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සව අවස්ථාවට ප්‍රදේශයේ ගැබිනි මවුවරුන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ. ගර්භණී මාතාවන් 60කගේ පමණ සහභාගිත්වයෙන් පැවති මෙම විශේෂ අවස්ථාවට සහභාගි වූ මවුවරුන්ට සෙත් පිරිත් සජ්ඣායනයක් හා මහනුවර මහ රෝහලේ මහෝ වෛද්‍ය අජිත් ආරියසේන මැතිඳුන්ගේ වෛද්‍ය උපදේශනයක්ද පැවැත්වුණු අතර, සහභාගි වූ ගැබිනි මවුවරුන් සඳහා දිවා ආහාරය සමග ළදරුවන්ට අවශ්‍ය එක උපකරණ කට්ටලද තිළිණකොට දීමද සිදුවිය.

**ජයම්පති වැද්දාගල**



# අටලෝ දහම කාටත් පොදුය

පුරාණ කාලයේ ඉන්දියාවේ කුලගෙයක තරුණියක්, දෙමාපියන් සහ මෙහෙකාරියක සමඟ වාසය කළාය. ඇගේ හැසිරීම හා ගතිගුණ ඉතා විනීත විය. මේ තරුණියට දෙමවුපියන් ගේ ඉමහත් ආදරයක් දසියගේ ගරු සැළකිල්ලක් ලැබිණි. නිරතුරුවම අසල්වැසියන්ට ගුණ කරුණාව පෙන්වමින් සිටි මේ තරුණියගේ කීර්තිය සැමතැනම පැතිරී ගියේය. අසල්වැසියෝ ඇගේ ගුණ ගායනා කළහ. එහි සිටි කිසිවෙකු ඇගේ නුගුණ කීමට අදහස් කළේ නැත. යම් යම් හේතු සාධකවල එකතුවීම ඇගේ කීර්තියට හේතුවිය. මේ හේතු සාධක පසුව වෙනස් වීම නිසා අලුත් තත්ත්වයක් උද්ගත වූ සැටි සොයා බලමු.

මෙරමා නමින් හැඳින්වූ මෙම තරුණිය කාගේත් ප්‍රශංසාවට ලක් වූයේ ඇගේ සැබෑම ගතිගුණ නිසාදැයි සොයා බැලීමට දසියට සිතුණේය. ඇ සුළු අත්හදා බැලීමක් කළාය. ඇගේ සිරිතව පැවැතුණේ ඉතාම උදයෙන් පිබිදී ගෙදර කටයුතු නියම වේලාවට කිරීමය. ඒ නිසා ඇයටත් සැනසිල්ලක් ලැබිණි. ඇ තමන් කැමැති වේලාවට පිබිදී තමාට පැවරුණු වැඩ කටයුතු ඉටු කළාය.

දිනක් දසිය වෙනදා මෙන් හිමිදිරියේ නොපිබිදී දිගටම නිදා ගත්තාය. වෙනදා මෙන් ටිකක් ප්‍රමාදව පිබිදුණු තරුණිය දුටුවේ දසිය තවම නිදා ගන්නා බවයි. තරුණිය කිසිවක් නොකියා උදේ කටයුතුවල යෙදුණාය. දින කිහිපයක්ම දසිය නොනැඟිට නිදා ගන්නා බව දුටු තරුණිය, ඇ අවදි කොට, මින් මතුවට වත් උදෙන් නැගිටිය යුතු යැයි අණ කළාය. දසිය ඇගේ කීම නොපිළිගන්නා දිගින් දිගටම ප්‍රමාද වී පිබිදුණාය. මෙයින් කෝපයට පත් තරුණිය මුල දී ඇට බැණ වැදුණාය. දෝෂාරෝපණය කළාය. දසියගේ මුරණ්ඩු ගතිය අඩු නොවීම නිසා තරුණිය ඇට පහර දුන්නාය. දිනෙන් දිනම මේ පහරදීම් වැඩිවිය. තරුණියගේ කෝපය ද දිනෙන් දිනම වැඩිවිය. තරුණියගේ චර්යා විපර්යාසය අසල ගෙවල සිටි අය ද දැන ගත්හ. ඇතැම් අය දසියගෙන් කරුණු විමසා බැලූහ. ඊට පසු අසල්වැසියෝ ඇගේ නපුරු ගති ගුණ ගැන කතා කරන්නට වූහ. මෙතෙක් මිතුරු මිතුරියන්ගේ ප්‍රශංසාවට ලක් වූ තරුණිය, දැරියට හිංසා කිරීමේ පුවත සැලවීමෙන් පසු ඇනුම් බැණුම්වලට ලක්වූවාය.

යම් යම් සාධක එකතු වූ විට තරුණිය ප්‍රශංසා ලැබූ සැටිත්, සාධක වෙනස් වූ විට ඇ ගැරහුම් ලැබූ සැටිත් මේ කතාවෙන් හෙළි වෙයි. බුදුන් වහන්සේ අනුන්ට අවඥ කිරීම මෙන්ම ප්‍රශංසා කිරීමද නුසුදුසු යැයි වදාළේ මේ කරුණු නිසාය.


සාහිත්‍ය කෘති ඉතා හොඳින් කියවා බලා මනුෂ්‍යයන්ගේ ගති සොයා උගන්නා රසිකයෝ, විවිධ හේතු නිසා වරදෙහි බැඳෙන පුද්ගලයන්ට ද්වේෂ නොකරති. කිසියම් මිනිසකු වරදෙහි බැඳීමට හෝ අපරාධයක් කිරීමට හෝ මුල්වන හේතු සාධක සියල්ලක්ම සලකා බලන සාහිත්‍යකරුවා වරදකරුවන්ට බැණ නොවැදී සමාව දෙයි. අනුකම්පාව දක්වයි. ඔහු හොඳ අවබෝධයකින් යුතුව මානව චර්යා දෙස බලයි. ඔහුට පෘථුල ලෝකාවේක්ෂණයක් ඇත. මනුෂ්‍ය ස්වභාවය පිළිබඳ හොඳ දැනීමක් නැත්තාවූ සැලකිල්ලක් නොදක්වන්නා වූ ධර්මවේදීන්, ධර්ම සංවේග යෙන් මෙහෙය වනු ලැබ කෑ මුර ගසන සැටි අපට බොහෝ විට දක්නට ලැබේ.


"එමා බෝවරි" නමැති නවකතාවේ එන ස්ත්‍රිය, ජීවිතයේ බොරු හර විසින් සංවේදීතව පරපුරුෂ සේවනයට යොමු වුණු සැටි කියවන ධර්මවේදීන් දයාවෙන් හා අනුකම්පාවෙන් තොරව, ඇට බැණ වදින බවට සැකයක් නැත. එහෙත් මනුෂ්‍ය ස්වභාවයත්, සහජ මානව ආවේගවල ක්‍රියාකාරීත්වයත් දන්නා අය ඇයට අනුකම්පා කරති.

ලෝක ධර්මයන් කෙරෙන් කම්පා නොවී සිටීමේ ගුණය අපේ අධ්‍යාත්මික උරුමයේ එන විශේෂ ලක්ෂණයයි. ලාභය, අලාභය, යසස, අයස, නින්දාව, ප්‍රශංසාව, සුඛය හා දුක ඒ අටලෝ දහම වෙයි. මුළු මහත් ජනතාවටම මේ අටලෝ දහම පොදුය.

රෙජී වීරමන්

"ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත."



දිළිඳුකම රටක ගැටුම් ඇතිවීමට බලපාන ප්‍රධාන සාධකයක් බව අපි දනිමු. දිළිඳුකම රටක සමාජමය ගැටුම් ඇතිකරනවා පමණක් නොව ආධ්‍යාත්මික වශයෙන් පුද්ගලයා දූෂිත කොට විෂම ක්‍රියාවලටද පොළඹවයි. මෙය මනා ලෙස දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ විස්තර කර දක්වයි.

"ඉති ඛො භික්ඛවෙ අධනානං ධනෙ අනනුප්පදියමානෙ දාලිද්දියං වෙපුල්ලමගමාසි, දාලිද්දියං වෙපුල්ලම ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි, අදින්නා දානං වෙපුල්ලං ගතෙ සත්ථං වෙපුල්ලමගමාසි, සත්ථං වෙපුල්ලං ගතෙ පාණාතිපාතො වෙපුල්ලමග මාසි, පාණාතිපාතෙ වෙපුල්ලං ගතෙ මුසාවාදෝ වෙපුල්ලමගමාසි, මුසාවාදෙ වෙපුල්ලං ගතෙ තේසං සත්තානං ආයුපි පරිහායි, වණ්ණොපි පරිහායි, තේසං ආයුනාපි පරිහායමානානං වණ්ණෙනාපි පරිහායමානානං චත්තාරීසවස්සසහස්සායුකානං මනුස්සානං වීසති වස්සසහස්සායුකා පුත්තා අහෙසුං"

මෙයින් පැහැදිලි වන කාරණය නම් දුප්පත්කම රටක ගැටුම් ඇතිවීම සඳහා බලපාන ප්‍රධාන සාධකයක් වශයෙන් ක්‍රියාත්මක වන බවත්, එය මුල් කරගෙන ප්‍රාණ ඝාතය, සොරකම ආදී සෙසු සමාජ විෂමචාරී ක්‍රියාවන්ද සමාජය තුළ උත්ගත වන බවත්ය. එපමණක් නොව එහි අහිතු ප්‍රතිවිපාක බාහිර වශයෙන්ද, අභ්‍යන්තරික වශයෙන්ද පුද්ගලයාගේ පරිහාණිය සඳහා බලපාන අයුරු මෙහිදී අපට හඳුනාගත හැකිය.

බෞද්ධ දේශපාලන චින්තනයේ පදනම ප්‍රජාතන්ත්‍රවාදයයි. පාලකයා හෙවත් රජු විධායක පාලකයෙකු පමණක් නොව ගුණ දහමින් පිරුණු පිරිසිදු තැනැත්තෙකු විය යුතු බව බුදු දහම පෙන්වා දෙයි. මහජන අදහස්වලට ගරු කරන හා තම බලය මහජන සුබසෙත වෙනුවෙන්ම කැප කරන රජෙකු බුදු දහම අපේක්ෂා කර ඇත.

එහිදී කිසියම් රටක අර්බුදයක් හෝ ප්‍රශ්න උද්ගත වන අවස්ථාවකදී රජයක් විසින් හෝ පාලකයකු විසින් කෙසේ ක්‍රියා කළ යුතුද යන්න බුදු දහම මෙසේ සාරාංශ කොට පෙන්වා දී ඇත.

# ඡන්දෙන් පසු ගහ ගන්නෝ දහමක් ගැන නොම දන්නෝ

- දසරාජ ධර්මයෙන් රට පාලනය කිරීම (දීඝනිකාය - චක්කවත්ති සීහනාද සූත්‍රය)
- දස සක්විති වත් අනුගමනය කිරීම.
- සතර සංග්‍රහ වස්තු ක්‍රියාත්මක කිරීම.
- සතර අගතියේ වැළකී කටයුතු කිරීම.
- සප්ත අපරිහානි ධර්ම අනුගමනය කිරීම.
- පංචශීල ප්‍රතිපදාව අනුගමනය කිරීම.
- ආදානග්‍රාහී නොවී යහපත් අවබෝධයෙන් කටයුතු කිරීම.
- සීලයෙහි පිහිටීම හෙවත් කායික වාචසික සංවරයෙහි පිහිටීම.
- ගැටුමක පසුබිම හඳුනාගෙන එය විසඳීම සඳහා විවෘතව කටයුතු කිරීම.


මානව සමාජයේ ආර්ථික විෂමතාවයන් තුරන් කිරීම මිනිසුන් අතර සාමය පැතිරවීමට මූලික කාරණයක් වන්නේය. ඒ සඳහා අවශ්‍ය වන්නේ හැඟීම් වෙනස් කිරීමත් පවත්නා ක්‍රමය වෙනස් කිරීමත්ය. යුද්ධයක් සිදුකරන්නේ සමාජය කළඹුරු කරගෙන යමක් තමා සතුකර ගැනීමට හෝ යමක් තමා සතුකර ගැනීමටයි. පුද්ගලයන් අතර ඇතිවන යුද්ධය ඇතිවීමට හේතුසාධක සොයා යාමේදී අපට පෙනී යන්නේ මෙයට මනෝ මූලික හේතු බලපාන බවයි. යුද්ධය නිමා කොට සැනසුම ලබන්නට නම් සාමයේ කඳවුරු බැඳිය යුත්තේ මිනිස් සන්තානය තුළ යැයි දක්වෙන අදහසට අනුව යුද්ධයක් සඳහා මූලික හේතුව වන්නේ මිනිස් සිතේ උපදින අධික තෘෂ්ණාවයි. බල කාමය, වස්තු කාමය, කීර්ති ප්‍රශංසා කාමය, ජය ලැබීමේ කාමය ආදී විවිධ ස්වරූපයන්ගෙන් යුතුව මේ තෘෂ්ණාව මිනිස් සිත තුළ ක්‍රියාත්මක වේ. (මැතිවරණයක් අවසන් වීමත් සමඟ

"ආත්ම නිව් පුතුය. අනුන්ට හොබිහිය පුතුය. දහිසනු යමක් ඉල්ලූ කල විසක් දුටිත් දීම පුතුය. මේ තුන් කරුණෙන් පොහොසුව දෙවියන් වෙත යා හැකිය."



ශ්‍රී ලංකාවේ ඇතිවන ගැටුම් ගැන සිතා බලන්න.)

තවද ජාතිවාදය, ආගම්වාදය, කුලවාදය වැනි මානසිකත්වයක් නිසාද යුද ගැටුම් ඇතිවීමට හැකිය. මෙහිදී තමා උසස් බව හා තම ආගම, ජාතිය, කුලය, තම දක්ෂතා උසස් බව සිතමින් තමා හුවා දක්වීමට මෙන්ම අනය ජාතිය, කුලය, ආගම, දක්ෂතා පහත් යැයි සලකා ක්‍රියා කිරීමට පුද්ගලයා පෙලඹේ. මෙවැනි පහත් මානසික හැඟීම් නිසා අන්‍යෝන්‍ය වශයෙන් ගැටුම් ඇතිවේ. මෙම ගැටුම් ඇතිවන්නේ තම සිතේ උපදින මෝහ මූලික හැඟීම් පදනම් කරගෙනය.



යුද්ධය අතිබිහිසුණු වේදනාබර එකක් බව දකින බුදු සමය යුද කිරීමෙන් තමන් ලබන ජයක් නැතැයි දක්වා තිබේ. දිනන්නා තුළ පරදින්නා කෙරෙහි වෛරයක් ඇති කරගන්නා අතර දිනූ නැනැත්තා පැරදුණු නැනැත්තාට වඩා සැක බිය උපදින බවත් පෙන්වා දී තිබේ. යුද්ධයක ඇති අමිහිරි විපාක වශයෙන් බුදු දහම පෙන්වා දී ඇති කරුණු අතර **සම්පත් විනාශය, ජීවිත විනාශය, අසමගිය, අසහනය, අවිචාරවත් පාලනය, සදාචාරය, බිය හා සැකය, සාහසාදී මානසිකත්වය** ආදී දුර්විපාකවලට මුහුණ දීම පෙන්වා දිය හැකිය. සම්පත් විනාශය නිසා රට ආර්ථික වශයෙන් විශාල පසුබෑමකට ලක්වේ. රටේ සියලුම අංශයන්ගේ පිරිහීමක් ඒ තුළින් සිදුවේ. මේ නිසා යුද්ධය ශාපයක් බව බුදු සමය පෙන්වා දී තිබේ. අජාසත් රජු වජ්ජි රාජ්‍ය ආක්‍රමණයට සූදානම් වූ මොහොතේදී ශාක්‍ය හා කෝලිය වංශිකයන් ජලය බෙදාගැනීම වෙනුවෙන් ආරම්භ කළ යුද්ධයේදී අහිතවූ විපාක බුදුරදුන් වදාළ සේක. යුද්ධය නොව සාමය තුළින් රටක් ඉදිරියට යා යුතු බව බෞද්ධ දේශනාවේදී පෙන්වා දී තිබේ.

කාමය හෙවත් තෘෂ්ණාවද අද අපි පෙළෙන ජාතිවාදයට ප්‍රධාන මූලබීජයක් බව මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රයෙන් පැහැදිලි කරගත හැකිය. "මහණෙනි, ආශාව හේතුකොටගෙන, ආශාව නිදාන කොටගෙන, ආශාව නිසාම රජවරු සමගද වාද විවාද කරති. කැත් කුලයෝ කැත් කුලයන් සමගම, බමුණෝ බමුණන් සමගද, සොහොයුරෝ සොහොයුරන් සමගද, සැමියා අඹුව සමගම වාද විවාද කරති. ගුටිබැටද හුවමාරු කරගනිති. දඬුමුගුරුවලින් ගහ ගනිති. මේ හේතු නිසාම මරණයටද පත්වෙති. කාමයන්ගේ ආදීනව මෙසේය. "මූලික වශයෙන් සන්තාන ගත මිනිස් සිතුවිලිවල ක්‍රියාකලාපය කෙසේද යන්න මෙයින් පැහැදිලි වෙයි. මූලික මිනිස් ස්වභාවයන් තේරුම් නොගැනීම මෙයට එක් හේතුවකි. ඒ හේතුවෙන් වාර්ගික මතභේද ප්‍රකට වෙයි. මෙහිදූ මූලික ස්වභාවය ලෙස අර්ථවත් වන්නේ මිනිසා තුළ නිසගයෙන්ම පවතින මානය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව වැනි හැඟීම්ය. මෙම හැඟීම් මානවයා තිරශ්චීන තත්ත්වයට පත්කිරීමට ගතවනුයේ ඉතා ස්වල්ප මොහොතකි.

දීඝ නිකායේ සූත්‍රයන්ට අනුවද ජනවාර්ගික ප්‍රශ්නයට පිළිතුරු සෙවිය හැකිය. එහෙයින් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ සිව් මහා ගංගාවන් මුහුදට ගලා ගොස් එකම ලුණු රසයක් ගන්නා හා සමානව සතර කුලයේම ප්‍රජාව එකම විමුක්ති රසයෙකින් යුක්ත වන බවයි. සියලුම ප්‍රජාවගේ ලේ එකම රක්ත වර්ණයෙන් යුක්තය.

මේ අනුව මිනිසුන් අතර බුද්ධ දේශනාවන්ට අනුව බෙදීම් වාදයක් නොමැත. "**සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ...**" සියලුම සත්වයෝ දඬුවමට බියවෙති. සැමොම ජීවිතයට ප්‍රිය කරති. තමන් උපමා කොට අනායන් නැසීම, ඝාතනය කිරීම නොකළයුතු බව පෙන්වා දෙයි. තමා මෙන්ම සෙසු අයත් ඒ අයගේ අවශ්‍යතාවයන් සපුරා ගනිමින් දිවිගෙවීමේ අයිතියක් ඇත. කෙනෙක් තව කෙනෙකුගේ මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කරයිද ඔහු ස්වකීය මානසික අයිතිවාසිකම්ද උල්ලංඝනය කරගනියි. මේ හේතුව නිසා තමන්ට සාපේක්ෂව අන් අය දෙස බලා අවබෝධයෙන් අපි හිමි තබන් නම් සියලුම ගැටුම් විසඳීම එතරම් අපහසු නොවන්නේය.

**රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍ය වැලිවිටියේ ඉන්දවිමල හිමි**

"යහඩයෙන් නැගුණු මලකඩ ඒම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

මධ්‍ය සංස්කෘතික අරමුදල - ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridaladamaligawa.lk

## දස පාරමිතා පුරමු

[illegible]



# දියුණුවේ දොරටු මෙන්න

"ආරෝග්‍යාමිච්ඡේ පරමඤ්ච ලාභං
සීලඤ්ච බුද්ධානුමතං සුතඤ්ච
ධම්මානුවත්ති ච අලීනතා ච
අත්ථස්සද්වාරා පමුඛා ඡළෙතේ"

[illegible]

### අත්ථස්සද්වාර - දියුණුවේ දොරටු

[illegible]

### ආරෝග්‍යාමිච්ඡේ පරමඤ්ච ලාභං

[illegible]

### සීලං

[illegible]

### බුද්ධානුමතං


[illegible]

### සුතං

[illegible]

පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හිමි

"අපවලා මට බැන්නේය, මට ගැසුවේය, මා පැරදවූයේය, මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිද් ද ඔවුන්ගේ වෛරය නොසංසිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)



ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 150 වැනි ගුණ සමරුව නිමිත්තෙනි

# සිංහලයින් අවදිකොට බුද්ධගයාව බේරාගත් කේසර සිංහයා

මෑත යුගයේ ලංකා මාතාවගේ ශ්‍රේෂ්ඨතම පුත්‍ර රත්නයක් වූයේ අනගාරික ධර්මපාලතුමාය. දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමාගේ සහ මල්ලිකා මැතිනියගේ වැඩිමහල් පුතණුවන් ලෙස 1864 සැප්තැම්බර් 17 වන දින එතුමන් උපත ලැබීය.

ළමා වියේදී ප්‍රබෝධයෙන්ම හැදී වැඩුණු ඩේවිඩ් හේවාවිතාරණ කුමරුන් ගල්කිස්ස, ශාන්ත තෝමස් විද්‍යාලයේද අධ්‍යාපනය ලැබීය. ළමා අවධියේ සිටම එවිතර ගුණයෙන් සපිරි ඩේවිඩ් හේවාවිතාරණ තුමා, පරගැති සිරිත් පිළිකුල් කළ බුදු දහම කෙරෙහි දැඩි ඇල්මක් දක්වූ දේශීය සිරිත් විරිත්වලට ගරු කළ කැපී පෙනෙන තරුණයෙකු විය.

බටහිර ජාතීන්ගේ ආධිපත්‍යයට යටත් වූ පරාධීන ජාතියක් වශයෙන් සියවස් හතර හමාරක් පමණ සිය උදාර උරුමය විනාශ වෙද්දී ජාතිකාමත්වයේ විශිෂ්ටතම හෙළ වීරයන් සිය මග ගනිමින් තම නාමයත්, යුරෝපීය ඇඳුමත් වෙනස් කොට සිංහල දේශයත්, බුද්ධාගමත් අභිවෘද්ධිය පිණිස උද්යෝගයෙන් ක්‍රියා කළේය.

මෙම වකවානුව වන විට බුද්ධාගම හා පෙරදිග භාෂා පිළිබඳව අවබෝධයක් ඇති වෙමින් පැවතිණි. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ "පානදුරා වාදය" පිළිබඳ කිතුගොස ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර රටවල් දක්වා පැතිර ගොස් තිබිණ. "පානදුරා වාදය" පිළිබඳ පැහැදුණු ඇමෙරිකානු ජාතික කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා මෙරටට පැමිණ බුදු දහම නගාසිටුවීමට රට පුරා බෞද්ධ පාසල් පිහිටුවීමට කටයුතු කරමින් සිටින අවධියේ එතුමා සමග එක්වූ ධර්මපාලතුමා ලක්දිව පුරා ගම්මානයකම පාසා දේශන පවත්වමින් ජනතාව දැනුවත් කිරීමේ මෙහෙවරක නිරත විය. එතුමා ගමන් ගත් මෝටර් රථයේ 'මත් බොන්නා වසලයා', 'හරක් මස් කන්නා රොඩියා' යනුවෙන් පුවරු දෙකක් සවිකර තිබිණ.

ගිහි සැපත් අතහැර අනගාරික ජීවිතය පටන් ගත් ධර්මපාලතුමාට වයස අවුරුදු 26 දී පමණ ප්‍රථම දඹදිව වන්දනා ගමන යාමට භාග්‍යයක් උදාවිය. මේ පිළිබඳව එතුමාගේ දින පොතේ මෙසේ සඳහන් කර තිබේ.

"1890 දෙසැම්බර් මස ගුණරත්න කොජෝන් නම් භික්ෂුව කොළඹින් බෙනාරස් වන්දනාවට වඩින බව දැන ගන්නට ලැබී උන් වහන්සේ කැටුව යාමට මට සිතක් පහළ විය. ධාර්මික මාපියාණන්ගේ විසඳුමින් මම උන්නාන්සේ කැටුව කොළඹින් පිටත්ව මදුරාසියේ අඩියාර් ශාලාවට පැමිණ ඕල්කට්තුමාගේ මිතුරුකම පිට එහි කීප දවසක් නැවතී, 1891 ජනවාරි මස 20 දින බරණැස ඉසිපතනාරාමයට පැමිණ එහි පරාජිතව වූ චෛත්‍යය වැඳ ජනවාරි මස 22 දින බුද්ධගයාවට සම්ප්‍රාප්ත වීමි.

සම්මා සම්බෝධි ප්‍රාප්තිය පිණිස මහා පුරුෂ ශාක්‍යසිංහ කුමාරයාණන් වැඩසිටින අපරාජිත පර්යංකයට පැමිණ දණ නමා ඇඳිලිකර්ම කොට තථාගතයන්ගේ ගුණ අනුස්මරණය කරමින් තලල වජ්‍රාසනය මස්තකයෙහි තැබූ කෙණෙහිම මසිත් ප්‍රීතියෙන් බරවී, සංවේගයෙන් පිරී ගොස් මේ උතුම් ස්ථානය අත්නොහරිමි යන අධිෂ්ඨානයෙන් මාගේ ජීවිතය බුදුරජාණන් වහන්සේට පූජා කළෙමි" (අනගාරික ධර්මපාලතුමාගේ දිනපොතේ සටහනකින් උපුටා ගන්නා ලදී)

ධර්මපාලතුමා බුද්ධගයාවට යන විට කෘෂ්ණ දයාල්ගිරි මහන්තා නැමැත්තෙක් විසින් බුද්ධගයා මහා විහාරය, වජ්‍රාසනය, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අත්පත් කරගෙන තිබුණි. වජ්‍රාසනය මත වැඩසිටින පිළිම වහන්සේට රතු රෙදි අන්දවා, පොට්ටු තබා, කවුන්තන් පළඳවා හින්දු දේවතාවෙකු ලෙස පුද පූජා පවත්වමින් තිබූ අතර, හින්දුන්ට හැර වෙනත් කිසිම කෙනෙකුට ඇතුළු වීම තහනම් කොට තිබී ඇත.

## මහාබෝධි සමාගම

ඇතිවූ මහත් සංවේගයෙන් යුතුව කෙසේ හෝ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙත ගොස් සතිපට්ඨාන සූත්‍රය දේශනා කොට අධිෂ්ඨාන කරමින්, කෙසේ හෝ තම ධනය තම ශ්‍රමය වැය කර, ජීවිතය සම්පූර්ණයෙන්ම කැපකොට බුද්ධගයාව ඇතුළු අනෙකුත් බෞද්ධ සිද්ධස්ථාන රැකගන්නා බවට ප්‍රාර්ථනා කළේය.

එතුමාගේ සටන් පාඨය වූයේ 'සිංහලයනි නැගිටිව්, බුද්ධගයාව බේරා ගනිව්' යන්නයි. මහන්තා ඇතුළු මහන්තාගේ මැර පිරිසත්, ඉංග්‍රීසි පාලක පිරිස ඇතුළු බොහෝ සතුරන් මැද ධර්මපාලතුමා කළ සටන සුළුකොට තැකිය නොහැකිය.

1892 ජනවාරි මහාබෝධි සමාගමද, අගනුවර මහාබෝධි සමාගමද, කල්කටාවේ මහාබෝධි සමාගමද පිහිටුවීය. එම වසරේම 'මහාබෝධි' ඉංග්‍රීසි සඟරාවද, සිංහල බෞද්ධයා පුවත්පතද ආරම්භ කළේය. 1894 දී නැවත ලංකාවට පැමිණ ගම්දනව් පුරා ඇවිදිමින් මුදල් එකතු කර බුද්ධගයා මහාබෝධි ගම මිලයට ගැනීම සඳහා මුදල් ආධාර එකතු කළේය.

බුරුමය, සියම හා ලංකාවෙන් විශාල මුදල් ප්‍රමාණයක් එකතු කරගත් එතුමෝ බුද්ධගයාව බේරාගෙන බුදු සසුනට ඉමහත් සේවයක් ඉටු කළහ.

වර්තමානයේ මුළු ලෝකයාම බුද්ධගයා මහා විහාරය වන්දනාමාන කරන්නේ ධර්මපාලතුමාට පින්සිදු වෙන්නටය. එපමණක් නොව ලුම්බිණිය, සැවැත්නුවර, කෝසම්බි, කුසිනාරා, සංකස්ස, සාංචි ආදි බෞද්ධ සිද්ධස්ථාන බෞද්ධ ජනතාවට වන්දනාමාන කිරීමට අවස්ථාව උදාවී තිබෙන්නේ ද ධර්මපාලතුමාට පින් සිදුවෙන්නටය.

ආචාර්ය දි.මු. ජයරත්න
අග්‍රාමාත්‍ය, බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍ය

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

# ජීවමාන කාලයේ ධර්මපාලතුමන් ඇසුරු කළ වියතුන් ඔහු ගැන කී කතා



ධර්මපාලතුමා දිවමනව දුටු සිටි පුද්ගලයන් අතර පියසේන නිශ්ශංක (1890-1970) මහතාට හිමිවන්නේ සුවිශේෂී තැනකි. ගත්කතුවරයකු වූ නිශ්ශංක මහතා දිනමිණ හා සිළුමිණ පුවත්පත්වල ප්‍රධාන කර්තෘ පදවි දැරුවේය. 19 වැනි ශත වර්ෂයේ අවසාන භාගය ලක්මව හොඳ පුතුන් ගණනාවක්ම ලැබූ කාල පරිච්ඡේදයක් බව පවසා ඇති නිශ්ශංක මහතා ඒ දවස වැටී ගොස් සිටි සිංහල ජාතිය නගා සිටුවීමට වරම් ලැබ උපන් වීර පුතුන් හැටියට ඔවුන් සැලකිය හැකි බව පවසා ඇත. බොහෝ දෙනා ගණන් ගෙන තිබෙන හැටියට ඔවුනතරෙහි පළමුවැනි තැන හිමිවන්නේ අනගාරික ධර්මපාලතුමාටය. මෙවැනි වේගවත් පුරුෂ සිංහලයකු තමාගේ ජීවිත කාලය තුළදී දුටු හැකි බව ඔහු පවසා ඇත.

'ජාතිය නගා සිටවූ ප්‍රතාපත් සිංහලයා' මැයෙන් 1957 ජනවාරි මස 6 වැනි ඉරිදා සිළුමිණ පත්‍රයට දිනමිණ පත්‍රයේ ප්‍රධාන කතුවරයා වශයෙන් ලියූ ලිපියකින් මේ අදහස් හෙළි වෙයි. එහි එතුමාට මුලින් 'අනගාරික' නම ලැබුණු හැටි මෙසේ ද සඳහන් වෙයි.

'අනගාරික යන නම එතුමාට ලැබුණේ කාගෙන් කෙසේ දැයි දැන ගත් කී දෙනෙකු මෙරටෙහි සිටිත් දැයි නොදනිමි. එය එතුමාට මෙරටේ දී මෙරට කිසිවකුගෙන් ලැබුණු නමක් නොවේ. එතුමාට ඒ නම ලැබුණේ 1893 දී ඇමෙරිකාවේ චිකාගෝ නුවර පවත්වන ලද සුප්‍රසිද්ධ දෘෂ්ටි සම්මේලනයට බෞද්ධ නියෝජිතයා හැටියට ගිය අවස්ථාවෙහි ඇමෙරිකාවේදීය.'

නිශ්ශංක මහතා කියන හැටියට උතුරු සළුව පෙරවාගෙන දෘෂ්ටි සම්මේලනය සභා වේදිකාවෙහි නැගී සිට සාළුකාය ඇති මේ ප්‍රතාපවත් සිංහලයා කතා කරනවිට "ජේසුස්තුමා ලොව පහළව කතා කරති" යි ප්‍රීති ඝෝෂාවක්ද සභා ගැබින් නිකුත් වී යැයි කියනු අසා ඇත. ධර්මපාලයන්ට මුලින් භාවිතව "අනගාරික" යන නම එතුමාට ලැබුණේ මේ දෘෂ්ටි සම්මේලනයට ගිය ඉන්දියානු නියෝජිතයන්ගෙන් බව ඔහු පවසා ඇත.

ධර්මපාලතුමා , ජේන්, කැතරින්, මේබල්, මේරියා වැනි ගැහැනුන්ට දැමූ නම්ද ජෝන් - කැරොලිස් ජේදින් වැනි පිරිමි නම්ද ගැන සම්මච්චල් සහගතව කතා කළ බව ඔබ අසා ඇත. වරක් තම මස්සිනා වූ නීතිඥ ජේකබ් මුණසිංහ මහතා පෙන්නා මේ ඉන්නේ ජාකොබ් යැයි කියා ඇත.

හාමුදුරුවන් බුලත් විට කා පඩික්කම්වලට කෙළ නොගසා පා කෙළ ගසන්නේ කොහාට දැයි සමහර හාමුදුරුවරු ධර්මපාලතුමාගෙන් අසා ඇත්තේ "අපට එතුමා බණිනවා" යන අවලාද නගමින් බව පවසා ඇති නිශ්ශංක මහතා එක් නිදර්ශනයක් දක්වා ඇත.

ආනන්ද විද්‍යාලයේ පවත්වන ලද එක් රැස්වීමකදී ධර්මපාලතුමාගේ කතාවෙන් පසු නැගී සිටි එකල කවියකු වූ සැර වැර ගති ඇති තලාවේ දේවානන්ද හිමි මුහුණ ඉදිරියේදීම "ධර්මපාල උන්නැහේ ගිය ගිය තැනදී "අපට බණිනවා" යි දෙස් කියන්නට ලැස්ති වූ තමුන් මුලසුනෙහි සිටි සභාපතියට කැමැති ඩබ්ලිව්.ආතර් ද සිල්වා මහතාත්, කච්චර සාරානන්ද නායක හාමුදුරුවන් වහන්සේ ඇතුළු තව ස්වාමීන් වහන්සේලාත් එයට ඉඩ නොදී වළක්වා ඇත.

ඩබ්ලිව්.ආතර් ද සිල්වා මහතාට ධර්මපාලතුමා කළ වැඩක් ගැනද පියසේන නිශ්ශංක මහතාට මතක ඇත. ඒ ආතර් ද සිල්වා මහතා කොළඹ නගරයේ පශු වෛද්‍යවරයාව සිටි කාලයේය. නගරයේ මරණ හරක් මරන්නට පාස් කළේ ඒ මහතාදැයි නිශ්ශංක මහතා නොදන්නා බව පවසා ඇත. නමුත් කොළඹ නගරයේ පශු වෛද්‍යවරයාව සිටි නිසා ධර්මපාලතුමා එතුමාට "ගොඝාතක

කර්මාචාර්ය" කියා පත්‍රයෙහි ලියා තිබූ නිසා ඒ පත්‍රය පළ වූ දවසේම ආතර් ද සිල්වා මහතා ඒ රාජකාරියෙන් ඉල්ලා අස්වී ඇත.

අනගාරික ධර්මපාලතුමා දඹදිව ඉසිපතනයේ දී ජන්මාන්තරගත වූ 1933 වූ අප්‍රේල් 29 වෙනි දින මේ සංවේගජනක පුවෘත්තිය ලක්දිව පළමු කොට පළ වී ඇත්තේ කොළඹ සතක් දිග ලොකු "සිරියා" අකුරෙන් යුතු මිනාකා පාඨය ඇතිව "සිළුමිණ" පත්‍රයේ පළමුවෙනි පිටුවෙහිය. එකල සිළුමිණ පත්‍රයේ ප්‍රධාන කර්තෘවරයාව සිටියේ පියසේන නිශ්ශංක මහතාය.

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්නුත් අනෙකුත් පුද්ගලයන් අතර ඇති වූ ඇතැම් දෙබස් ඛණ්ඩ අතශන්තයෙන්ම රසවතුන් පිනවන බව අනික ලේඛකයකු හා අදීන පුවත්පත් කතුවරයකු වූ හේමපාල මුනිදාස මහතා පවසා තිබේ.

"ධර්මපාලතුමා සහ අප්පු සිංඤෝ" ගැන මේ කතාව හේමපාල මුනිදාස මහතා සුපුරුදු උපහාස රසයෙන් ඉදිරිපත් කර ඇත්තේ මෙසේය.

"සිය ගෙයත් ඉඩමත් උගස් තබා ලේ මාපිල් ගණයට අයත් වන ධන හිමියෙකුගෙන් ලබා ගන්නා ලද රුපියල් දෙසීය අවුරුදු කීපයක් ඇතුළත හාරසීයක් බවට පත්වී ගෙයත් ඉඩමත් අත්සතු සන්තකව තමන් හට මිගට පන්වන්නට සිද්ධ වන බැව් දුටු අප්පු සිංඤෝ දින ගණනක්ම ගත කළේ දුක්ඛිත ජීවිතයකි. තමන්ටත් තම දරු පවුලටත් පන්වන්නට යන මේ දරුණු ඉරණම තම සගයන්ටත් සෙසු බොහෝ දෙනෙකුටත් ඔහු පැවසුව නමුත් ධර්මපාලතුමාණන් හට එපවත් සැලකිරීමට ඔහු එඩිතර නොවූයේය.

"නියපන් ගෝඨයෝ කියාපන්! හිඟිල්ලා වැඳ නමස්කාර කරලා හාමුට (ධර්මපාලතුමාට) කියාපන්" යැයි මහබෝධි යන්ත්‍රාලයේ කතෘධිකාරීන් කීප දෙනෙක් අප්පු සිංඤෝට අවවාද කළහ.




ලබන ලද මේ අවවාදයෙහි පරිද්දෙන් කුදු රෙද්දකිනුත් සුදු බැනියමකිනුත් සැරසුණු අප්පු සිංඤෝ පසු දින උදේ කාලයෙහි අනගාරික ධර්මපාලතුමන් හමුවට ගොස් මුලින් අතක් පිටිනම නමස්කාර කොට එකත්පස්ව සිටියේය.

"අප්පු සිංඤෝ මොකෝ" මහා පුරුෂයා විචාළේ මෙපමණකි.

ගරුමාන බහුමාන සහිතව සිටිමින් අප්පු සිංඤෝ තම දුක විස්තර කළේය. නමස්කාර පෙරටුව රුපියල් හාර සියයක ඉල්ලීමක් ද කළේය.

"රුපියල් හාර සියයක් හුම්"

ධර්මපාලතුමන් කල්පනා සහිතව පවසා

"උඹ පසලොස්වකට අටසිල් හෙම ගන්නවාදැයි" යි අප්පු සිංඤෝගේ පැහුණු කෙස් රැවුල් දෙස බලමින් විමසුවේය.

"නැහැ හාමුදුරුවනේ!" යැයි ඔහු ශීර්ෂ ප්‍රණාමයෙන් යුක්තව කීවේය.

"උඹ බණ දහම් ඉගෙන ගෙන තියෙනවද?"

"ඒ කාලේ ඉතින් පිරිවෙනේ දී ඉගෙන ගත්ත හරියක් තමයි"

"උඹ නිදාගන්න යනකොට තිසරණ පන්සිල්වත් සමාදන් වෙනවද?"

"කොහොමද හාමුදුරුවනේ? මහන්සි වෙලා ගියාම කාල බීලා වැටිලා නිදා ගන්නවා"

"හුම්! පෝයදට උඹ පන්සල් යනවාද? තුනුරුවන් වඳිනවාද?"

"කොහෙත්ද හාමුදුරුවනේ ඒවට වෙලාවක්"

"උඹ බෞද්ධයා පත්‍රය කියවනවාද?

මිගේ දැන ගත යුතු කරුණු කියවනවාද?"

"පත්තරය අරන් හිඟිල්ලා කොල්ලන්ට දෙනවා. මට ඉතින් කියවන්න වෙලාවක් ලැබෙන්නේ නෑ"

"හුම්! උඹ නිකම් ඔය තුන් සරණේවත් කියවන්නේ නැද්ද?"

"බොහොම පුංචි කාලේ කියවලා තියෙනවා"

"හුම් ! උඹට දරුවෝ කී දෙනෙක් ඉන්නවාද?"

"එකොළොස් දෙනයි"

මෙපවත් ඇසූ කෙනෙහිම ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාණන්ගේ හිස ගැස්සුණේය. මුව ඇරුණේය. දෙනෙතින් කෝපාග්නියක් නික්මුණේය. අඩක් හුනස්නෙන් නැගුණේය.

"වල් අලියා, ගොන් තඩියා! උඹ අටසිල් ගන්වත් එපා. පන්සිල් ගන්වත් එපා. බණ දහම් අහන්වත් එපා. පොත පත කියවන්වත් එපා. ඌරා වාගේ වීසම් කරපන්" යැයි මිටිගුලිය සහිත අත ඇත් මැත් කරමින් දම්පල් හිමියෝ පවසා "පල!" යැයි අප්පු සිංඤෝ නෙරපා හැරිය.

එහෙත් ඔහුට ආශ්‍රමයෙහි වහල්තඩින් ඈත්වන්නට නොලැබිණ.

"මිය වල් අලියට එන්න කියාපන්" යැයි මොහොතකින් කෝපාග්නිය නිවාගත් ධර්මපාලතුමාණෝ අත වැස්සෙකුට පැවසූහ.

යළිත් අප්පු සිංඤෝ එතුමාණන් හමුවෙහි දක්නට ලැබිණ.

"ඉඳා ගොන් තඩියා! මේක ගනින්!" යැයි රුපියල් හාර සියයක චෙක්පතක් අප්පු සිංඤෝ අතට දෙමින් ධර්මපාලතුමාණෝ පවසා "වල් අලියත් විහාර පන්සලකට පලයන්. තිසරණ පන්සිල් ගනින්. පතක් පොතක් කියවාපන්. දැනගත යුතු කරුණු කියවාපන්" යැයි ඔහුට අවවාද කළහ.

තිස්සමහාරාමයේ දී උපත ලැබූ දීයෝග්‍ය ඔබතුරුගේ වෙට්ටිච් නොහොත් මහා පතු කලාවේදී ඩී.බී. ධනපාල (1905-1971) පාසල් ඉගෙනීමෙන් පසු කුලුස්වැල්ලේ නැන්ද කෙනෙකු හා මාමා කෙනෙකු හාරයේ සිල්ලර කඩයක නානා විද සේවාවන්හි යෙදී සිටියදී අනගාරික ධර්මපාලතුමා ගැන අසන්නට ලැබී ඇත. "සිංහල බෞද්ධයා" පුවත්පතේ ධර්මපාලතුමන් ලියූ ලිපි කුප්පි ලාම්පු එළියෙන් කියවූ සත් හැවිරිදි වියේ සිටි කුඩා වෙට්ටිච් ගාල්ලේ කුලුස්වැල්ලේ කඩපළේ දී ධර්මපාලතුමන්ගේ දේශනයකට සවන් දීමට අවස්ථාව සැලසුන බව පැවසේ. ඩී.බී.වෙට්ටිච් යන නාමය ඩී.බී. ධනපාල බවට පත්වූයේ එකී දේශනයෙන් පසු බව ඔහු Hmong Those Present කෘතියේ ධර්මපාලතුමන් ගැන ලියූ ලිපියේ සඳහන් කරයි.

මෙරට විසූ විශිෂ්ට චිත්‍ර ශිල්පියකු වූ ජී.එල්. ගොතමදාස මහතා විසින් පුවත්පතක් සඳහා අඳින ලද චිත්‍රයටද විශේෂ කැනක් හිමිවෙයි.

ගොතමදාසයන් ධර්මපාලතුමන්ගේ එම චිත්‍රය ඇඳීමට ගිය අවස්ථාවද රසවත්ය.

"ධර්මපාලතුමනි, මට ඔබතුමා බලාගෙන චිත්‍රයක් අඳින්න අවසර ලබා ගන්නයි ආවේ..."

අනගාරික ධර්මපාලතුමා අසලට පැමිණි තරුණයෙක් යටහත් පහත්ව එකත් පස්ව සිට ඇසුවේය.

ධර්මපාලතුමා මේ ගැටයා දෙස තියුණු බැල්මක් හෙළුවේය.

"උඹ කෙළින්ම මා ළඟට ඇවිත් මෙහෙම ඇසීම ගැන මම සතුටු වෙනවා. උඹේ වයස කොපමණද?"

"අවුරුදු විස්සට ලඟනන්"

"ගම කොහේද?"

"අම්බලන්ගොඩ පාදාදෙළ"

"උඹ උත්සාහවන්ත තරුණයෙක්. ඒ නිසා උඹට මගේ චිත්‍රයක් අඳින්න ඉඩ දෙනවා."

"එහෙමයි"

තරුණයා බිම ඉඳගෙන චිත්‍රයක් ඇන්දේය. ඔහු වරින් වර ධර්මපාලතුමා දෙස බල බලා චිත්‍රය ඇන්දේය. චිත්‍රය නිම කළ ඔහු යටහත් පහත්ව චිත්‍රය ධර්මපාලතුමාට පෙන්වූයේ ගෞරව පෙරදැරිවය.

"හරිය පන්කාදුයි. උඹට හොඳ අනාගතයක් තියෙනවා. මොකක්ද උඹේ නම?"

"ජී ඇල් ප්‍රනාන්දු"

"සම්පූර්ණ නම"

"ගංවෙර ලවිනේරිස් ප්‍රනාන්දු"

"වහාම උඹ නම වෙනස් කරන්න ඕනෑ, තේරුණද?"

"එහෙමයි"

"අද ඉඳලා උඹ ගොතමිදස"

"එහෙමයි"



ගොතමිදස මහතා 1928 වර්ෂයේ ධර්මපාලතුමන්ගේ පිළිරුවක් නිර්මාණය කොට කලා ප්‍රදර්ශනයකදී මුල් තැන දිනා ඇත. ඒ වන විට බරණැස සිටි ධර්මපාලතුමා ගොතමිදසයන් කල්කතාවට ගෙන්වා චිත්‍ර කලාව ඉගෙනීමට උදව් උපකාර කළේය. ධර්මපාලතුමන්ගේ අප ඉහත කී ගොතමිදසයන් කළ පසුබිම්ක අඳින ලද රේඛා චිත්‍රය බොහෝ බෞද්ධ ගෙවල්වල රාමුකොට විරාජමානව අදටත් වැජඹෙයි.

ධර්මපාලතුමාගේ ශත සංවත්සරය නිමිත්තෙන් මහාබෝධි සංගමය මගින් 1964 පළ කරන ලද සඟරාවේ "සිංහල බෞද්ධයා" පත්‍රයේ කර්තෘ රාජා වී. ජිනනායක මහතා මහා බෝධි සංගමය බිහි කිරීමට ධර්මපාලතුමන් කළ කැපවීම මෙසේ විස්තර කොට ඇත.


"මාලිගාකන්දේ වික්ටර් හවුස් නම් මන්දිරය හා තවත් ගෙවල් සහිත ඉඩම රු. 84,000 කට මිලයට ගෙන එයින් ලැබෙන ආදායම මහා බෝධි සමාගමේ ශාසනික කටයුතුවලට යෙදවීය. අද ආනන්ද බාලිකා විද්‍යාලය පවත්වාගෙන යන්නේ එතැනය. දැනට "සිංහල බෞද්ධයා" කාර්යාලය පිහිටුවා තිබෙන මහා බෝධි මන්දිරය එතුමා රු. 34000 කට මිලයට ගන්නා ලද ගෙයකි. කණ්ඩායම් වශයෙන් දඹදිව වන්දනා ගමන් ආරම්භ කළේද එතුමාය.

අනගාරික ධර්මපාලතුමන් ගැන බොහෝ ලිපි ලේඛන දහස් ගණනින් පළවී ඇත. පොත පත්, අපදාන කාව්‍ය රැසක්ද පළ වී ඇත. එතුමාගේ ගුණ අපරිමිත සේවාව තව සත වර්ෂ ගණනාවක් යුගයෙන් යුගයේ ඒවී පිළිරුව දෙනු ඇත.

**ඒ.ඩී. රන්ජිත් කුමාර**



"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - [illegible]"



දළදා වරුණ

# සංරක්ෂණශීලී පරිහරණයක ඇති වැදගත්කම

බුද්ධ කාලීනව දිවිපෙවෙතක් ගෙවන අයද නැත්තේම නොවේ. එවුන්හත් එපවත් සුනඛයන් මෙන් මැරෙන්නවුන් ලෙස හඳුන්වා ඇත. මේ අනුව සම්පත් සංරක්ෂණශීලී බවත් අවශ්‍යතා සංතෘප්තියත් හිමි පරිදි සිදුවිය යුතු බව බෞද්ධ ස්ථාවරයයි. ආර්ථිකයක් ගොඩනැගෙන්නේ සැණෙකින් නොවේ. ක්‍රමානුකූලවය. බඹරෙකු මෙන් (අනුන් නොපෙලා) ධනය රැස්කරන්නහුගේ ධනය තුඹසක් ක්‍රමයෙන් බැඳිනු ලබන්නා සේ වැඩීමට පත් වෙයි. මේ ආකාරයෙන් ධනය උපයන වාසය කරන්නට සුදුස්සෙක් පුද්ගලයා ගිහි ජීවිතයක වෙයි. ධන සංරක්ෂණ පිළිබඳ සිව්වැදෑරුම් ප්‍රතිපත්තියද මෙහිදී විශේෂ වේ.

කාමභෝගී ජීවිතය සුවපත් කරලීමට ආර්ථිකයක අවශ්‍යතාව අමතක කරලිය නොහැකිය. එබැවින් බුදු සමය නිෂ්පාදන බෙදාහැරීම පරිභෝජනය යන අංශ තුනටම අදාළව ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශයක් කර තිබේ. ධනෝපායනය ධාර්මික විය යුතු සේම එහි සුරක්ෂිතභාවය පිළිබඳව සැලකිලිමත් වීම බුදු දහමෙහි විශේෂයෙන් හඳුන්වා ඇත. ව්‍යග්ඝපජ්ජ සූත්‍ර දේශනාව එය ආරක්ඛ සම්පදාව ලෙස පැහැදිලි කොට ඇත.

ඉධ ව්‍යග්ඝපජ්ජකුලපුත්තස්ස භෝගා හොන්ති උට්ඨාන විරියාධිගතා බාහාබලපරිචිතා සේදාවක්ඛිත්තා ධම්මිකා ධම්ම ලද්ධා තෙ ආරක්ඛෙන ගුත්තියා සම්පාදේති........

මේ ලෝකයෙහි කුලපුත්‍රයෙකු හට උත්සාහයෙන්, වීර්යයෙන්, බාහුබලයෙන්, ඩාදිය හෙලා උපදවන ලද ධාර්මික ලද භෝගයක් වේනම් මාගේ භෝග සම්පත් රජවරු පැහැර නොගනිත්ද, සොරු පැහැර නොගනිත්ද, ගින්නට හසු නොවේද, දියෙහි ගසාගෙන නොයේද, අප්‍රිය නෑයෝ නොගනිත්ද යනුවෙන් කල්පනා කොට සංරක්ෂණය කොට තබයි. එය ආරක්ඛ සම්පදාව නම් වේ.

යථෝක්ත කාරණය මගින් උත්සාහය සහ දැහැමිව උපයාගත් ධනය විධිමත් පරිභෝජනයට ලක් කරන පුද්ගලයා එය එසේ සංරක්ෂණය කරගත යුතු ආකාරය ඉතා නිරවුල්ව මේ දේශනාවෙන් ප්‍රකාශ වේ.

මේ අනුව ආර්ථිකයේ සුරක්ෂිත බව කෙරෙහි සැලකිලිමත් වන්නේ නම්, පවුලක සමෘද්ධිය මෙන්ම රටක සමෘද්ධියද අඩු නොවේ. දියුණුව දිගුකල් පවතී. එය නොසිරිහි දිගින් දිගටම පවත්වා ගත යුත්තකි. ආර්ථික සුරක්ෂිත බව කෙරෙහි සැලකිලිමත් වීමේදී අවධානය යොමු කළ යුතු කරුණු ගණනාවක් තිබේ.

- **විනාශ වූ සම්පත් කොටසක් වේ නම්, නැවත උපයා ගැනීය යුතුය. (නට්ඨං ගවේසන්ති)**
- **දිරූ යම් කිසිවක් වේ නම්, තවත් දිරාපත් වන්නට ඉඩ නොදී ප්‍රතිසංස්කරණය කළ යුතුය. (ජිණ්ණං පටිසංඛරෝති)**
- **සම්පත් සහ අවශ්‍යතාවයන්ගේ සීමාවන් දැන පරිභෝග කළ යුතුය.(පරිමිත පාන භෝජනා)**
- **සුසිල්වත්, අනලස්, දූරදර්ශී ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් කුලයෙහි ප්‍රධානත්වය දැරිය යුතුය. (සීලවන්තං ඉත්ථිං වා පුරිසං වා අධිපච්චේ ඨපේති)**

සංරක්ෂණශීලී පරිභෝජනයක වටිනාකම සහ අවශ්‍යතාවය බුදු දහම සැම විටම අගය කෙරේ. බුදු දහම් අනුදත් පිළිවෙළ නම්, සමජීවිකාවයි. එනම්, ආදායමත්, වියදමත් පිළිබඳ අවබෝධයෙන් සහ එකිනෙක හොඳින්බවා සම්පත් පරිභෝජනය කළ යුතුය. දිඹුල් ගෙඩි ආහාරයට සුදුසු ඒවා පමණක් තෝරා නොගෙන ලපටි ගෙඩි ප්‍රමාණයක් අපතේ දමන්නාක් මෙන් පරිභෝජනය නොකළ යුතුය. අය වැය පිළිබඳ සමතුලිතතාවය මෙමඟින් අවබෝධ කරගත යුතුය.

නූතන යුගයේ මහා පරිමාණ පරිභෝජනය මේ ලක්ෂණයන්ගෙන් යුක්ත වේ, තවත් සමහරෙක් අඩු ආදායමෙන් උදාර දිවියක් ගෙවන අයුරුද දක්නට ලැබේ. එසේම වැඩි ආදායමක් ඇතිව

උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා යන සිව්වැදෑරුම් ප්‍රතිපත්තියද මෙහිදී විශේෂ වේ.

ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයෝජයේ
චතුත්ථං ච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති

රාසිය සූත්‍රයෙහි එන පරිදි කාමභෝගී පුද්ගලයෙකු ආර්ථිකය සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ නම්, එය ප්‍රශංසාර්හ කරුණක් බව සැලකිය යුතුය. ධනයේ ප්‍රධාන කාර්ය ජීවන අවශ්‍යතා සපුරාලමින් සුවපත් වූ ජීවිතයක් පැවැත්වීමයි. තමාට ධනයක් ඇතැයි ලබන ලද අස්වැසිල්ල අත්ථිසුඛ නම්වේ. සම්පත් පරිභෝග කිරීමත්, පුණ්‍ය කටයුතු කිරීමත්, ඇතුළත් වන්නේ භෝග සුඛයට ය.

පත්තකම්ම සූත්‍රයෙහි ධනය වියදම් වන අංශ හතරකි.

- තම මව්පියන් අඹුදරුවන් කම්කරුවන් මිත්‍රයන් යන කොටස්වල සුඛ විහරණය
- සමාජීය හෝ ස්වභාවික හෝ හේතූන් මත සිදුවන ධනහානි ආපදාවලට මුහුණදීම
- ඥාතීන් ආගන්තුකයන් මිය ගිය කල අදාළ අංශවලට අවශ්‍ය කාරණයන් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීම
- ශ්‍රමණ බ්‍රාහ්මණයන් සඳහා පහසුකම් සැලසීම

මේ අපේක්ෂාවන් සම්පූර්ණ වන ලෙස ධනය පරිහරණය වේනම් එය අදාළ කාර්යයන්ට ධනය වැය කිරීමකි. පැමිණිය යුතු තැනට ධනය පැමිණීමකි. ධනය පිළිබඳ යුක්ති සහගත පරිභෝජනය විනුයේද එයයි. ධනය පුද්ගලයෙකු වටා පමණක් ඒකරාශී වීම යුක්තිගරුක නොවේ. මේ අනුව සංරක්ෂණශීලී පරිභෝජනය සමග සම්පත් මනා පරිහරණය පවුලක මෙන් ම රටක ලෝකයක වටිනාකම බොහෝ කලක් රඳවා තබා ගැනීමට මහත් රුකුලක් වේ.


**මහනුවර ශ්‍රී සංඝරාජ මහ පිරිවෙණෙහි
ආචාර්ය රාජකීය පණ්ඩිත පූජ්‍ය කඹුරව සුමනානන්ද හිමි**




"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"

26

# අණ්ඩභූත ජාතකයෙන් හෙළිවන
# ස්ත්‍රියක් තම පතිවත් සීලය බිඳගත් අයුරු

අසරණ සරණ වූ, සියල් සතුනට ශාන්තිකර වූ තුන්ලොවට නායක වූ, උතුම් නිවනට මග හෙළිකළා වූ, අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩසිටින සමයෙහි උකටලීව විසූ එක්තරා භික්ෂුන් වහන්සේ නමක් අරභයා මෙම අණ්ඩභූත ජාතකය දේශනා කොට වදාළ සේක.


අප බුදුපියාණන් වහන්සේ ඒ උකටලී භික්ෂුවගෙන් ඔබ උකටලීව සිටිනා බව සැබෑවක්දැයි විමසූ සේක. එවිට එය සැබෑවක් බව කී භික්ෂුන් වහන්සේ, අමතා "මහණ ස්ත්‍රීහු නම් රක්ෂා නොහැක්කේමය. පෙර එක් නුවණැත්තෙක් ස්ත්‍රියක ගර්භයෙහි පටන් රැකගැනීමට ක්‍රියාකළේ වී නමුත් රැකගත නොහැකි වූයේ" යැයි වදාරා, එම අතීත කථාව මෙසේ ගෙනහැර දක්වා වදාළ සේක.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රජ කරන කාලයෙහි අප මහ බෝසතාණන් වහන්සේ ඒ බ්‍රහ්මදත් රජුන්ගේ අගමෙහෙසියගේ කුසෙහි පිළිසිඳ, වැඩිවියට පැමිණ, සියලු ශිල්පයන් දැන ඉගෙන ගත්තේය. එතුමා පිය රජුගෙන් පසු රජකමට පත්වී දැහැමෙන් සෙමෙන් රාජ්‍යය විචාළේය. ඒ බෝධිසත්ව රජතුමා තම පුරෝහිත බ්‍රාහ්මණයා හා සමග දු කෙළිමින් සිද,

"සබ්බා නදී වංකගතා සබ්බේ කට්ඨමයා වනා,
සබ්බිත්ථියො කරෙ පාපං ලභමානා නිවාතකෙ"

යන මේ ගීතිකාව කියමින්, රිදී පෝරුවේ රන්පසඟුට දැමීය. මෙසේ ක්‍රීඩා කරන්නා වූ ඒ රජ්ජුරුවෝ නිරන්තරයෙන්ම දිනති. පුරෝහිතයා පරදින්නේය. ඒ පුරෝහිත බමුණා සෙමෙන් තම ගෙයි සම්පත් නිමවන්නට පටන්ගත් විට මෙසේ සිතුවේය. මම මෙසේ නිරතුරුවම පරාජයට පත්වුව හොත් මගේ ගෙයි සියලු ධනය නැතිවී යන්නේය. එබැවින් කිසිදු පුරුෂයෙකුගේ ඇසුරට නොගියා වූ ස්ත්‍රියක සොයා ඒ ගෙයි වාසය කරන්නෙමැයි සිතීය. එසේම ඔහුට මෙබඳු සිතුවිල්ලක් ද පහළවිය. අන් කිසිදු පුරුෂයෙකු නොදුටුවා වූ ස්ත්‍රියක සොයා රැකගැනීමට නොපිළිවන. එනිසා කුසෙහි පිළිසිඳ ගත් තැන් පටන් එක් ස්ත්‍රියක රැකබලාගෙන සිට, ඒ පිළිසිඳගත් දැරුවා සිහි වී වැඩිවිය පැමිණි කල මගේ වසඟයේ තබාගෙන මටම නියත කොට ස්ත්‍රීන්ම යොදා රැකවල් තබා අන් කිසිදු පුරුෂයෙකු දැකීමට හෝ ඇසුරු කිරීමට නොසලස්වා පතිවත් සීලය මැනවින් රකින්නට යොමු කරවා, රජ්ජුරුවන්ගෙන් වස්තු දිනාගැනීම සඳහා දාදු කෙළියට යන්නේ නම් දිනිය හැකියයි සිතීය.

ඒ බ්‍රාහ්මණයා අඟපසඟ ලකුණු බලා අනාවැකි කීමෙහි දැනුමෙහි ද සමර්ථයෙක් විය. එනිසා ඔහු දුප්පත් ස්ත්‍රියක් ගැබිණි බව දැන, දුවක් වදන්නේ යැයි අංගලක්ෂණ විද්‍යාව අනුව දැන, ඇය තමන්ගේ සමීපයට කැඳවාගෙන ගොස් වැටුප් ගෙවා තම නිවසෙහිම තබාගෙන දරුවා ලැබුණු විට, ඇයට තවත් වස්තුව දී බමුණු ගෙයින් යවා ඒ ළදරු කුමරිකාව අන් පුරුෂයෙකු දැක්ක නොදී ස්ත්‍රීන් ලවාම පෝෂණය කරවා වැඩිවිය පැමිණි කල්හි ඇය තමා වසඟයෙහි තබා ගෙන අඹුකමෙහි තබාගත්තේය.



"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්දගුත්ත ජාතකය"



පුරෝහිත බමුණා ඒ කුමාරිකාව තමන් සන්තකයෙහි වැඩෙනතාක් කල්, රජු සමඟ දාදු කෙළියට නොගියේය. ඒ ස්ත්‍රිය තමන් වසඟයෙහි තබා ගෙන, වැඩිවිය පැමිණි පසු අනුකමෙහි තබාගෙන ඇය පිළිබඳ පරම විශ්වාසයෙන්ම සිට යළිත් රජු සමඟ දාදු කෙළියට ගියේය. රජපුරුවෝත් පුරෝහිතයාගේ ඉල්ලීමට කැමතිව පෙර පරිදි පුරෝහිතයා සමඟ දූ කෙළියට ගියේය. පුරෝහිත බ්‍රාහ්මණයා රජපුරුවන් ගායනා කොට රන්පසඇට දමන විට, මාගේ ස්ත්‍රිය හැර ගායනා කළ මැනවැයි කීය. එතැන් පටන් පුරෝහිත බ්‍රාහ්මණයා ජය ලැබිය. රජතුමා පැරදුණේය. රජපුරුවන් මොහුට එක් ස්ත්‍රියක විය යුතුයැයි පරීක්ෂා කරමින් ඇති බව දැන, ඇගේ පතිව්‍රතාධර්ම සිඳලිය යුතුයැයි සිතා එක් රාජපුරුෂයෙකු කැඳවා ගෙන්වාගෙන, පුරෝහිත බමුණාගේ ස්ත්‍රියගේ පතිව්‍රතා ධර්මය බිඳින්නට හැකිදැයි විමසිය. පිළිවනි ස්වාමීනි කී කල, ඔහුට වස්තු දී එය ඉෂ්ට කරන්නැයි කියා යැවිය.

ඒ දූත පුරුෂයා රජුගෙන් වස්තු ඇරගෙන සුවඳ සුණු, කපුරු, කතුල් ආදී නොයෙක් සුවඳ බඩු ගෙන ඒ පුරෝහිතයාගේ නිවසට නුදුරු තැනක සුවඳ බඩු සල්පිලක් පැළෙව්ය. පුරෝහිත බ්‍රාහ්මණයාගේ නිවෙසට දොරටු සතක් ඇත්තේය. හැම දොරටුවකම ස්ත්‍රීන් ලවා රැකවල් ලා තිබුණි. පුරෝහිත බ්‍රාහ්මණයා හැර අන් කිසිදු පුරුෂයෙකුට ගෙට ඇතුළුවීමට ඉඩ නොතැබීය, කසළ දමන්නා වූ පෙට්ටිය පවා පරීක්ෂා කොට ඇතුළට ගැනීම සිරිතයි. ඒ මාණවිකා කුමරියට අන් පුරුෂයෙක් දකින්නට නොලැබිණ.

මේ අතර මාණවිකාවගේ එක් පරිවාර ස්ත්‍රියක් සුවඳ මල් ආදිය මිලට ගෙන දූතයාගේ සල්පිල සමීපයෙන් යන්නීය. එකල ඔහු මැය හම් පතිව්‍රතා රක්නා ස්ත්‍රියගේ පරිවාර ස්ත්‍රියයැයි දැනගෙන, එක් දිනක් පරිවාරිකා ස්ත්‍රිය එනු දැක සල්පිලින් බැහැරට විත්, ඇගේ පාමුල වැටී, දෑතින් දෙපය තරකොට අල්වාගෙන, මෑණියෙනි, මෙතෙක් කල් මුළුල්ලෙහි කොයි සිටියේදැයි කියමින් හැඬුවේය. එකල ඔහුගේ අවශේෂ සහයකයෝ ද එක් පසෙක සිට මේ දෙදෙනාගේම අතපය මුව සටහනුත්, ගමනාගමනයත්, ආකල්පයනුත් එක හා සමාන බව කීවෝය. ඒ පරිවාර ස්ත්‍රිය බොහෝ දෙනා මෙසේ කියන විට, තමන් ද එසේම අදහාගෙන මේ මාගේ පුත්‍රයෙකැයි සිතා අඬන්නට වූවාය.

ඉන්ඉක්බිති ඒ රාජදූත පුරුෂයා මෑණියෙනි, දැන් ඔබ කොයි යන්නෙහිදැයි විමසිය. එවිට ඇය පුතණුවෙනි, මම කින්නරාංගිකාවකගේ විලාශය ඇති, රූපයෙන් අසහාය පුරෝහිත බමුණාගේ ළඳරු ස්ත්‍රියට උපස්ථාන කෙරෙමින් වාසය කරන්නෙමැයි කීවාය. මෑණියනි දැන් ඔබ කොහි යන්නේදැයි විමසිය. ඒ කුමාරිකාවට සුවඳ මල් ගන්නා පිණිස යන්නෙමැයි කීවාය. එවිට මෑණියෙනි, මෙතන මගෙන්ම සුවඳ මල් ගෙනයන්නැයි කියා, මුදල් නොගෙන බොහෝ මුලත්, කපුල්, කපුරු ආදිය හා නොයෙක් සුවඳ මල් ආදිය දුන්නේය. ඒවා අරගෙන පරිවාරිකාව ගෙට ආ විට ඒ මාණවිකාව, වෙනදාට වඩා ගෙනා සුවඳ මල් ආදිය දැක, මෑණියෙනි කිමෙක් ද? අද අපේ බමුණා අප කෙරෙහි ප්‍රසන්න වූයේදැයි විමසුවාය. එවිට පරිවාරිකාව බමුණා සුවඳ මල් ආදියට බොහෝ මිල නොදුන්න. මේ සුවඳ මල් ආදිය මගේ පුතණුවන්ගේ සුවඳ මල්සැලෙන් ගෙනෙන ලදැයි කීවාය. මෙසේ කියා එතැන් සිට බමුණා දුන් මිල තමන් ගෙන, ඒ දූතයාගෙන්ම සුවඳ මල් ආදිය ගෙනෑමට පටන් ගත්තාය.

ඒ දූතයා කීප දිනක් ගිය පසු ගිලන් වූ ආකාරයක් දක්වා නිදා සිටියේය. ඒ පරිවාරිකා ස්ත්‍රිය ඔහුගේ සල්පිලට ගිය විට, පුතණුවන්ට බලවත් අපහසුවක් ඇතැයි අනිකුත් අයගෙන් අසා දැනගත්තාය. එය ඇසූ පරිවාරිකා ස්ත්‍රිය ඔහු නිදාසිටි තැනට ගොස්, පුත, ඔබට ඇති අපහසුව කවරේදැයි ඇසුවාය. ඔහු මුවෙන් නොබැණම වැතිර සිටියේය. නැවතත් එයට කාරණා විචාළ කල්හි, මෑණියනි මෙය ඔබට කියන්නට නොහිමිවනැයි පැවසිය. මෑණියන් කියන්නැයි ඉල්ලාසිටි විට, මට අනෙක් අපහසුවක් නැත. ඒ මාණවිකාවගේ සුන්දර බව අසා ඇය පිළිබඳ සිත් ඇතිවිමි. ඒ මාණවිකාව ලද්දේ වී නම් මගේ ජීවිතය රැකෙයි. නොලද්දේ නම් මෙතැන්හිම මිය යමියි කීවේය. එවිට ඒ ස්ත්‍රිය ඔබ ඒ මාණවිකාව නිසා මෙසේ නොසිතන්නැයි අස්වසා, බොහෝ සුවඳ ආදිය ගෙන මාණවිකාව සමීපයට ගොස්, මගේ පුත්‍රයා ඔබතුමියගේ ගුණ අසා පිළිබඳ සිත් ඇතිවී ඇතැයි කියා කුමක් කළ යුතුදැයි ඇසුවාය. එවිට ඒ මාණවිකාව, ඉතින් කැඳවාගෙන ඒමට හැකිනම් මගෙන් බාධාවක් නැතැයි කීවාය. එසේ ඇසූ පරිවාරිකා ස්ත්‍රිය, බමුණු ගෙයි සියලු තැන්හි ඇති කසළ එක් කොට, මල් ගෙනෙන පෙට්ටියෙහි ලාගෙන ගොස්, පරීක්ෂා කරන වේලාවෙහි රැකවල්හි යෙදෙන ස්ත්‍රියගේ හිසට දමන්නීය. එවිට රැකවල් ස්ත්‍රිය පිළිකුල්ව ඉවත් වන්නීය. ඒ පරිවාරිකාව එතැන් පටන් තමන්ට යමක් කියන අනෙක් ස්ත්‍රීන්ගේ ද හිසට කසළ දමන්නට පටන් ගත්තාය. එම හේතුවෙන් ඇය ගෙනෙන දේ පරීක්ෂා කරන්නට රැකවල් ස්ත්‍රීහු උත්සාහ නොකළහ.

එවිට එම පරිවාරිකාව තමා ගෙනෙන පැස ඇතුළට මල් වෙළඳසලේ දූතයා දාගෙන මාණවිකාවගේ සමීපයට ගෙන ගියාය.

එසේ එහි ගිය දූතයා මානවිකාවගේ සීලය බිඳ, එක් දවසක් ප්‍රාසාදයෙහිම විසුවේය. පුරෝහිත බ්‍රාහ්මණයා බැහැර ගිය කල්හි දෙදෙනාම අභිරමණය කරති. පුරෝහිත බමුණා ආ ගෙට ආ කල දූතයා සැඟවෙන්නේය. ඒ මානවිකාව දෙවසක් ගතවූ කැන ඔබ දැන් යන්නැයි ඒ දූත පුරුෂයාට පැවසුවාය. එවිට පුරුෂයා මම බමුණානන්ට පහරක් ගසා යෑමට කැමැත්තෙමියි කීවේය. එවිට දූතයා සඟවා බමුණා ආ කල, ස්වාමීනි මම ඔබවහන්සේ වීණා වාදනය කරද්දී නටනු කැමැත්තෙමැයි පවසා, බමුණා වීණා වාදනය කරන්නට පටන් ගත් විට, ඔබ බලා සිටිද්දී නටන්නට ලැජ්ජා ඇත්තෙමැයි කීවාය. එසේ කියා රෙදිකඩකින් ඔබගේ ඇස්වසා නටමියි කීවාය. එවිට බමුණා ඔබට ලැජ්ජා ඇත්නම් එසේ කරන්නැයි කියා, ඇස් වසා මුහුණ බැඳගෙන වීණා වාදනා කරන්නට පටන් ගත්තේය. ඒ මානවිකාව මඳ වේලාවක් නටා ස්වාමීනි, මම ඔබවහන්සේගේ හිසට එක් විටක් ඇණෙයියන්නට කැමැත්තෙමියි කීවාය. ඒ ස්ත්‍රිය කෙරෙහි ලොල්වූ බමුණා පහරදෙන්නැයි කීය. එකෙණෙහි මානවිකාව දූතයාට ඉඟි කළාය. දූතයා සෙමෙන් අවුත් හිස වැලමිටින් ඇන්නේය. එම පහර කැවීට බමුණාගේ ඇස් පිට පලායන්නාක් මෙන් විය. හිසෙහි ගැටයක් පැන නැගුණේය. ඒ වේදනාවෙන් පීඩිතව හිගේ අත මෙහි ගෙනවැයි කීය. මානවිකාව ඇගේ අත බමුණා මත තැබීය. බමුණා, හිගේ අත මොලොක්ය. එහෙත් පහර බලවත්ය. මානවිකාව අර දූතයා සඟවා තෙල් ගෙනවුත් බමුණාගේ හිසේ ගා සංවාහනය කළාය. බමුණා පිටව ගිය කල්හි ඒ දූතයා පැසක ලා බැහැරට පිටත් කළාය. ඉක්බිති ඒ දූතයා රජු සමීපයට ගොස් සිදුවූ සියලු පවත් දැන්වීය.



රජතුමා තමන්ට සේවයට පැමිණියා වූ පුරෝහිත බ්‍රාහ්මණයා දැක, බමුණානෙනි, දූ කෙළිමුදැයි ඇසීය. ඔහු ද යහපතැයි කී විට, රජු දූ ගලාව සරඹා, පෙර පරිදිම ගීතිකාව කියා, පසඇට දැමීය. බමුණා මානවිකාවගේ තපස බිඳී ගිය බව නොදැන, මගේ මානවිකාව හැර ගායනා කළ මැනවැයි කීවේය. මෙසේ කී නමුත් බමුණා යළි පරදින්නට පටන් ගත්තේය. එවිට රජතුමා දූතයාගෙන් තමා මානවිකාවගේ පවත් අසා දත් හෙයින් බමුණා අමතා, "තාගේ මානවිකාවගේ තපස් බිඳී ගියේය. ඔබ ගර්භයේ පටන් ඇය ගෙන රැකවල් ලා ආරක්ෂා කරගත හැකියයි සිතුවේය. ස්ත්‍රී නම් බඩ ඇතුළේ ලාගෙන ඇවිද්දත්, රක්නට නොපිළිවන. මේ ලෝකයේ එක පුරුෂයෙකුම පතා පතිව්‍රතා ධර්මය රක්ෂා කරන්නා වූ ස්ත්‍රියක් නැත. ඔබේ මානවිකාව නටනු කැමැත්තෙමි යැයි කියා වීණා ගායනා කරන්නාවූ ඔබේ මුහුණ වස්ත්‍රයකින් වසා බැඳ තමාගේ සොර පුරුෂයා ලවා ඔබේ හිසට වැලමිටින් ඇන්නවූවාය. දැන් ඔබ දූ කෙළිමින් කිඳ මාගේ ස්ත්‍රිය තමා ගීතිකාව ගායනා කළ මැනවැයි කුමක් පිණිස මට කියන්නේදැයි" විමසා, එදා රජව සිටි මහබෝසතාණෝ බමුණාට අර්ථයෙන් ධර්මයෙන් දේශනා කළහ.

එවිට බමුණා බෝසතුන්ගේ ධර්ම දේශනාව අසා, ගෙට ගොස් මානවිකාවට කථා කොට, තී විසින් මෙබඳු පාපකර්මයක් කරන ලද්දීයැයි පැවසීය. එවිට ඇය ස්වාමීනි, එසේ කීවේ කවුරුනු ද? මම කිසිදු වරදක් නොකෙළෙමි. ඔබතුමන්ට මා අතින්ම ඇන්නෙමි. ඔබවහන්සේගේ හිසට අනෙක් කෙනෙක් ඇන්නේ නැත. මා කියන දෙය නොපිළිගන්නේ නම් නුඹවහන්සේ හැර අන් කෙනෙකුන් අත නොඇල්ලීමැයි සත්‍යක්‍රියා කොට ඔබවහන්සේට ඒ බව ඔප්පුකර සිටිමැයි කීවාය. බමුණා එබස් අසා, ගිනි දල්වා, ඒ ස්ත්‍රිය කැඳවා, ඉතින් තමා අදහනු කැමැත්තේ වී නම් මේ ගින්නට පනින්නැයි කීවේය. මේ අතර මානවිකාව තමාගේ පරිවාර ස්ත්‍රියට උගන්වා, මැණියෙනි, මමගේ ප්‍රතිඥාවන්ට ගොස් මා ගිනිවදනා වේලෙහි පැමිණ අත අල්වා ගන්නට කියන්නැයි කියා යැවූවාය.

ඒ පරිවාර ස්ත්‍රිය දූතයාට එපරිද්දෙන්ම දැන්වූ අතර, දූතයා ද අවුත්, ඒ පිරිස මධ්‍යයේ සිටියේය. ඒ මානවිකාව, බමුණා රවටනු කැමතිව මහජනයා මැද සිට බමුණානෙනි, තොප හැර අන් කෙනෙකුගේ අත් නොඇල්ලුවෙමියි කියා, මේ සත්‍යක්‍රියාවෙන් මේ ගිනි මා නොදවයි කියා ගිනි වදින්නට ගත්තාය. එවිට දූතයා පින්වත්නි, මේ පුරෝහිත බමුණාගේ කටයුතු දැන් බලන්න. මෙබඳු ස්ත්‍රියක් ගිනිවැදී මරණයට පත්කරන්නේ යැයි කියා මානවිකාවගේ අත අල්වා ගත්තේය. ඕ තොමෝ දූතයාගේ අත අරවා පුරෝහිතයාට ස්වාමීනි මොහු මගේ සත්‍යක්‍රියාව බිඳවූයේය. එබැවින් මට ගිනිවදින්නට නොපිළිවනැයි කීවාය. එය කවරේදැයි ඇසූ විට, අද මාගේ අත පුරුෂයෙකු ඇල්ලීය. මෙසේ සත්‍යක්‍රියාව ගැන දැනගත් මේ පුරුෂයා මාගේ අත අල්වා ගත්තේය. එසේ හෙයින් මා ගිනි වදින්ට නොපිළිවනැයි කීවාය. එබස් ඇසූ බමුණා මැ විසින් මා රවටන ලද්දේයැයි දැන නිවසින් නෙරපා දැමීය.

එසේ හෙයින් මේ ලෝකයේ ස්ත්‍රීහු නම් මෙසේ අධර්මයෙන් සමන්විත වූවෝ වෙති. කොපමණ වූ පාපයක් කොටත්, තමන්ගේ පුරුෂයන්ට වංචා කරනු කැමතිව මම මෙබන්දක් නොකෙළෙමියි කියා දවස මුළුල්ලෙහි දිවුරා සපථ කරයි නම්, නොයෙක් වංචා ප්‍රයෝගයෙන්ම දිවුරු ජයගන්නාහුය. මෙසේ අතීත කථාව ගෙනහැර දැක්වූ බුදුරජාණන් වහන්සේ, ස්ත්‍රීහු රැකලිය නොහැකි වෙතැයි දක්වා වදාරා, අවසානයෙහි චතුරාර්ය සත්‍යය දේශනා කොට වදාළ සේක. එම ධර්ම දේශනාවේ කෙළවර උකටලී වූ භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටි සේක. මෙසේ පූර්වාපර සන්ධි ගළපා සර්වඥයන් වහන්සේ අණ්ඩභූත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි බරණැස් රජු නම් තිලෝගුරු සම්මා සම්බුද්ධ වූ මම ම යැයි දක්වා වදාළ සේක.

මෙසේ අණ්ඩභූත ජාතකයෙහි සඳහන් වන මානවිකාව ඇතුළු බොහෝ ස්ත්‍රීහු පතිව්‍රතාධර්ම සීලය රැකගැනීමට සමත් නොවන බව පැහැදිලි වන්නේ වී නමුදු, සියලු ස්ත්‍රීන් එසේ නොවූ බව දහමින් හෙළිවන බොහෝ උතුම් ස්ත්‍රී චරිතයන්ගෙන් පසක් කර ගත හැකි වන්නේය. එබැවින් උතුම් ස්ත්‍රී චරිතම අනුගමනය කිරීමට උත්සුක විය යුතුය.

**කේ. මීගහකුඹුර**

"මිරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස වන දරුවෝත් නැත, මවුපියෝත් නැත, සහෝදරයෝත් නැත, සඳෑ ආදී කිසිවකුට මිහු මේරාගත නොහැක."



# බෞද්ධ විහාර දේවාලවලට ආරක්ෂාව සැලසිය හැක්කේ ආඥා පනත් මගින් පමණක්ද?

මුළු මිනිස් වර්ගයාම බුද්ධියෙන් අභිබවන් කළ විවිධ දාර්ශනිකයෝ විවිධ විචාරකයෝ කලින් කල ලොව පහළ වූහ. ඒ හැම දාර්ශනිකයෙකුටම , විචාරකයෙකුටම වඩා බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ බුදු දහම ඉදිරියෙන් සිටියි.

බුදුරජාණන් වහන්සේ වසර විස්සක් පමණ ගත වන තුරු කිසිදු ප්‍රඥප්තියක් (නීතියක්) පැනවූ බවට සාධකයක් විනය පිටකයෙන් අපට නොපෙනේ. එහෙත් විසි වසරක් පමණ ගත වීමත් සමගම විවිධ අදහස් දරූ පුද්ගලයන් සසුනට ඇතුළත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් විනය නීති පැනවීමේ අවශ්‍යතාවය පැන නැගුණි. "සංඝ ඵාසුතාය, සංඝ සුට්ඨුතාය" ආදී වශයෙන් සඳහන් වන කරුණු දසයක් මුල් කරගෙන විනය නීති පැනවීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති අයුරු ඉතිහාසය පිරික්සීමේ දී පැහැදිලි වෙයි.

විනය නීති පැනවූයේ නමුදු එම විනය නීතිවලට පටහැනිව කටයුතු කිරීම නිසා අනු ප්‍රඥප්ති වශයෙන් විනය නීතිවලට එකතු කිරීම්, සංශෝධනය කිරීම් වරින් වර සිදු කෙරුණි. බුදු රජුන් පිරිනිවන් පා නොබෝ කලෙකින් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනා අවස්ථාවේදී බුද්දක ඛුද්දක (ඛුද්‍රා - අනුඛුද්‍රා) ශික්ෂා පද පිළිබඳ මත ගැටුමක් ඇතිවූ බැව් නොරහසකි.

බුදු සසුනට පමණක් නොව සෑම ආයතනයකටම විනයක් තිබීම අවශ්‍ය බවත්, එසේ නොමැති වූ විට පිරිහීමක් ඇතිවන අයුරු අපට මනාව පැහැදිලි වෙයි. "විනයෝ නාම සාසනස්ස ආයු" (සසුනේ ආයුෂ විනයයි) මෙම නිර්වචනය අදට පමණක් නොව හෙටටත් ගැළපෙන ප්‍රකාශනයකි.

නීති පැනවීමෙන් පමණක් එය නීති රාමුව මත ක්‍රියා කරනු ඇතැයි සිතිය නොහැකියි.

මිනිසුන්ගේ සිතුම් පැතුම් ගති පැවතුම් ඉතා වේගයෙන් වෙනස් වන අයුරු අපට පෙනී යයි.

විශ්වය තරණය කිරීමට පවා අද මිනිසා සමත් වී ඇත. අත්‍යාශ්චර්යකර ආශාවන් පොදි බැඳ ගැනීම නිසා රටවල්, ජාතීන්, දේශ සීමා අතර නිතර නිතර ගැටුම් පවතී. යුද බිය දනෙයි, මානව දයාව සිත් තුළින් පිලිහී ගොස්ය. මානව අයිතිවාසිකම් වෙනුවෙන් විශේෂිත ක්‍රියා මාර්ගයන්ට අවතීර්ණ වී ඇති හෙයින් මිනිස් ජීවිත දහස් ගණනින් අහිමි වෙමින් පවතී.

බුදු දහම ආරක්ෂා කරගැනීමේ වගකීම භික්ෂු , භික්ෂුණී , උපාසක සහ උපාසිකා යන සිව්වනක් පිරිසගේම වගකීමකි. වර්ෂ 1905 දී බෞද්ධ දේවාලගම් පනතේ විවිධ විධානයන්ගෙන් බෞද්ධ විහාරයට හා දේවාලගම්වලට සෑහෙන පමණ ආරක්ෂාවක් නොලැබී තිබෙන හෙයින් තව දුරටත් ආරක්ෂාව ලැබෙන පරිදි ඒ පිළිබඳව පාලන සංවිධානයක් සැලසීමේ අවශ්‍යතාවය වටහා ගත් ශ්‍රීමත් හොම්සන් නැමැති ලංකාණ්ඩුකාර උතුමා විසින් නීති දයක මන්ත්‍රණ සභාවේ අනුශාසනයෙන් හා අනුමැතියෙන් නීතිය ඒකාබද්ධ කිරීම හා සංස්කරණය කිරීම පිණිස 1931 බෞද්ධ විහාර දේවාලය ගම් පනත් පනවා 1931 ජූනි මස 26 වෙනි දින ආණ්ඩුකාරතුමා අත්සන් තැබීමත් සමගම එයට පෙර පැවති 1905 සහ 1991 අංක : 15 දරන (ප්‍රති සංස්කෘත) බෞද්ධ දේවාලය ගම් පනත ද අහෝසි කර ඇත.

ඉතා දිගු කලක් මෙම ආඥා පනත ආයු වින්දනය කළේ නමුදු අපේක්ෂිත අරමුණු මෙමගින් ඉටු වී නොමැති බැව් පෙනේ. 1992 අංක : 03 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ 11 වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කර ඇතත්, එම පනතින්ද කාලීන අවශ්‍යතා සපුරා නොමැති බැව්නම් කිව යුතුය. එහෙත් යථෝක්ත ආඥා පනත්වල යම් යම් අඩුපාඩු තිබුණේ වී නමුදු දිවයිනේ පවතින වෙහෙර විහාර, දේවාල, කෝවිල, ආවාසය හා බෞද්ධ වන්දනීය ස්ථාන තරමකට හෝ මේ දක්වා ආරක්ෂාව සැලසීමට 1931 බෞද්ධ විහාර දේවාලය ගම් පනත ඉවහල් වූ බව නම් අප විසින් අමතක කළ යුතු නොවෙයි. දළදා මාලිගාව, ශ්‍රී පාදස්ථානය සහ අනුරාධපුර අටමස්ථානය පිළිබඳව ද යථෝක්ත ආඥා පනතේ සඳහන් කර ඇති බැව් පෙනේ.

මෙම පනත ප්‍රතිසංශෝධනය කිරීමේදී දැඩි අවධානයක් යොමු කළ යුතු අංග කීපයකි. 1 කොටසේ අංක 01 යටතේ සඳහන් 05 වන වගන්තියද අංක 06 යටතේ දක්වෙන 03 වන වගන්තියද 11 භාගයේ අංක 18 යටතේ සඳහන් වගන්තියද 111 භාගයේ අංක 22 යටතේ වගන්තියද 11 භාගයේ 13 වන ඡේදයේ අංක 02 ද 14 වන ඡේදයේ "ඊ" කොටස ද සංශෝධනය විය යුතු බැව් සඳහන් කරනු කැමැත්තෙමි.

සියලුම භාරකරුවෝ ද පාලක විහාරාධිපති භික්ෂූහු ද බෞද්ධ කොමසාරිස්වරයාගේ පරිපාලනයට යටත්ය. (01) 5 මහුර පරිපාලන කටයුතුවලදී උපදේශක සභාවක් විසින් ආධාර කරනු ලැබේ. එකී සභාවේ ප්‍රධාන තැන බෞද්ධ කොමසාරිස්තුමාට හිමිවේ. (06) 3

11 භාරයේ අංක 18 යටතේ සඳහන් කර ඇත්තේ නවූ වියදම්වලට පුද්ගලික වශයෙන් කොමසාරිස්තුමා යටත් නොවන බැව් දක්වෙන වගන්තියකි. 111 භාගයේ අංක 22 යටතේ අලංකාරක් අයකර ගැනීමේ දී බෞද්ධ කොමසාරිස්තුමා පාලක විහාරාධිපතිට බලය පවරා අධිකරණ ක්‍රියාවලියේ දී නිදහස් කෙරෙන වගන්තියක් ඇතුළත් කර ඇත. 11 භාගයේ 13 ඡේදයේ වැරදිකරුවෙකුට දෙන දඬ මුදල් ප්‍රමාණවත් නොවන හෙයින් අදට ගැළපෙන අයුරින් වෙනස් කළ යුතුය.

අතීත , වර්තමාන හා අනාගත යන කාලත්‍රයටම අයත් සහ සජුරත් නියෝජනය කරන මෙම පනත සාකච්ඡා කිරීම සඳහා අත්දැකීම් ලත් බෞද්ධ කටයුතු කොමසාරිස්තුමා ඇතුළු එම ආඥා පනතේ 02 පිටුවේ සිට 17 වෙනි පිටුව දක්වා ඇති සියලුම නිලධාරීන් නියෝජනය කරමින් විහාර දේවාලගම් ආඥා පනත සංශෝධනය විය යුතු බැව් අපගේ හැඟීමයි.

**ශාස්ත්‍රපති කුඹුක්ගොල්ලේ පියදස්සි හිමි**

"අනුන්ගේ දොස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙයි. ඔහු රාගාදී ක්ලේශයෙන් පෙළෙයි."

# මියගිය ඥාතීන්ට පින් දී ඔවුන් ප්‍රේත ආත්මයක සිටී නම් ගලවා ගනිමු!

මෙලොව උපන් සෑම සත්වයෙකුටම අනිවාර්යයෙන් නාත්තෙක් ඇත. ඒ සෑම කෙනෙකුටම මියගිය ඥාතියෙක් ඇත්තේය. එසේ නොවන පුද්ගලයෙක් නැත්තේමය.
අප පිනක් දහමක් කරන සෑම අවස්ථාවකම අවසානයේදීම ඒ මියගිය ඥාතීන්ට පින් දෙන්නේය. ඒ මියගිය ඥාතීන් දුගතියක ඉපදී ඇත්නම් එම පින් ලබාගෙන ඉනික් මිදී සුගතියක ඉපදෙන බව බුදු දහම අනුව අප විශ්වාස කරන නිසාය. මියගිය ඥාතීන් සියල්ලම එම පින් අනුමෝදන් කරන්නේද? සියල්ලටම අනුමෝදන් කළ හැක්කේද? ප්‍රතික්ෂේප කරන්නේද? නැතහොත් පින්දීම වළක්වාලන්නේද? යන්න අද අපි විමසා බලමු.

පින් අනුමෝදන් වීම යනු වෙනත් පුද්ගලයෙකු විසින් කරන ලද පින් හෝ කුසල් තමා වෙත පුදනු ලබන විට එම පින් හෝ කුසල් පිළිගැනීමයි. දස කුසල් අතර සත්වැන්නවූ මෙය පත්තානුමෝදනා ලෙස හැඳින්වේ. මියගිය පුද්ගලයෙකුට තම අනුත් භවයේ සිට මෙම කුසල් ලබා ගත හැකිද? එයින් තම පාපකර්මයන්ගෙන් මිදී සුගතිගාමී විය හැකිද? මේවාට පිළිතුරු අප සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ විසින්ම තිරෝකුඩ්ඩ නම් සූත්‍රයෙන් දේශනා කර ඇත.

අප ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව්තුරා බුද්ධත්වයට පැමිණ ටික කලකින් පිහිට කල තම මිත්‍රයෙකු වූ බිම්බිසාර රජතුමාට වූ පොරොන්දුව ඉටුකරනුවස් භික්ෂූන් වහන්සේලා පිරිවරාගෙන රජගහනුවර පිහිටි රජ මාළිගාවට වැඩිසේක. බිම්බිසාර මහ රජතුමා මහත් හරසරින් උන්වහන්සේ සමග පිරිවර භික්ෂූන් වහන්සේලා පිළිගෙන මාලිගාවට කැඳවා මහ දනක් පිළිගැන්වීය. එදින රාත්‍රියේ රජතුමාට මහත් බියකරු සිහිනයක් පෙනුණේය. එනම් ප්‍රේතයින් රාශියක් පැමිණ රජ මාලිගය වටකොට බියකරු ශබ්ද නගා කළ කෝලාහල කිරීමය. මහත් සන්ත්‍රාසයට හා බියට පත් රජතුමා පසුදින උදෑසනම බුදුරජාණන් වහන්සේ හමුවී ඒ බව සැලකර හේතු විමසීය. බුදුන් වහන්සේ රජතුමාට බියවීමට කාරණයක් නොමැති බව පවසා ඒ රජතුමාගේ පෙරකළ ඥාතීන් බවත් පෙරකළ පාපකර්මවල එක විපාකයක් අපායක වී නිරයේ දුක් විඳිනා බවත්, පෙරදින දානය දී ඔවුනට පින් නොදුන් බැවින් එසේ කලබල කළ බවත්, නැවත බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට දානයක් දී පින් අනුමෝදනා කරන ලෙසත් වදාළ සේක. ඒ අනුව රජතුමා පසුදින බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට දානය පිරිනමා මියගිය ඥාතීනට පින් වඩා පින් අනුමෝදන් කෙළේය. මෙම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය "තිරෝකුඩ්ඩ සූත්‍රය" ලෙස හැඳින්වේ. ඛුද්දක නිකායේ ඛුද්දක පාඨයේ අඩංගු ගාථා 13 කින් සමන්විත මෙම සූත්‍රයෙහි ප්‍රේතයින්ගේ ස්වභාවය හා ඔවුනට පින්දෙන ආකාරය ගැන විස්තරයක් දක්වේ. එය සැකෙවින් මෙසේය.

ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වීමට මහා කල්ප ගණනාවකට පෙර දඹදිව කාසිපුර නම් නගරයක් වූ අතර එහි ජයසේන නම් රජෙක් රාජ්‍ය කෙළේය. ඔහුට සිරිමා නම් දේවියක් සිටි අතර ඒ දේවියගේ කුස වූ ඵුස්ස නම් බෝසතාණෝ ඉපිද බුද්ධත්වයට පත්විය. ජයසේන රජතුමා ඵුස්ස බුදුරජාණෝ තමාගේම පුත්‍රයා බැවින් වෙන කිසිවෙකුට බුදුරජාණන්ට දන මහාදී උපස්ථාන කිරීමට අවසර නොදී තමාම සිටි පසයෙන් ඇප උපස්ථාන කළේය. මෙසේ කලක් යද්දී බුදුරජාණන් වහන්සේගේ දෙවැනි මෑණියන්ගේ පුතුන් තිදෙනාට බුදුරජාණන් වහන්සේට ඇප උපස්ථාන කිරීමට ආශාවක් ඇතිවී ඒ සඳහා උපක්‍රමයක් සකස් කරන්නේ වෙනත් ප්‍රාන්තයක කලබැගෑනියක් ඇති කළේය. රජතුමා මෙම කලබලය මැඩ පවත්වා සාමය සුරක්ෂිත කිරීමට එම කුමරවරු තිදෙනා යැවීය. ඔවුන් එහි ගොස් එය මැඩ පවත්වා ආපසු පැමිණි විට ඉමහත් සන්තෝෂයට පත්වී කැමති වරයක් ඉල්ලන සේ දන්වීය. එනම් තම උපක්‍රමය ක්‍රියාත්මක කළ කුමරවරු තමන්ට බුදුරජාණන් වහන්සේට ඇප උපස්ථාන කිරීමට අවස්ථාව ලබාදෙන ලෙසට ඉල්ලා සිටියෝය. එය සිතසේත්ම ඉටු කළ නොහැකි බව දන්වූ රජතුමා වෙනත් වරයක් ඉල්ලන ලෙසට දන්වීය. තමන්ට වෙනත් වරයක් අනවශ්‍ය බව කුමාරවරු තරයේම කියා සිටියෝය. මහා පෙරත්තයකින් පසු මාස 3 ක කාලයක් සඳහා පමණක් බුදුරජාණන් වහන්සේට ඇප උපස්ථාන කිරීමට කුමාරවරු තිදෙනාට අවසර දුන්නේය.

බුදුරජාණන් වහන්සේ හමුවට ගිය කුමාරවරු තිදෙනා තමන් ජයග්‍රහණය ලැබූ ප්‍රාන්තයේම වස් තුන් මස ගත කිරීමට ආරාධනය කළෝය. බුදුරජාණන් වහන්සේ එම ආරාධනාව පිළිගත් පසු කුමාරවරු සිය ඇති හිත මිත්‍රාදීන් දහසක් සමගින් දෙනා සමග මහත් උත්සවශ්‍රීයෙන් බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය වැඩමවා ගෙන ගොස් වෙහෙර විහාර කරවාදී ඇප උපස්ථාන කරන්නට පටන් ගත්තේය. මහා ශ්‍රද්ධාවෙන් දන මහාදිය පූජා කළ මෙම පිරිස අතර සිටි ශ්‍රද්ධා සම්පන්න නොවූ රජතුමාගේ ඥාතීන් පිරිසක් බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලාට පූජා කළ දානය තම තමන් අනුභව කර දන ශාලාවටද ගිනි තැබූහ. මෙම පිරිස මරණයෙන් පසු නරකාදියෙහි උපන්නාහුය. මෙම ප්‍රේත පිරිස කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේදී නරකාදියෙහි මිදී ප්‍රේත ආත්මයෙහි උපන්නාහ. එකල්හි මොවුන්ගේ ඇති මනුෂ්‍යයෝ මියගිය ඥාතීන්ට පින් දෙද්දී එම ප්‍රේතයින්ට මෙම පින් නොලැබුණාහ. එවිට ඔවුන් කාශ්‍යප බුදුරජාණන් හමුවට පැමිණ තමනට පින් නොලැබෙන බව කීහ. එවිට බුදුරජාණන් වහන්සේ "තොප කළ අකුසල් ඉතා බලවත් බවත්, ඒ පින් තොපට නොලැබෙන බවත් මතු බුදුවන ගෞතම බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී තොපට පින් ලැබෙන බවත් පැවසූ සේක.

ඉන්පසු බුද්ධාන්තරයකට පසු අප ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී බිම්බිසාර රජතුමා දක්වා පිණිස රජගහ නුවර රජ මාලිගයට පැමිණ දින සිදුවූ සිදුවීම ලිපියේ මුලදීම සඳහන් කරන ලදී. බිම්බිසාර රජතුමා සිහිනෙන් දුටුවේ අතීතයේ සංඝිත දේ පරිහරණය කළ මෙම ප්‍රේතයින් කැලය.

තිරෝකුඩ්ඩ සූත්‍ර දේශනාවට අනුව ප්‍රේත නිකායේ උපත ලබන ප්‍රේතයින් ජීවත් වන ස්ථානයක් නැති පිරිසක් අතර තමන් විසූ ගෙයක් සිය ඥාතිවරුන්ගේ ගෙවල්වල පතරමින් පවුර්වලද, වාසය කරති. තමන් කරන ලද පාපකර්ම අනුව කෑමට යමක් නොමැතිව අනන්ත අප්‍රමාණ දුක් විඳින මෙම ප්‍රේතයිනට ප්‍රමාණවත් අහරක් කිසිවිටෙක නොලැබේ. මොවුන්ට නියම පිනක් කරගැනීමේ හැකියාවක් නැත. මෙම ප්‍රේතයින් වර්ග 4 කට බෙදා ඇත. ඒ ගින්නෙන් දවනු ලබන බිල සහිත ගසක් මෙන් ශරීරය ඇතුළත තණ්හාව ගින්නෙන් ඇවිළෙන නිජ්ඣාමතණ්හික ප්‍රේතයෝද, බොහෝ කාලයක් කෑම බීම නැතිව සාගිනයා දෙකින් පීඩිතව සිටින ඛුප්පිපාසික ප්‍රේතයෝද, වමනය, සෙම්සොටු සැරව ගැබ්මල ආදී ආහාරයට ගන්නා පංසු පිසාචික ප්‍රේතයෝද, ඥාතීන් දෙනු ලබන පිනින් ජීවත් වන පරදත්තූපජීවී ප්‍රේතයින් ද යනුවෙනි. කාලකඤ්ජික, අට්ඨිසංකලික හා මාංසපේසික වශයෙන් හඳුන්වන තවත් ප්‍රේත කොට්ඨාසයන් ඇති බවද සමහර බෞද්ධ පොත්පත්වල සඳහන් වේ.



මෙම ප්‍රේතයින්ගෙන් සිය ඥාතීන් විසින් දෙනු ලබන පින් අනුමෝදන් කළ හැක්කේ පරදත්තූපජීවී ප්‍රේතයින්ට පමණි. බිම්බිසාර රජතුමාගේ මාලිගයේ සිට ඝෝෂා කළේ ඔහුගේ ඥාතීන් වූ මෙම පරදත්තූපජීවී වර්ගයට අයත් වුවන්ය.

**වෛද්‍ය ප්‍රියන්ත හේවගේ**
විශ්‍රාමලත් නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇලුණේද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැමදෑම සුවසේ පිබිදුණෝ වෙති."

# සදහම් ප්‍රහේලිකා අංක - 80

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ත්‍යාගයක් පිරිනමනු ලැබේ... දුරකථනය - 011-2695773

**උපදෙස් :**

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 78, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු පත් ඔක්තෝබර් මස 20 ට පෙර එවිය යුතුය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | 2 | | ■ | 3 පු | | 4 |
| ■ | ■ | | ■ | 5 | | ■ | |
| 6 | | ■ | 7 | ■ | | ■ | |
| | ■ | 8 කෙ | | ■ | 9 | | |
| 10 | | ■ | 11 | | ■ | ■ | ■ |
| ශී | ■ | 12 | | ■ | 13 | නු | 14 |
| | ■ | | ■ | 15 | | ■ | |

## ▶ හරහට

1. සිදුහත් කුමරු ලොව ඉපදෙන විට උපත ලද අයෙකි.
3. නොකිළිටි විහරණ ඇත්තවුන් අතර අග තනතුර ලද තෙරණුවෝ.
5. මෙය නිපුණතාම අලි ඇතුන් මෙල්ල කරගන්නට අභිරුය.
6. මේ මුනිවරුන්ගෙන් කෙනෙකි.
8. පැරණි උඩවිය රෝග නිවාරණය කිරීම සඳහා මේවාද භාවිත කරති.
9. දිය මත පිපෙයි.
10. සමහරු මේවා අන්තරගත්ට කන් අදිති.
11. මේ නාමින්ද ජාතකයක් තිබේ.
12. ඇතාගේ වටිනාම දෙය.
13. ලංකාවේ පැවිදි භාවයට පත් මුල්ම කාන්තාව.
15. පළිගැනීමට අධිපති දේවතාවියක් ලෙස සැලකේ.

## ▼ පහළට

2. නිකෙලෙස් සිතින් දිය යුතුය.
4. බුදුන් වහන්සේට මේ නාමින්ද ආමන්ත්‍රණය කරති.
3. අනාථපිණ්ඩික සිටුතුමාගේ නාමය මෙය වේ.
6. ප්‍රකට ජාතක කතාවකි.
7. මිහිඳු හිමි සමග ලක්දිවට පැමිණි පිරිසෙන් කෙනෙකි.
12. කුස්සියේදී ආහාර පිසගැනීම සඳහා භාවිත කෙරේ.
13. දළද පෙරහරට මොවුන් අභිමානය ගෙන එති.
14. ඇලෙන සුළු ද්‍රව්‍යයකි.

**ප්‍රහේලිකා අංක 79 ජයග්‍රහණය කළ වාසනාවන්තයෝ**

- **සමිලා කුමාරිහාමි, 256, පොල්වත්ත, අම්පිටිය, මහනුවර**
- **ජේ. වී. රූපවතී, 75, තලාතුඔය.**
- **ඩබ්ලිව්. අයි. කුමාරි, 68, කැටපිඩැල්ල පාර, ගොහාගොඩ, කටුගස්තොට.**

## මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න

මෙහි පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා පුද බිමක පැරණි ඡායාරූපයකි. එය කුමක්දැයි නම් කොට පිළිතුර තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න.

ඔබේ පිළිතුර එවිය යුත්තේ, සංස්කාරක, දළද වරුණ, දළද මාලිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.

**(නිවැරදි පිළිතුර එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට ද්විභාෂිය ශ්‍රී දළද පෙරහර සහිත රාමු කරන ලද වටිනා තිළිණයක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අනුර සී. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය මෑණියන් වන චාලට් මෙනරගම මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම පෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)**



පසුගිය කලාපයේ පුදබිම නිවැරදිව හඳුනාගෙන ජයග්‍රහණය ලැබූ වාසනාවන්තයා

**කේ.පී. ලලිතා කුමාරි**
අංක : 15/2, කපුවල, උයන්වත්ත, ගුන්නැපාන.

(ඔබේ ත්‍යාගය ලබා ගැනීම සඳහා හැඳුනුම්පත සමග ශ්‍රී දළද මාලිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාලය වෙත පැමිණෙන්න)

පසුගිය කලාපයේ (සැප්තැම්බර්) ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර

**දඹුළු රජමහා විහාරය**

බොදු පුවත්

# මල්වතු මහාවිහාරයීය කඨින පූජෝත්සව පිංකම - ඔක්තෝබර් 12 වන දින

**මහනුවර** මල්වතු මහාවිහාරයීය කඨින පිංකම, ඔක්තෝබර් දොළොස් වන දින මල්වතු මහාවිහාරයීය මංගල උපෝසථාගාරය, පෝය මළුව, මාසිම් සිල ආරාමය යන ස්ථාන මූල්කර ගෙන, මල්වතු මහාවිහාරයීය ශ්‍රී සංඝරාජ වංශාන සංග්‍රහ සමිතියේ සහ සංඝරාජ සාන්තා සමිතියේ අනුශාසක, මහෝපාධ්‍යාය, අග්ගමහාපණ්ඩිත අලුත්ගම ධම්මානන්ද හාහිමියන්ගේ අනුශාසකත්වයෙන් 71 වෙනි වතාවටත් පැවැත්වේ.

මල්වතු මහාවිහාරයේ වස් එළඹ වැඩ සිටි මහාසංඝරත්නය හතළිස් පස් නමක් විෂයෙහි පිරිත් පිරිදි කඨින චීවර පූජාත්, මහාසංඝරත්නය පනස්නමක් විෂයෙහි සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමට නියමිතය. මෙම කඨින චීවර මෙවර පූජා කරනු ලබන්නේ මහනුවර චම්පා ආයතනයේ චම්පා වීරරත්න මහත්මිය (සංඝරාජ සාන්තා සමිතිය) මහනුවර ශ්‍රීමත් අනගාරික ධර්මපාල පදනමේ සංඝරාජ ගුණානුස්මරණ සමිතියේ සභාපති එල්.එච්. හරිස්චන්ද්‍ර මහතා සහ මහාමායා බාලිකා විදුහල මගිනි. මෙදින පාන්දර මල්වතු මහාවිහාර උපෝසථාගාරයට වැඩම්වන කඨින චීවර දානමය පිංකම සංඝරාජ ගුණානුස්මරණ දහම් ශාලා සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.

# අස්ගිරිය මහාවිහාර මහපිරිවෙනේ කඨින පූජෝත්සවය - ඔක්තෝබර් 10,11,12 දිනවල

**මහනුවර** අස්ගිරිය මහාවිහාර මහපිරිවෙනේ කඨින චීවර පූජා මහෝත්සවය ඔක්තෝබර් මස 10, 11, 12 දිනවල දී පරිවේණාධිපති, අස්ගිරිය මහාවිහාරයීය කාරකමහාසංඝසභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ශාස්ත්‍රපති නාරම්පනාවේ ආනන්ද හාහිමියන්ගේ අනුශාසනා පරිදි පරිවේණස්ථ දායක සභාව, සිල සමිතිය හා ශ්‍රී සුමනතිස්ස දහම් පාසලේ මෙහෙයීමෙන් පැවැත්වේ.

ඔක්තෝබර් 10 වෙනිදා සවස 6.30 ට මහාචාර්ය දේවාලේගම මේධානන්ද හිමියන්ගේ ධර්ම දේශනාවකි. 11 වෙනිදා සවස 6.30 ට අග්ගමහාපණ්ඩිත කොටුගොඩ ධම්මාවාස අනුනායක හිමි පවත්වනු ලබන ධර්ම දේශනාවකි. ඔක්තෝබර් 12 වෙනිදා අළුයම 4.30 කඨින වස්ත්‍රය පෙරහැරෙන් වැඩම කිරීම. උදේ 6.00 ට ශතාධික මහාසංඝරත්නය පිණ්ඩපාතයේ වැඩම කිරීම. උදේ 7.00 ට බුද්ධ පූජාව. උදේ 10.00 ට ගමිකන්ට අභයදානය දීමේ වැඩසටහන, 10.45 බුද්ධ පූජාව, 11.00 ට අස්ගිරි මහානායක අනුනායක මාහිමිවරු ප්‍රධාන ශතාධික මහාසංඝරත්නය විෂයෙහි සපිරිකර සංඝගත දක්ෂිණාව පිරිනැමීම, දවල් 12.00 ට කඨින චීවර පූජාව සහ ධර්ම දේශනාව.

මේ අතර අස්ගිරිය මහාවිහාරයේ මංගල උපෝසථාගාරයේ කඨින පිංකම ඔක්තෝබර් මස 31 වන දින අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අතිගරු මහානායක උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිතය.

# අස්ගිරිය ගෙඩිගේ රාජමහා විහාරයේ කඨින පිංකම - ඔක්තෝබර් 20, 21 දිනවල

**මහනුවර** අස්ගිරිය ඓතිහාසික ගෙඩිගේ රාජමහා විහාරයේ (දළදා ගමන් මාළිගාව) කඨින පිංකම් පූජෝත්සවය ඔක්තෝබර් 20, 21 දිනයන්හි, නායිලන්ත මහිපැමිදි සියනට අධික බැතිමතුන්ගේ සහභාගිත්වයෙන් හා අස්ගිරිය මහාවිහාරයීය කාරක මහාසංඝසභාවේ කාරකසභික ගෙඩිගේ රාජමහා විහාරාධිකාරී, පොළොන්නරුව සොළොස්මස්ථානාධිපති ශාස්ත්‍රපති, වේඩරුවේ ශ්‍රී උපාලි, ශ්‍රී දළදා තේවාව භාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. 21 වෙනිදා ආගමික වැඩසටහන් මාලාවකි.

චීවර එක්වන දින දහවල් අස්ගිරි මහානායක අනුනායක හිමිවරු ප්‍රධාන පනස්නමක් විෂයෙහි, කඨින චීවර පූජා සහිත පිරිනමනු ලබන සපිරිකර සංඝගත දක්ෂිණාවක් උපාලි නායක හිමි ප්‍රධාන විහාරස්ථ කාර්ය දායක සභාව, දහම් පාසල, කඳුරට බෞද්ධ සාන්තා සමිතිය කඨින පිංකම් භාරව කටයුතු සිදුකරනු ලබයි. මෙම පුණ්‍යෝත්සව අවස්ථාවට ප්‍රදීප් තිලංග දැළ දියවඩන නිලමේ තුමා ද සහභාගිවේ.

මේ අතර ජේරාදෙණිය හැටනෙ දියකපනාහොට විහාරයේ කඨින පිංකම ඔක්තෝබර් මස 19 වෙනිදාත්, පූජාපිටිය වට්ටෙගොඩ පුරාණ විහාරයේ ඔක්තෝබර් 20 දාත්, ලියන්ග ස්තැන්න පුරාණ විහාරයේ ඔක්තෝබර් 18 දාත්, යටිහලගල පුරාණ විහාරයේ ඔක්තෝබර් 13 වෙනිදාත් කඨින පිංකම් මූල්කොට විවිධ ආගමික වැඩසටහන් මාලාවක් සමඟ පැවැත්වීමට පිළිවෙළක යොදා ඇත.

**කේ. බණ්ඩාරනායක**



# නියඟයෙන් පීඩා විඳින ජනතාවට පානීය ජලය බෙදා දීමේ සත්කාරක වැඩසටහනක්

**පෙරහිනායික** අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ මූලිකත්වයෙන් පිහිටුවාගෙන ඇති ධම්මදීප සභාව මගින් ශ්‍රී දළදා මාළිගාවේ ගරු දියවඩන නිලමේතුමාගේ මෙහෙයවීමෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව සඳහිය පාදී ප්‍රදේශ මුල් කොටගෙන නියඟයෙන් පීඩා විඳින ජනතාවට පානීය ජලය බෙදා දීමේ වැඩසටහනේ සමාරම්භක උත්සවය 2014 අගෝස්තු මස 28 වන දින අනුරාධපුර කැබිතිගොල්ලෑව, තිත්තගොනෑව ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේදී පැවැත්විනි.

මහාවිහාරවංශික සයාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික පූජ්‍ය දෙහිදෙනියේ රතනසාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ කාරක සංඝ සභික පූජ්‍ය මැදගම් ධම්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ කාරක සංඝ සභික පූජ්‍ය කුඹුක්කඳන්වල පුඤ්ඤරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සව අවස්ථාවට ශ්‍රී දළදා මාළිගාවේ ප්‍රදීප් නිලංග දැළ ගරු දියවඩන නිලමේතුමන්ගේ සහභාගිත්වයද සිදුවිය.


එහිදී අදහස් දැක්වූ පූජ්‍ය කුඹුක්කඳන්වල පුඤ්ඤරතන නාහිමි නියඟයෙන් පීඩා විඳින ජනතාව පානීය ජලය බෙදා දීම උතුම් පුණ්‍යකර්මයක් ලෙස විස්තර කොට දැක්වූහ.

ප්‍රදීප් නිලංග දැළ ගරු දියවඩන නිලමේතුමන් අදහස් දක්වමින් මෙම නියං තත්ත්වය අවසන් වන තුරු මෙම ප්‍රදේශය පුරා පානීය ජලය ලබා දීම නොකඩවා සිදු කිරීමට පියවර ගෙන ඇති බවට ප්‍රකාශ කර සිටියේය.

මෙම වැඩසටහන නොකඩවා සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සහයෝගය දක්වන අනුරාධපුර දිසාපතිතුමාට හා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම්තුමාට ධම්මදීප සභාවේ විශේෂ ප්‍රණාමය හිමිවන බව වියාපෘති භාර ජයම්පති වැද්දාගල මහතා පැවසීය.


**ලක්ෂ්මන් මුණසිංහ**






# පංචශීල ප්‍රතිපදාව යනු කුමක්ද?

පංචශීලයේ ඉතිහාසය විමසන විට බුදුන් පහළවීමටත් පෙරද පැවතුණු බව පෙනේ. වෛදික ආගමෙහිද එම හා සමාන පංචශීලයක් පිළිබඳව කියැවේ. ශීලය යන්නෙන් පංචශීලයට වඩා වැඩි යමක් නොදත් හෙයින් සොණදණ්ඩ බමුණාද බුදුරදුන් සීලය පිළිබඳව වැඩි විස්තරයක් කළ බව දීඝනිකාය අට්ඨකථාවේ සඳහන් වේ. එයින් අදහස් වන්නේ බ්‍රාහ්මණ ආගමෙහිද පංචශීලය පිළිබඳ ඉගැන්වීම තිබූ බවයි. එමැවින් පංචශීලය වූ කලී බුදුදහමට පමණක් ආවේණික ශික්ෂා පද්ධතියක් නොව සමස්ත සදාචාරාත්මක ලෝකයටම පොදු ආචාර ධර්ම පද්ධතියක් බව දත යුතුය. තවද සිල් සමාදන් වීම බුදුරදුන් ලොව පහළ වීමටද පෙර පැවතුණු බවට බොහෝ උදාහරණ තිබේ. ඔහු මිනිසා සතු පදවියට පත් වූයේ පංචශීලය ආරක්ෂා



කිරීමෙන් බව බෞද්ධ සාහිත්‍යයෙහි ප්‍රසිද්ධ කරුණකි.

තවද ලෝකයේ පහළ වන අති දුර්ලභ පුද්ගලයෝ දෙදෙනෙකි.

මිනිසාගේ වැසියකුට ... සතුන් නොමැරිය යුතුය. ... කාදත්තාදානා) සොරකමෙහි වරදවා නොහැසිරිය යුතුය. (කාමේසු මිච්ඡා න චරිතබ්බා) බොරු නොකිව යුතුය. (මුසා න භාසිතබ්බා) රහමෙර පානය නොකළ යුතුය. (මජ්ජං න පාතබ්බං) යනුවෙනි. මෙයින් පැහැදිලි වන්නේ චක්‍රවර්ති රාජ්‍යය තුළ පංචශීලය පරිපාලන නීති පද්ධතියක් වන බවයි. මහාසුදස්සන, චක්කවත්ති, (Command) සීහනාද වැනි සූත්‍රවල දක්නට ලැබෙන මෙම සක්විති රජුගේ ප්‍රකාශනවල "යුතුය" යන යෙදුමින් ඒවා අණදෙන නැතහොත් අණ කිරීමක ස්වභාවයක් ලබාදෙන බව පැහැදිලිය. එහෙත් බුදුදහම අනුව ඒවා අණ කිරීම් නොවේ. යහපත් ජීවිතයකට අදාළ වන ආචාර ධර්ම පද්ධතියකි.

පංචශීලය ආරක්ෂා කිරීමෙන් ලෞකික ලෝකෝත්තර සම්පත්

"කෝපයෙන් මත් වූ පැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය"

...වා ගත් සය පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ තොරතුරු සුලබය. පදාන පාලියේ තිසරණ සරණාගමනී - සත්ථේරාපදානය යනුවෙන් තෙරුවන් සරණ යාමෙන් හා පන්සිල් රැකීමෙන් නිවන් මග සෙළි ... තරුණ් ... දෙදෙනකු පිළිබඳ චරිත කථා දෙකක් ... තම ජීවිත ... සුන්ගේ බල මෙහෙකම් කළ දාසයකු ... දී හරි ... ඉතා ලද ... දිවිය කරම් ශක්තියක් නොතිබූ ... විමට ... නොහිඳු ... පන්සිල් සමාදන් විය හැකි නම් මැනැවැයි ... සීලසමාදානය ... වහන්සේ පවසති.

... අනෝමදස්සී බුදුරදුන්ගේ නිසා නම් ශ්‍රාවකයකු ... පන්සිල් සමාදන්ව ජීවා ආරක්ෂා කළ බවත් ... සුගතියේ උපතින් තව්තිසා දෙව්ලොව උපන් බවත් ... පින්න් තිස් වරක ශක්‍ර සම්පත්තියද, පනස් වරක් ... වර්ති රාජ්‍ය සම්පත්තියද, අසංඛ්‍ය ගණනක් රාජ්‍ය සම්පත්ද විඳ ... ගෞතම බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි විශාලාවේ ... ආඪ්‍ය වූ කුලයෙක උපත ලැබ පන්සිල් සමාදන්ව සිල් ... රහත් බවට පත් වූ බවද පවසා ඇත. පන්සිල් ... නිසා කිසිදු ආත්ම භාවයක තමා දුගතිගාමී නොවූ බව පවසන ... වහන්සේ දීර්ඝායුෂ, නිරෝගී බව, රූමත් බව, යසවත් බව, ... ශුග දිවියක් ගෙවන බව, අනෙත් අය විසින් ගරු කරන ... විශ්වාස කරන කෙනකු වන බව, බුද්ධිමත් කෙනකු වන බව ... අනේකවිධ සම්පත්ද ලබා සසර බැඳීවලින්ද තමාට නිදහස් ... හැකිවූ බවත් සහෙයින් පන්සිල් රැකීමට උත්සාහවත් විය යුතු ... අපට කියා දෙති. මෙම සාංසාරික ඵල විපාක ... කෙනෙක් හඳුනා ගන්නා බුද්ධිමත් පුද්ගලයාට පන්සිල් රැකීමෙන් පරිපූර්ණ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය බොහෝ දේ ලැබෙන බව ... වටහා ගැනීම නොඅනුමානය.

තවද බුදු දහමේ පංච සීලය නම් ... ඇත්තේ ගහට්ඨසීල නමිනි. ... අදහස් වන්නේ මෙය ගිහි ... සඳහාම අදාළ වන බවයි. ... පංච සීලය ලෝකයේ සකසත ... හැසිරීම හා කතාබහ පහස ... යුතු ආකාරය පෙන්වා දෙනු ලබන ... නිතිකේ ලෙස සැලකීමද නිවැරැදි ... අතින් මිනිසා ප්‍රජාව තුළ සැබෑ ... පාසාම පැවතිය යුතු ගුණාංග ... ලෙස පංච සීලය බුද්ධනම ... බෞද්ධ සාහිත්‍යවල නිච්චසීල නැතහොත් නිත්‍ය සීල නමින් පංච සීලය හඳුන්වා තිබීමෙන් මෙය ... පැහැදිලි වේ. විශේෂයෙන් උතුම් දරු සම්පත් පතන මව්වරුන් විසින් පන්සිල් රැකීම අවශ්‍යයෙන් කළ යුත්තකි. කුමන හෙයින්ද යත් සිත් ඇති දරුවන් උතුම් මව් කුසකම පිළිසිඳ ගන්නා හෙයිනි. මෙය තවදුරටත් පැහැදිලි වීම සඳහා බෝසතුන් මිනිස් ලොව ඉපදීමට මව් කුසක් පිරිසිදු කළ ...

... වහන්සේගේ මහාමායා දේවිය ... ලද අයුරු මේ ... දක්වා ඇති අයුරු දක්වමු. "බුද්ධ මාතා ... පුරුෂ ලෝල, සුරා ධූර්ත නොවන්නීය. කල්ප ලක්ෂයක් පිරූ පාරමිතා ඇත්තීය. උපන් තැන් පටන් නොකඩවූ පන්සිල් ඇත්තීය. මෙකල මහාමායා තොමෝ එබඳු වූවාය." එසේම සිදුහත් කුමරු මව් කුස පිළිසිඳ ගත් ඇසළ පුන් පොහොද මහාමායා දේවිය අටසිල් සමාදන් වූ බවද බෞද්ධ සාහිත්‍යයෙහි කියැවේ. මෙයින් ... වන්නේ පන්සිල් රැකීම සත්පුරුෂ මිනිසුන් අතර ... කාලයක සිට පැවැති සුචරිත ධර්මයක් බවයි.

ලක්දිවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ... පැවැති අවිමුද ... ආචාර ධර්ම පද්ධතිය ... පදනම්ව දත් බවට ඓතිහාසික ලේඛනවල සාක්ෂි ... මිහිඳු මහ රහතන් වහන්සේද ලාංකික සමාජය පංච සීලයට ගරු කරන ... සුශික්ෂිත පිරිසක් බවට පත්කිරීම මූලික අභිලාෂය කොට ගත් බවට ඓතිහාසික සාධක පිහිටයි. අශෝක අධිරාජයා විසින් පංච සීල ප්‍රතිපත්තිය මුල් කොට ගත් දැහැමි සමාජයක් ගොඩනැගීම සඳහා දරූ උත්සාහය පිළිබඳ මනා අවබෝධයක් ඇතිව සිටි මිහිඳු හිමියන් මෙම වැදගත්කම ලාංකේය පාලකයන්ට මැනවින් අවබෝධ කරවනහට ඇත. සිංහල රාජාවලියේ හමුවන පිරිසිදු රජවරුන්ගේ ජීවන චරිත පිරික්සීමෙන් මේ බව මැනවින් අනාවරණය කරගත හැකිය. සද්ධාතිස්ස, ආමණ්ඩගාමිණී, උපය, සිරිසඟබෝ, බුද්ධදාස වැනි රජවරුන් පමණක් නොව දුටුගැමුණු, පැරකුම්බා වැනි රජවරුන්ද සත්ව හිංසාව මෙන් සේ පිළිකුල් කළා පමණක් නොව සත්ව වර්ගයාගේ සුඛිත මුදිත පැවැත්ම උදෙසා අනුකම්පා සහගත ක්‍රියා කළහ. සොරකම් නොකිරීම හා ... උදෙසා ... දැන. මුසාවාදය පහත් ක්‍රියාවක් සේ සැලකූහ. මත් උවදුර නිසා ඇතිවූ අවුලක් පිළිබඳව පැරණි ඉතිහාසගත සටහන්වල කිසිදු සුවයක් හමු නොවේ.

මේ නිසා අප විසින් තේරුම් ගත යුතු දෙයක් ඇත. එනම් ... සම්පන්න ලෝකයේ පදනම ලෙස දැකිය යුතු ආචාර ධර්ම පද්ධතියක් හැටියටම පංච සීලයයි අන්තර්ගත වේ. ... ලෝක නීතියට වඩා ධර්ම නීතිය බලවත්ය. ලෝක නීතිය ... ආරක්ෂා කරන ආකාරය පිළිබඳව අනුභූතියෙන් කිව යුතු නොවේ. ... පිරිසක් වෙත ... නීතිය ... සත්ත්ව වර්ගයා විෂයෙහි සාධාරණය ඉටු කෙරෙන අයුරු දිනෙන් දින සනාථ වන අයුරු ඔබ දකී.

"ධම්මයෙහි හැසිරෙන්නා ඒකාන්තයෙන්ම ධර්මය විසින් රකිනු ලැබේ" යනුවෙන් බුදුන් වහන්සේ පිහිනම් වදාරණ ලද්දේ එබැවිනි. එබැවින් ඔබ දුර්ලභ මිනිස් ආත්මයක් ලද බුද්ධිමත් මිනිසකු නම් පංච සීලයෙන් ... ශික්ෂාපද පන කෙරෙහි ... අවධානයක් යොමු කළ යුතු වේ. උපන්නම්, ජනවන්නම්, ... යනාදිය මේ ජීවිතයේ පම් ... දෙවල් ... ලෞකික හා ලෝකෝත්තර ජීවිතයේ බොහෝමයක් එයින් සිදු නොවන හෙයිනි. එද මෙද ... පෙන්වා දෙන පන්සිල් සුරැකීමෙන් ... දැහැමි ජීවිතය ... වේවා.



**ආචාර්ය මිකුරුප්පේ ධම්මානන්ද හිමි**